# (ඊ) රාජ්‍ය මූල්‍ය

1969/70 මුදල් වර්ෂයේ (එනම්, 1969 ඔක්තෝබර් සිට 1970 සැප්තැම්බර් දක්වා) රාජ්‍ය මූල්‍ය කටයුතු පිළිබඳ සම්පිණ්ඩනයක් ඊට පෙර මුදල් වර්ෂ නවයෙහි අනුරූප තොරතුරු හා 1969/70 සහ 1970/71 වර්ෂයන් සඳහා වූ මූලික ඇස්තමේන්තු ද සමග පහත II (ඊ) 1 සංඛ්‍යා සටහනෙහි දක්වේ. 1969/70 සහ 1970/71 වර්ෂයන් සඳහාවූ දත්තයන් පිළිබඳ සවිස්තර වර්ගීකරණයක් පහත විස්තරවල සහ සංඛ්‍යා සටහන්වල ඇතුලත්ව ඇත.

සමාලෝචිත මුදල් වර්ෂය වන 1969/70 දී මුළු ආදායම රුපියල් දශලක්ෂ 2,736 ක්වූ අතර, මුළු වියදම රුපියල් දශලක්ෂ 3,886 ක් වූ සම්මත වියදමෙන් සහ ඇතැම් "අත්තිකාරම් ගිණුම්"[1] සම්බන්ධයෙන් වූ රුපියල් දශලක්ෂ 201 ක ගෙවීම්වලින් සමන්විත විය. මෙයින් ඇතිවන රුපියල් දශලක්ෂ 1,150 ක අයවැය හිඟය, වාර්තාගත කෙරෙන දේශීය වෙළඳ පොළෙන් ණය ගැනීම්වල රුපියල් දශලක්ෂ 815 ක ප්‍රමාණයකින්ද, විදේශීය ණය ගැනීම් රුපියල් දශලක්ෂ 339 කින් සහ දේශීය වෙළඳ පොළ නොවන ණය ගැනීම් (ශුද්ධ පරිපාලන ණය ගැනීම්) රුපියල් දශලක්ෂ 22 කින් ද පියවිණ. අයවැය හිඟය පියවූ පසු එම මූලයන්ගෙන් ඉතිරිවූ අතිරික්තය රුපියල් දශලක්ෂ 26 කින් මුදල් ශේෂ (විදේශ ආධාර ප්‍රතිපාර්ශවීය අරමුදලද ඇතුළුව) වැඩිකරලීමට ආධාර විය. රුපියල් දශලක්ෂ 214 ක් වූ "ණය ආපසු ගෙවීම් ආදිය"[2] ගණන්ගත් විට, 1969/70 වර්ෂය සඳහා ශුද්ධ මූල්‍ය හිඟය රුපියල් දශලක්ෂ 936 ක් විය.

1969/70 මුළු වියදම මූලික අයවැය ඇස්තමේන්තුවලට වඩා රුපියල් දශලක්ෂ 93 කින් වැඩිවිය. පුනරාවර්තන සහ ප්‍රාග්ධන වියදම්වල පිළිවෙලින් සිදුවූ රුපියල් දශලක්ෂ 50 සහ රුපියල් දශලක්ෂ 58 අඩුවීම්ද නොතකා මෙම වැඩිවීම සිදුවිය. මෙම වැඩිවීම එම වර්ෂයේදී මූලික ඇස්තමේන්තු වලින් නොසැපයුණ රුපියල් දශලක්ෂ 20 ක්වූ අත්තිකාරම් ගිණුම්වල ප්‍රතිඵලයකි. අනෙක් අතට, මුළු ආදායම මූලික වශයෙන් අපේක්ෂා කළ ප්‍රමාණයට වඩා රුපියල් දශලක්ෂ 98 කින් වැඩිවිය. එහි ප්‍රතිඵලයක් වශයෙන්, මුලදී ඇස්තමේන්තු කළ සංඛ්‍යාවට වඩා අයවැය හිඟය රුපියල් දශලක්ෂ 191 ක වැඩිවීමක් පෙන්විය. මෙම හිඟය පියවීමේදී රුපියල් දශලක්ෂ 358 ක දායක කළ දේශීය වෙළඳ පොළ ණය මුලදී පූර්වකථනය කළාට වඩා වැඩිවූ අතර, අපේක්ෂිත විදේශීය ණය ප්‍රමාණයෙහි රුපියල් දශලක්ෂ 163 ක පහත බැසීමක් වුනි. අයවැය ලේඛනය සකසන කාලයේදී මූලිකව අපේක්ෂා නොකළ රුපියල් දශලක්ෂ 22 ක්වූ පරිපාලන ණය ගැනීම් සහ දේශීය වෙළඳපලේ ණය ගැනීමෙහි තියුණු වැඩිවීම විදේශීය ණයවල පහත බැසීම සමනය කළා පමණක් නොව, අයවැය හිඟය පියවමින් රජයේ මුදල් ශේෂ රුපියල් දශලක්ෂ 26 කින් වැඩිකරලීමට ද ආධාර විය.

1969/70 දී අයවැය කටයුතුවලින් සිදුවූ ශුද්ධ ප්‍රසාරණාත්මක බලපෑම රුපියල් දශලක්ෂ 428 ක්වූ අතර, එය රුපියල් දශලක්ෂ 80 ක්වූ මූලිකව අපේක්ෂිත ප්‍රමාණයට වඩා වැඩිවිය. මුදල් වර්ෂ අවසානයේදී ශුද්ධ රාජ්‍ය ණය ප්‍රමාණය රුපියල් දශලක්ෂ 7,237 ක් විය. එය ඉකුත් මුදල් වර්ෂය අවසානයේ සිට රුපියල් දශලක්ෂ 998 කින් වැඩිවී ඇත.

1970/71 මුදල් වර්ෂයේදී ආදායම හා වියදම පිළිවෙලින් රුපියල් දශලක්ෂ 2,878 ක් සහ රුපියල් දශලක්ෂ 4,058 ක් විය. ඒ අනුව උත්පාදිත අයවැය හිඟය වූ රුපියල් දශලක්ෂ 1,180, රුපියල් දශලක්ෂ 542 ක්වූ දේශීය වෙළඳ පල ණය ගැනීම් සහ රුපියල් දශලක්ෂ 638 ක්වූ විදේශීය වෙළඳ පල ණය ගැනීම් මගින් පියවිය යුතු වේ. අයවැයෙහි ප්‍රසාරණාත්මක බලපෑම රුපියල් දශලක්ෂ 97 ක් යයි ඇස්තමේන්තු කර ඇත.

---

1. 155 වැනි පිටුවේ පා සටහන බලන්න.
2. II (ඊ) 1 සංඛ්‍යා සටහනේ (ඉ) වැනි පා සටහන බලන්න.
3. II (ඊ) 9 වැනි සංඛ්‍යා සටහන බලන්න.

ඊට පෙර මුදල් වර්ෂ දහය තුළ (1962/63 හැර) ආදායමේ සහ වියදමේ තියුණු වැඩිවීම 1969 සහ 1968 වාර්ෂික වාර්තාවල සඳහන් කෙරිණ. පහත II (ඊ) 1 සංඛ්‍යා සටහනෙහි දක්වෙන පරිදි 1969/70 දීද මේ උපනතිය තව දුරටත් පැවතිණ. කෙසේ වුවද, 1960/61 සිට රජයේ ආදායම සියයට 81 කින්ද, රජයේ වියදම සියයට 93 කින්ද වැඩිවිය. එසේ වැඩිවූ වියදම වැඩිවූ ආදායමට සම නොවීමේ ප්‍රතිඵලයක් වශයෙන් ස්ථාවර ලෙස සහ අනුක්‍රමයෙන් වැඩිවන අයවැය හිඟයන් (නැවතත් 1962/63 හැර) මතුව ඇත. අයවැය හිඟයන් පසුගිය වර්ෂ 5 තුළ රුපියල් දශලක්ෂ 870 ක්වූ සාමාන්‍ය මට්ටමක පැවති අතර, ඊට පෙර වර්ෂ 5 තුළ සාමාන්‍ය මට්ටම රුපියල් දශලක්ෂ 496 ක් විය.

පසුගිය වර්ෂ දහයේදී, ආදායම වාර්ෂිකව සියයට 6·1 (සංයුක්ත) ක සාමාන්‍යයකින් වැඩිවූ අතර, වියදම වාර්ෂිකව සියයට 6·8 (සංයුක්ත) කින් (පුනරාවර්තන වියදම සියයට 6·2 සහ ප්‍රාග්ධන වියදම් සියයට 10·2) වැඩිවිය. පසුගිය වර්ෂ පහ තුළ, වාර්ෂික වැඩිවීම පිළිබඳ සාමාන්‍ය අනුපාතිකය ඊටත් වඩා වැඩිය. එම කාලච්ඡේදයේදී, ආදායම සියයට 8·3 කින්ද, වියදම සියයට 9·1 කින්ද වාර්ෂිකව (පුනරාවර්තන වියදම සියයට 7·7 සහ ප්‍රාග්ධන වියදම සියයට 8·9) වැඩිවිය. ඒ අනුව, පසුගිය වර්ෂ දහයේදී රජයේ වියදම් රජයේ ආදායමට වඩා සීඝ්‍ර අනුපාතයකින් වැඩිවී ඇති බව පෙනේ. පුනරාවර්තන වියදම් වැඩිවීමේ අනුපාතිකය ප්‍රාග්ධන වියදම් වැඩිවීමේ අනුපාතිකයට වඩා විශාලවීම සැලකිය යුතු තවත් ලක්ෂණයකි.

අඛණ්ඩව ඉහළ නගිමින් පවත්නා අයවැය හිඟයන් දේශීය හා විදේශීය මූලයන්ගෙන් වැඩිවූ ණය ලබාගැනීම් මගින් පියවා ඇත. අයවැය අවශ්‍යතාවයන් උදෙසා උපයෝජනය කරගත් දළ විදේශීය සම්පත් ප්‍රමාණයේ සැලකිය යුතු නැගීම මෑත කාලයේ දක්නට ලැබෙන කැපී පෙනෙන ලක්ෂණයකි. අයවැය හිඟයන් පියවීම සඳහා උපයෝජනය කරනලද එම සම්පත් ප්‍රමාණය 1960/61 සිට අනුක්‍රමයෙන් ඉහළ නගිමින් පවත්නා අතර, 1968/69 දී එය සියයට 45 ක මට්ටමක් දක්වා ඉහළ නැග ඇත. ඉකුත් වර්ෂය හා සසඳන විට, 1969/70 දී පැවති දළ විදේශීය සම්පත් ප්‍රමාණය රුපියල් දශලක්ෂ 87 කින් අඩුවූවද, වර්ෂයෙහි අයවැය හිඟය පියවීම සඳහා එය තවමත් සියයට 29 ක දායකත්වයක් සපයයි. පසුගිය වර්ෂ පහේදී අයවැය අවශ්‍යතාවයන් සඳහා උපයෝජනය කරගත් දළ විදේශීය සම්පත් ප්‍රමාණය රුපියල් දශලක්ෂ 1,422 ක්වූ අතර, ඊට පෙර, 1960/61 සිට 1964/65 දක්වා පැවති වර්ෂ 5 තුල එය රුපියල් දශලක්ෂ 418 ක් විය. තවද, 1970/71 දී අයවැය හිඟය පියවීමට ආධාර වශයෙන් විදේශීය මූලයන්ගෙන් රුපියල් දශලක්ෂ 638 ක් (භාණ්ඩ ආධාර රුපියල් දශලක්ෂ 525 කින් සහ යෝජනා ක්‍රම ආධාර රුපියල් දශලක්ෂ 113 කින් සමන්විතය.) අපේක්ෂිතය. නොබේරා ඉතිරිව ඇති (ශුද්ධ) රාජ්‍ය ණය තුළ විදේශීය ණය පිළිබඳ සංරචකය 1960/61 දී සියයට 10 සිට 1969/70 දී සියයට 21 දක්වා වැඩිවීමෙන් අයවැය අවශ්‍යතාවයන් සඳහා විදේශීය ණය කෙරෙහි පවත්නා අධික රැදියාව පෙන්වයි.

රජයේ වියදම් ඉහළ නගිමින් පවත්නා සමයක හිඟ මූල්‍ය සම්පාදනයෙහි සාර්ථකත් වයට විදේශ සම්පත් කෙරෙහි ඇති අධික රැදියාව ආධාරකාරීවූ අතර, අපේක්ෂිත විදේශීය ණයවල පහල බැස්ම 1969/70 දී රාජ්‍ය මූල්‍ය කටයුතු පිළිබඳ ප්‍රසාරණාත්මක බලපෑම තියුණු කරලීමට හේතුවූ ප්‍රධාන කරුණුවලින් එකකි. එම වර්ෂයේදී, නොබේරා ඇති ශුද්ධ ණය රුපියල් දශලක්ෂ 998 කින් වැඩිවූ අතර, එය රුපියල් දශලක්ෂ 784 ක්වූ දේශීය ණය හා රුපියල් දශලක්ෂ 114 ක්වූ විදේශීය ණයවලින් සමන්විත විය. සමාලෝචිත වර්ෂයේ අවසානය වනවිට, නොබේරා ඇති රාජ්‍ය ණය (ශුද්ධ) ප්‍රමාණය රුපියල් දශලක්ෂ 7,237 ක්වූ අතර, එය දේශීය ණය රුපියල් දශලක්ෂ 5,686 කින් හා විදේශීය ණය රුපියල් දශලක්ෂ 1,551 කින් සමන්විත විය.

පසුගිය වර්ෂ කිහිපය තුළ රජයේ ආදායම් හා වියදම් පිළිබඳ වර්ගීකරණය පසුගිය වාර්තාවෙහි සටහනක් මගින් පැහැදිලි කරන ලද,[1] රජයේ ගණුදෙනු පිළිබඳ ආර්ථික හා ශ්‍රිතීය වර්ගීකරණයක් මත පදනම් විය. රජයේ ගිණුම්වල ආදායම් හා වියදම් පිළිබඳ දත්තයන්හි ඇතැම් ගැලපිලි කිරීමෙන් පසුව, රජයේ ආදායමේ සහ වියදමේ අඩංගු වර්තන හා ප්‍රාග්ධන සංරචකයන් ව්‍යුත්පන්න කළ හැක. මෙම දත්තයන් සහ රජයේ ගිණුම්වල පළවී ඇති දත්තයන් අතර සැසැඳුමක් පහත II (ඊ) 2 වැනි සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත.

---

1. ''ලංකාණ්ඩුවේ ලැබීම් හා ගෙවීම් පිළිබඳ ආර්ථික හා ශ්‍රිතීය වර්ගීකරණය පිළිබඳ සටහනක්'' බලන්න. 186 වැනි පිටුව.

### රාජ්‍ය මූල්‍ය කටයුතුවල

| ශීර්ෂ | 1960/61 | 1961/62 | 1962/63 | 1963/64 |
|---|---|---|---|---|
| 1· ආදායම .. | 1,514 | 1,621 | 1,593 | 1,759 |
| 2· වියදම | 2,014 | 2,122 | 2,032 | 2,278 |
| 2· 1 පුනරාවර්තන වියදම3 .. | 1,578 | 1,626 | 1,643 | 1,891 |
| 2· 2 ප්‍රාග්ධන වියදම4 .. | 421 | 481 | 403 | 403 |
| 2· 3 අත්තිකාරම් ගිණුම් හා අනෙකුත් .. | 14 | 15 | – 14 | – 16 |
| 3· අයවැය හිඟය .. | 500 | 501 | 439 | 519 |
| 4· ණය ආපසු ගෙවීම5 .. | 37 | 45 | 47 | 57 |
| 5· ශුද්ධ මූල්‍ය හිඟය .. | 463 | 456 | 392 | 462 |
| 6· අයවැය හිඟය .. | | | | |
| 6· 1 දේශීය වෙළඳ පොළ–නොවන ණය ගැනුම් .. | 29 | 105 | – 34 | – 2 |
| 6· 2 දේශීය වෙළඳ පොළේ ණය ගැණුම් . | 441 | 374 | 372 | 368 |
| 6· 3 විදේශීය මුදල් .. | 30 | 63 | 100 | 108 |
| 6· 4 මුදල් ශේෂවල අඩුවීම .. | ... | – 40 | ... | 45 |
| 7· ශුද්ධ මූල්‍ය හිඟය පියවීම .. | | | | |
| 7· 1 දේශීය වෙළඳ පොළ· නොවන ණය ගැණුම .. | 29 | 105 | – 34 | – 2 |
| 7· 2 දේශීය වෙළඳ පොළ–ණය ගැණුම් .. | 409 | 339 | 333 | 323 |
| 7· 3 විදේශීය මුදල් .. | 24 | 53 | 92 | 95 |
| 7· 4 මුදල් ශේෂවල අඩුවීම .. | ... | – 40 | ... | 45 |
| 8· රාජ්‍ය මූල්‍ය කටයුතුවල ප්‍රසාරණාත්මක බලපෑම .. | 234 | 190 | 162 | 163 |
| 9· නොබේරා ඇති රාජ්‍ය ණය (ශුද්ධ) .. | 2,333 | 2,689 | 3,065 | 3,436 |

1· II පරිශිෂ්ඨයෙහි 30 හා 32 වැනි සංඛ්‍යා සටහන්වල පා සටහන්හි දක්වා ඇති හේතු උඩ මෙම සංඛ්‍යාවන් රජයේ ගිණුම්වල පලව ඇති සංඛ්‍යාවන්ගෙන් වෙනස් වනු ඇත.

2· රජයේ දෙපාර්තමේන්තුවල විවිහිස වියදම් විභජනය කිරීමෙන් පසුව.

3· සංසන්දනාත්මක වීම සඳහා, 1968/69 සිට ප්‍රාග්ධන වියදම් ලෙස වර්ග කරන ලද නිදන් අරමුදල් ගෙවීම්, ණය පිළිබඳ සෘජු ආපසු ගෙවීම් සහ ජාත්‍යන්තර මූල්‍ය සංවිධානයන්ට දයක ගෙවීම් පුනරාවර්තන වියදම් වලට මාරු කර ඇත.

## II (ඊ) 1 වැනි සංඛ්‍යා සටහන

**සාරාංශය – 1960/61 සිට 1970/71 දක්වා[1]**

රුපියල් දශලක්ෂ

| 1964/65 | 1965/66 | 1966/67 | 1967/68 | 1968/69 | 1969/70 | | 1970/71[2] මුල් |
|---|---|---|---|---|---|---|---|
| | | | | | මුල්[2] | තාවකාලික | |
| 1,816 | 1,833 | 1,955 | 2,156 | 2,497 | 2,834 | 2,736 | 2,878 |
| 2,337 | 2,515 | 2,677 | 3,007 | 3,445 | 3,793 | 3,886 | 4,058 |
| 1,893 | 1,976 | 2,012 | 2,321 | 2,544 | 2,923 | 2,873 | 3,089 |
| 471 | 528 | 625 | 714 | 852 | 870 | 812 | 969 |
| – 28 | 10 | 42 | – 29 | 49 | — | 201 | — |
| 520 | 682 | 723 | 850 | 947 | 959 | 1,150 | 1,180 |
| 90 | 116 | 117 | 135 | 160 | 236 | 214 | 249 |
| 430 | 566 | 607 | 716 | 788 | 722 | 936 | 932 |
| 50 | 112 | 72 | 10 | 52 | — | 22 | — |
| 334 | 498 | 418 | 630 | 358 | 457 | 815 | 542 |
| 117 | 154 | 256 | 247 | 426 | 502 | 339 | 638 |
| 20 | – 82 | – 22 | – 36 | 111 | — | – 26 | — |
| 50 | 112 | 72 | 10 | 52 | — | 22 | — |
| 261 | 418 | 348 | 552 | 271 | 361 | 720 | 440 |
| 100 | 118 | 209 | 190 | 354 | 362 | 220 | 491 |
| 20 | – 82 | – 22 | – 36 | 111 | — | – 26 | — |
| 35 | 122 | 56 | 267 | 179 | 80 | 428 | 97 |
| 3,772 | 4,268 | 4,782 | 5,689 | 6,239 | ල.නො. | 7,237 | ල.නො. |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

4. ජාතික සංවර්ධන සංචිතයට දරන ලද වියදම් ඇතුළුව.

5. නිදහස් අරමුදල් ගෙවීම්, ණය පිළිබඳ සෘජු ආපසු ගෙවීම් සහ ජාත්‍යන්තර මූල්‍ය සංවිධානයන්ට දායක ගෙවීම් ඇතුළත් ය.

## II (ඊ) 2 වැනි සංඛ්‍යා සටහන

## රජයේ ආදායම සහ වියදම – 1965/66 සිට –1970/71 දක්වා සැසඳුම

රුපියල් දශලක්ෂ

| ශීර්ෂ | 1965/66 | 1966/67 | 1967/68 | 1968/69 | 1969/70 මුල් ඇස්තමේන්තු | 1969/70 තාවකාලික | 1970/71 මුල් ඇස්තමේන්තු |
|---|---|---|---|---|---|---|---|
| 1· ආදායම (ශීර්ෂ 1 සිට 16 දක්වා) .. | 1,833·3 | 1,954·8 | 2,156·4 | 2,497·3 | 2,833·9 | 2,736·4 | 2,878·0 |
| එකතුකිරීම: ආහාර අලෙවියෙන් ලත් ලාභ (අ) .. | 210·0 | 263·6 | 282·4 | 291·6 | 261·7 | 259·1 | 155·3 |
| අඩුකිරීම: සහල් පිහිටාධාර බද්ද (ආ) .. | 0·3 | 0·3 | 1·9 | 3·1 | 2·0 | 3·5 | 3·0 |
| 2· මුළු ආදායම .. | 2,043·0 | 2,218·1 | 2,436·9 | 2,785·8 | 3,093·6 | 2,992·0 | 3,030·3 |
| 3· පුනරාවර්තන වියදම (1, 2, 4, හා 6 වැනි සම්මත)(ඇ) | 1,860·5 | 1,895·3 | 2,186·2 | 2,384·2 | 2,832·8 | 2,658·9 | 2,912·7 |
| අඩු: ශුද්ධ ආහාර පිහිටාධාරය (ඈ) .. | 290·0 | 193·0 | 297·5 | 334·5 | 361·8 | 337·0 | 464·0 |
| එකතු: ආහාර අලෙවියෙන් පාඩු (ඉ) .. | 487·4 | 465·5 | 578·7 | 620·4 | 621·5 | 599·1 | 614·4 |
| අඩු: පුනරාවර්තන සම්මතවල ප්‍රාග්ධන ශීර්ෂ (ඊ) .. | 84·1 | 94·1 | 114·0 | 116·0 | 206·6 | 124·6 | 113·8 |
| එකතු: ප්‍රාග්ධන සම්මතවල වර්තන ශීර්ෂ (උ) .. | 22·8 | 23·2 | 39·1 | 58·2 | 56·8 | 53·5 | 60·0 |
| 4· වර්තන ගෙවුම් .. | 1,996·8 | 2,096·7 | 2,392·4 | 2,612·3 | 2,942·7 | 2,849·8 | 3,009·3 |
| 5· ප්‍රාග්ධන වියදම් (3,5 හා 7 වැනි සම්මත) (ඇ) .. | 528·4 | 624·7 | 714·4 | 852·0 | 930·0 | 812·0 | 1,140·7 |
| එකතු: පුනරාවර්තන සම්මතවල ප්‍රාග්ධන ශීර්ෂ (ඊ) .. | 84·1 | 94·1 | 114·0 | 116·0 | 206·6 | 124·6 | 113·8 |
| අඩු: ප්‍රාග්ධන සම්මතවල වර්තන ශීර්ෂ (උ) .. | 22·8 | 23·2 | 39·1 | 58·2 | 56·8 | 53·5 | 60·0 |
| 6· ප්‍රාග්ධන ගෙවුම් .. | 589·7 | 695·4 | 789·2 | 909·8 | 1,079·8 | 883·1 | 1,194·5 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

( අ ) පිටි, සිනි සහ ඇතැම් අනෙකුත් ආහාර විකිණීමෙන් ලාභ.

( ආ ) වර්ෂයකට රුපියල් 12,000 කට වැඩි තක්සේරුගත ආදයම් ලබන සහල් සලාක පොත් හිමියන්ගෙන් වර්ෂයකට රුපියල් 52 ක බද්දක් අය කෙරිණි.

( ඇ ) නිදන් අරමුදල් දයක දීමනා, රාජ්‍ය ණය පිළිබඳ සෘජු ආපසු ගෙවීම් සහ ජාත්‍යන්තර සංවිධාන වලට විශේෂ ගෙවීම් 1967/68 මුදල් වර්ෂය දක්වා පුනරාවර්තන වියදම් වලින්ද, 1968/69 සිට ප්‍රාග්ධන වියදම් වලින්ද ඉවත් කෙරිණ. 1969/70 සඳහා පුනරාවර්තන වියදම පිළිබඳ (තාවකාලික) දත්තයට විදේශීය ණය ආපසු ගෙවීම හා සම්බන්ධ වූ විවිහිස මිල දී ගැනීම් ඇතුළත් නැත.

( ඈ ) සීනි, පිටි හා ඇතැම් වෙනත් භාණ්ඩයන් අලෙවියෙන් ලද ලාභ හැර සහල් හා රතුළුණු පිළිබඳ නිෂ්පාදක හා පාරිභෝගික පිහිටාධාරයන් සංයුක්ත වෙයි. II (ඊ) 7 වැනි සංඛ්‍යා සටහන බලන්න.

( ඉ ) සහල්, රතුළුණු සහ වෙනත් ආහාර මිල දී ගැනීමෙන් හා විකිණීමෙන් අලාභ.

( උ ) ප්‍රාග්ධන ක්‍රියාවලියන් නඩත්තු කිරීමේ වියදම් සහ ප්‍රාග්ධන ක්‍රියාවලියන්හි නිරත පුද්ගලයන්ගේ වැටුප් හා 1969/70 දී (මූලික අංස්තමේන්තු) රුපියල් දශ ලක්ෂ 78·1 ක්වූ ප්‍රාග්ධන වියදම් හා සම්බන්ධ විවිහිස මිල දී ගැනීම් වලින් ප්‍රධාන වශයෙන් සමන්විතවී ඇත.

( ඌ ) ආරක්ෂණ වියදම් වලින් හා ප්‍රාග්ධන සම්මතයන් යටතේ දක්වෙන වර්තන සංක්‍රාම වලින් ප්‍රධාන වශයෙන් සමන්විතවී ඇත.

## (ආ) ආදායම

පසුගිය වර්ෂ තුනෙහිදී ඉහළ නගිමින් පැවතුණ රජයේ ආදායම වැඩිවීම පිළිබඳ අනුපාතිකයෙහි ශීඝ්‍රතාවය 1969/70 දී තරමක් හීන වීය. 1969/70 මුදල් වර්ෂයේදී රජයේ ආදායම රුපියල් දශලක්ෂ 206කින් නැතහොත් සියයට 9 කින් වැඩි විය. 1966/67, 1967/68 සහ 1969/70 යන මුදල් වර්ෂවල එම ප්‍රමාණයන් පිළිවෙලින් රුපියල් දශලක්ෂ 175 ක් නැතහොත් සියයට 9 ක්ද, රුපියල් දශලක්ෂ 219 ක් නැතහොත් සියයට 10 ක්ද, රුපියල් දශලක්ෂ 349 ක් නැතහොත් සියයට 14 ක් ද විය.

1969 නොවැම්බර්හිදී රජයේ විදුලිබල දෙපාර්තමේන්තුව ලංකා විදුලිබල මණ්ඩලය බවට පරිවර්තනය කිරීම හේතු කොට ගෙන ඊට අදල සංඛ්‍යා 1969/70 නියම ආදායමෙන් ඉවත් කිරීම නිසා 1969/70 නියම ආදායම් ලැබීම් ඊට පෙර වර්ෂ සමග යම් පමණකට වඩාත් සියුම් ලෙස නො ගැලපෙනු ඇත. අනෙක් අතට, රජයේ ආයාත සඳහා ගෙවූ විවිහිස වලින් ලැබෙන ආදායම ඇතුලත් කිරීම 1969/70 රජයේ ආදායම හා 1970/71 මුල් ඇස්තමේන්තු පිළිබඳ සංඛ්‍යාවල අගය වැඩිවීමට තුඩු දී ඇත. කෙසේ වුවද, මෙම ආදායම් මූලයන් ද ඉවත් කොට සකස් කරන ලද වඩාත් ක්‍රමාණුකූල සැසඳුමකින් ද පෙනී යන්නේ 1969/70 ආදායම් වැඩිවීමේ අනුපාතිකයේ සීඝ්‍රතාවය හීන වූ බවකි.

පසුගිය වර්ෂ නවයෙහි රජයේ ආදායම් පිළිබඳ සංඛ්‍යාත්මක විස්තර 1970/71 සඳහා වූ මූලික ඇස්තමේන්තු සමග දෙවන පරිශිෂ්ටයෙහි 35 වෙනි සංඛ්‍යා සටහනින් දක්වේ. පසුගිය වර්ෂ දෙකෙහි රජයේ ආදායම සහ 1969/70 හා 1970/71 වර්ෂ සඳහා වූ මූලික ඇස්තමේන්තු පහත II (ඊ) 3 වැනි සංඛ්‍යා සටහනෙහි දක්වේ.

1969/70 දී රුපියල් දශලක්ෂ 2,992 ක් වූ මුළු ආදායමෙන් වැඩි කොටසක් සංයුක්ත වී ඇත්තේ පසුගිය කාලයේදී මෙන්ම ජංගම ලැබීම්වලිනි. මුළු ආදායම තුල ප්‍රාග්ධන ලැබීම් පිළිබඳ ප්‍රතිශතය සියයට 1 සිට සියයට 2 දක්වා වැඩි වෙමින් පසුගිය වර්ෂයට වඩා සැහෙන නැගීමක් වාර්තා කළද, එය තවමත් සැලකිය යුතු නොවන තත්වයක පවතී. 1969/70 දී රජයේ ආදායමෙන් තුනෙන් දෙකකට මදක් වැඩි ප්‍රමාණයක් නිෂ්පාදනය හා වියදම මත පනවන ලද බදු මගින් ලැබිණ. පසුගිය වර්ෂයට වඩා 1969/70 දී ආදායම වැඩිවීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ, ආදායම් බදු (රුපියල් දශලක්ෂ 98 කින්), පිරිවැටුම් බදු (රුපියල් දශලක්ෂ 136 කින්), විවිහිස විකුණුම් (රුපියල් දශලක්ෂ 161 කින්), නිර්යාන බදු (රුපියල් දශලක්ෂ 27 කින්) සහ රාජ්‍ය සමායතනවල ලාභාංශ (රුපියල් දශලක්ෂ 20 කින්) යන මූලයන්ගෙන් ලැබීම් ඉහළ නැගීමයි. අනෙක් අතට, එම ඉහළ නැගීමෙහි·බලපෑම සමහන් වූයේ, ආයාත බදු (රුපියල් දශලක්ෂ 154 කින්), ආහාර විකුණුම්වලින් ලද ලාභ[1] සහ රජයේ විදුලිබල දෙපාර්තමේන්තුවේ දළ ලැබීම් (රුපියල් දශලක්ෂ 113 කින්) පහත බැසීම හේතුකොටගෙනය. පිරිවැටුම් බදුවලින් ලද ආදායම ඉකුත් වසරට වඩා දෙගුණයකින් වැඩි වූ අතර, විවිහිස විකිණීමෙන් ලද ආදායම පසුගිය වර්ෂවලදී මෙන්ම ආයාත තීරුබදුවලින් ලද ආදායම පහත බැසීමේ උපනතියට හිලව්වන ලෙස වැඩි වී ඇත.

1969/70 නියම (තාවකාලික) ආදායම මුලදී අයවැය ඇස්තමේන්තු හා සසඳන විට රුපියල් දශලක්ෂ 102 ක නැතහොත් සියයට 3 ක පහතවැටීමක් පෙන්නුම් කෙරේ. මෙම අඩු-වීමට ප්‍රධාන සාධකයන් වූයේ, පිරිවැටුම් බද්ද (රුපියල් දශලක්ෂ 35 කින්), ආයාත බදු (රුපියල් දශලක්ෂ 18 කින්), විවිහිස විකුණුම් (රුපියල් දශලක්ෂ 94 කින්) සහ රජයේ විදුලිබල දෙපාර්තමේන්තුවේ ආදායම (රුපියල් දශලක්ෂ 136 කින්) වූ පහත බැසීමය. ආදායම් බදු (රුපියල් දශලක්ෂ 111 කින්), නිර්යාත බදු (රුපියල් දශලක්ෂ 29 කින්) සහ ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුවේ දළ ආදායම (රුපියල් දශලක්ෂ 11 කින්) යන අධිකතරයන් නිසා ඉහත අඩුවීම් සැහෙන පමණ මැකී ගියේය.

---

1. මුළුමණින්ම වාගේ පිටි සහ සීනි විකිණීමෙන් ලද ලාභවලින් සමන්විත වී ඇත.

## II (ඊ) 3 වැනි සංඛ්‍යා සටහන
## 1967/68 සිට 1969/70 - රජයේ ආදායම[1]

රුපියල් දශ ලක්ෂ

| මූලයන් | 1967 – 68 නියම | 1969 – 70 මූලික ඇස්තමේන්තු | 1969 – 70 නියම තාවකාලික | 1970 – 71 මූලික ඇස්තමේන්තු |
|---|---|---|---|---|
| **1· වර්තන ලැබීම් .. .. ..** | **2,747·2** | **3,060·6** | **2,937·3** | **2,968·0** |
| **1·1 පෞද්ගලික හා සමාගම් ආදායමෙන් වූ බදු ..** | **343·9** | **330·0** | **441·1** | **425·0** |
| 1·1·1 ආදායම් බදු .. .. .. | 343·0 | 330·0 | 440·6 | 425·0 |
| 1·1·2 අනෙකුත් .. .. .. | 0·9 | — | 0·5 | — |
| **1·1 නිෂ්පාදන හා වියදම් මත පැනවූ බදු ..** | **1,900·3** | **2,157·9** | **2,048·9** | **2,042·1** |
| 1·2·1 සාමාන්‍ය අලෙවි සහ පිරිවැටුම් බදු .. | 111·0 | 282·0 | 247·4 | 293·8 |
| 1·2·2 වරණ අලෙවි බදු .. : | 278·3 | 264·9 | 275·8 | 300·8 |
| (අ ) දුම්කොළ බද්ද .. .. | 219·7 | 220·0 | 218·3 | 242·5 |
| (ආ) තේ බද්ද .. .. | 42·3 | 30·8 | 41·6 | 38·9 |
| (ඇ) වෙනත් .. .. | 16·3 | 14·1 | 15·9 | 19·4 |
| 1·2·3 ආනයන බදු .. .. | 460·2 | 324·0 | 306·5 | 288·0 |
| (අ ) එළවලු නිෂ්පාදිතයන් .. | 27·3 | 23·5 | 25·7 | 40·8 |
| (ආ) සකස් කරනලද ආහාර, බීම, දුම්කොළ ආදිය .. .. | 70·6 | 67·0 | 61·1 | 55·5 |
| (ඇ) මිහි නිෂ්පාදිතයන් .. .. | 154·8 | 39·0 | 39·4 | 8·0 |
| (ඇ) රසායනික හා ඊට අනුබද්ධ කාර්මික නිෂ්පාදිතයන් .. | 25·0 | 27·0 | 25·7 | 27·0 |
| (ඉ ) ප්ලාස්ටික් ද්‍රව්‍ය . රබර් හා අනෙකුත් කෘතිම ද්‍රව්‍ය .. | 19·2 | 19·0 | 16·0 | 15·0 |
| ( ඊ ) කඩදාසි සෑදීමේ ද්‍රව්‍ය .. | 13·1 | 14·0 | 8·5 | 13·0 |
| ( උ ) රෙදිපිළි හා රෙදි නිෂ්පාදිතයන් .. | 29·4 | 35·0 | 18 0 | 28·5 |
| (ඌ) අමු ලෝහ සහ ලෝහ ද්‍රව්‍ය .. | 27·4 | 30·0 | 20·2 | 21·5 |
| (එ) යන්ත්‍රෝපකරණ සහ යාන්ත්‍රික අමතර කොටස්, විදුලි උපකරණ ආදිය· | 37·4 | 28·0 | 31·8 | 31·5 |
| (ඒ) රථවාහන, ගුවන්යානා යාත්‍රා ආදිය · | 27·9 | 18·0 | 31·4 | 27·0 |
| (ඔ) වෙනත් .. .. | 20·8 | 18·5 | 19·8 | 12·2 |
| (ඕ) ආනයන බලපත්‍ර ගාස්තු .. | 7·3 | 5·0 | 8·9 | 8·0 |
| 1,2·4 විවිධිස විකිණීමෙන් ලැබීම් .. | 285·2 | 540·0 | 446·0 | 457·0 |
| 1·2·5 අපනයන බදු .. .. | 300·3 | 298·2 | 327·2 | 331·8 |
| (අ ) තේ .. .. | 177·4 | 185·0 | 171·6 | 180·3 |
| (ආ) රබර් .. .. | 64·1 | 41·3 | 79·0 | 70·0 |
| (ඇ) පොල් .. .. | 45·7 | 40·2 | 53·1 | 46·0 |
| (ඇ) වෙනත් .. .. | 13·1 | 31·7 | 32·5 | 36·5 |
| 1·2·6 බලපත්‍ර ගාස්තු .. .. | 41·4 | 41·4 | 41·3 | 44·7 |
| 1·2·7 දේපල පැවරුම් බදු .. .. | 22·0 | 20·7 | 22·2 | 20·7 |
| 1·2·8 රජයේ ඒකාධිකාරින්ගේ අතිරික්ත .. | 110·3 | 125·0 | 124·4 | 150·0 |
| 1·2·9 ආහාර විකිණීමෙන් ලාභ .. | 291·6 | 261·7 | 259·1 | 155·3 |
| **1·3 ලැබූ පොළී හා ලාභාංශ ..** | **18.8** | **49.4** | **41.5** | **63·8** |
| 1·3·1 රාජ්‍ය සමායතනවලින් ලාභ හා ලාභාංශ .. .. .. | 11·5 | 43·0 | 31·4 | 57·3 |
| 1·3·2 වෙනත් .. .. .. | 7·3 | 6·4 | 10·1 | 6·5 |
| **1·4 වෙළෙඳ ව්‍යවසායයන්ගේ දළ ලැබීම ..** | **371·6** | **401.4** | **283·6** | **302·7** |
| 1·4·1 දුම්රිය .. .. .. | 131·0 | 129·3 | 139·9 | 134·8 |
| 1·4·2 විදුලිබල .. .. .. | 115·0 | 137·7 | 1·8 | 3·2 |
| 1·4·3 තැපැල් හා විදුලි සංදේශ .. | 69·5 | 77·2 | 72·9 | 93·4 |
| 1·4·4 වරාය සහ නැව්තොට .. .. | 41·0 | 37·3 | 44·4 | 52·0 |
| 1·4·5 අනෙකුත් .. .. .. | 15·1 | 19·9 | 24·6 | 19·3 |
| **1·5 අනෙකුත් වර්තන ලැබීම් .. ..** | **112·6** | **121·9** | **122·2** | **134·4** |
| 1·5·1 ජාතික ලොතැරැයිය .. .. | 18·2 | 21·0 | 13·6 | 17·0 |
| 1·5·2 අනෙකුත් .. .. .. | 94·4 | 100·9 | 108·4 | 117·4 |
| **2· ප්‍රාග්ධන ලැබීම් .. .. ..** | **38·5** | **33·0** | **54·7** | **62·2** |
| **2·1 දේශීය අංශවල ප්‍රාග්ධන ගිණුම් වලින් පැවරුම්** | **28·7** | **22·0** | **29·2** | **31·3** |
| 2·1·1 මුදල් බද්ද .. .. .. | 14·3 | 9·0 | 12·0 | 9·0 |
| 2·1·2 පෞද්ගලික බද්ද .. .. | 13·7 | 13·0 | 17·0 | 15·0 |
| 2·1·3 වෙනත් .. .. .. | 0·7 | — | 0·2 | — |
| **2·2 අනෙකුත් ප්‍රාග්ධන ලැබීම් .. ..** | **9·8** | **11·0** | **25·5** | **30·9** |
| **3· මුළු ආදායම .. .. ..** | **2,785·8** | **3,093·6** | **2,992·0** | **3,030·2** |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

1· ඉහත දැක්වෙන ශීර්ෂයන් පිළිබඳ වැඩි විස්තර සඳහා II පරිශිෂ්ටයෙහි 35 වෙනි සංඛ්‍යා සටහනෙහි පාද සටහන් බලන්න.

1970/71 මෙම මුදල් වර්ෂයේදී, රජයේ ආදායම රුපියල් දශලක්ෂ 38 කින්, නැතහොත් සියයට 1 කින් පමණ වැඩිවේය'යි අපේක්ෂා කෙරේ. අපේක්ෂිත සැළකිය යුතු වැඩිවීම් වූයේ පිරිවැටුම් බදු (රුපියල් දශලක්ෂ 46), දුම්කොළ බදු (රුපියල් දශලක්ෂ 24), විවිහිස විකුණුම් (රුපියල් දශලක්ෂ 11) රජයේ ඒකාධිකාරීවල අතිරික්තය (රුපියල් දශලක්ෂ 26), රජයේ සමායතනවල ලාභ සහ ලාභාංශ (රුපියල් දශලක්ෂ 26), වෙනත් ජංගම ලැබීම් (රුපියල් දශලක්ෂ 12), ප්‍රාග්ධන ලැබීම් (රුපියල් දශලක්ෂ 8) සහ විදුලි සංදේශය සේවාවල දළ ලැබීම් (රුපියල් දශලක්ෂ 21) ය[1]. ඉහත කී වැඩිවීම්වල ප්‍රතිවිපාකය, අපේක්ෂිත ආදායම් බදුවල (රුපියල් දශලක්ෂ 16), ආයාත තීරුබදුවල (රුපියල් දශ ලක්ෂ 19 ක) සහ ආහාර විකිණීමෙන් ලද ආදායමේ (රුපියල් දශලක්ෂ 104 ක) පහත වැටීම් මගින් හීන වේ.

## 1. පුද්ගල සහ සමාගම් මත පැවරුණ බදු

මෙම ආදායම මුළුමණින්ම පාහේ සමන්විත වී ඇත්තේ පුද්ගලයන් සහ සමාගම් මත පැවරුණු ආදායම් බද්දෙනි[1]. 1969/70 දී ඉකුත් වර්ෂයට වඩා සිදු වූ රුපියල් දශලක්ෂ 97 ක සැලකිය යුතු වැඩිවීම සහ මූලික ඇස්තමේන්තුවලට වඩා සිදු වූ රුපියල් දශලක්ෂ 111 ක සැලකිය යුතු වැඩිවීම සිදුවූයේ සාධක කිහිපයක් නිසාය. පළමුව, 1969/70 දී සමායතන-වලින් සහ තෝරාගත් සමාගම් කිහිපයකින් රුපියල් දශලක්ෂ 60 ක් කලින් එකතු කර ගති. දෙවනුව, යහපත් ආර්ථික තත්වයන්ගේ ප්‍රතිඵලයක් වශයෙන් වෙළඳ ආදායම වැඩිවීමක් පැවතිණ. තෙවනුව, විශාල වශයෙන් අනුමාන කළ බදු පැහැර හැරීම් පැවති ඇතැම් වෙළඳ අංශ පිළිබඳව කරන ලද විමර්ෂණයන් මගින් අමතර ආදායමක් එකතු වීය. තවද, මුලදී විමර්ෂණයන්ට භාජනය කරන ලද බදු ගෙවන්නන් සැහෙන සංඛ්‍යාවක් සතුටුදයක ප්‍රකාශනයන් ඉදිරිපත් කරන ලදී. අවසාන වශයෙන්, අළුතෙන් එකතු වූ බදු ගෙවන්නන් නිසා බදු අය කිරීමේ ක්ෂේත්‍රය පුළුල් කිරීමක් ද සිදු වීය.

1970/71 දී අයබදුවලින් අපේක්ෂිත ආදායම් ඉකුත් වර්ෂයේ මූලික ඇස්තමේන්තුවලට වඩා බෙහෙවින් ඉහළ ගියද, 1969/70 නියම (තාවකාලික) ආදායමට වඩා රුපියල් දශලක්ෂ 16 කින් පහත් විය. 1970/71 දී අපේක්ෂිත රුපියල් දශලක්ෂ 425 න් රුපියල් දශලක්ෂ 100 ක් එකතු කර ගැනීමට බලාපොරොත්තු වන්නේ රුපියල් 100 සහ රුපියල් 50 නෝට්ටු විමුල්‍යනය කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් එකතුවන හිඟ බදු මුදල් වශයෙනි. මෙසේ, මෙම අමතර ආදායමට ඉඩ හැරීමෙන් පසු, 1970/71 මූලික ඇස්තමේන්තු 1969/70 මූලික ඇස්ත-මේන්තු සමග සැසඳීමේදී ආදායම් බද්දෙන් මඳක් අඩු වූ ආදායමක් පූර්වකථනය කරයි. සාමාන්‍ය විචල්‍යයන් හැර එම වෙනසට හේතු විය හැකි තවත් කරුණක් නම් එවැනි ආදායමක් පූර්වකථනය කිරීමේදී පවත්නා සම්ප්‍රදයික සාවද්‍යතාවයයි. ආදායම් බදු පිළිබඳ නියම එකතු කිරීම් පසුගිය වසරවල මූලික පූර්වකථනයන් ඉක්මවා ගිය බැව් සඳහන් කළ හැකිය.

## 2. වියදම හා නිෂ්පාදනය මත පනවන ලද බදු

මෙම ශීර්ෂය සාමාන්‍යයෙන් අලෙවි හා පිරිවැටුම් බදු (මුළුමණින්ම වාගේ පිරිවැටුම් බද්දෙන් සමන්විත), වරණ අලෙවි බදු, (දුම්කොල මත පනවන ලද දේශීය භාණ්ඩ බදු හා වටිනාකම අනුව පනවන ලද තේ තීරුබද්ද යනාදිය වේ) ආනයන බදු, අපනයන බදු, වි. වි. හ. ස. අලෙවියෙන් ලැබෙන ලැබීම්, රජයේ ඒකාධිකාරයන්ගේ අතිරික්ත (අරක්කු වැනි) හා ආහාර අලෙවියෙන් ලැබෙන ලාභ (පිටි හා සීනි වැනි) ඇතුලත් වේ.

### පිරිවැටුම් බදු

පිරිවැටුම් බද්ද රජයේ ප්‍රධාන අය මාර්ගයක් ලෙස වැඩී වී ඇති බැව් 1968 සහ 1969 වාර්ෂික වාර්තාවල දක්විණ. මෙම වැදගත්කම 1969/70 දීද පැවතුණද එය අපේක්ෂිත තරම් නොවිණ. නිෂ්පාදකයින්ගේ සහ ව්‍යාපාරිකයන්ගේ පිරිවැටුම මත පමණක් ලද මෙම බද්දෙන් ලැබුණ ආදායම මෙම වසරේදී රුපියල් දශලක්ෂ 136 කින් ඉකුත් වසරට වඩා වැඩි (දෙගුණයකටත් වඩා) වීය. කෙසේ වුවද, 1969/70 මූලික ඇස්තමේන්තුවලට වඩා එය

1· පුද්ගලයන් සහ සමාගම්වලින් ලැබුණ ආදායම වෙන වෙනම දැක්විය නොහැකි වුවද, එම මුල් ආදායමෙන් සියයට 40 ක් පමණ පුද්ගලයන්ගෙන්ද, සියයට 60 ක් සමාගම්වලින් ද ලැබෙ යයි දළ වශයෙන් ඇස්ත-මේන්තු කොට ඇත.

රුපියල් දශලක්ෂ 35 කින් පහත්ය. 1970/71 දී පිරිවැටුම් බදුවලින් අපේක්ෂිත ආදයම රුපියල් දශලක්ෂ 294 ක් වන අතර, ඒ අනුව, ඉකුත් වසරට වඩා රුපියල් දශලක්ෂ 47 ක් එමගින් රජයේ ආදයමට සැපයේ. මෙසේ රජයේ මුළු ආදයම තුල පිරිවැටුම් බදු ආදයමෙහි ප්‍රතිශතය 1967/68 දී සියයට තුනේ සිට 1969/70 දී සියයට හය දක්වා අනුක්‍රමයෙන් වැඩි වූ අතර, 1970/71 දී එය සියයට 7 දක්වා වැඩි වේ යයි අපේක්ෂා කෙරේ. 1969/70 දී පිරිවැටුම් බදුවලින් ලද ආදයම ඉකුත් වසරට වඩා වැඩිවීමට හේතු වූයේ පෙට්‍රෝලියම් නිෂ්පාදිතයන් පිළිබඳ කර්මාන්තයට පිරිවැටුම් බදු පැනවීම, මීට පෙර බද්දට හසු නොවූ සිගරට් නිෂ්පාදනය වැනි ශීර්ෂයන් කිහිපයක් ඇතුලත් කිරීම, පිරිවැටුම් බද්දෙන් නිදහස් කිරීමේ සීමාව රුපියල් දශලක්ෂ 100,000 සිට 75,000 දක්වා පහත හෙළීම සහ සමහර ශීර්ෂයන්ගේ අනුපාතිකයන් සංශෝධනය කිරීම යන කරුණු වේ.[1] ඒ හැර, ව්‍යාපාරික කටයුතු ඉහළම මට්ටමක පැවතීම නිසා පිරිවැටුම් වැඩිවීමද ඊට හේතු විය. පෙට්‍රෝලියම් නිෂ්පාදිකයන් සඳහා පිරිවැටුම් බදු හඳුන්වාදීමත් සමග, එවැනි නිෂ්පාදිතයන් පිළිබඳ ආයාත වැලැක්වීමත්, රළු හා අමුතෙල් ආයාත තීරුබද්ද අවලංගු කිරීමත් සිදු විය. මූලික ඇස්තමේන්තුවලට වඩා නිම ලැබීම්වල අඩුවීමට හේතු වූයේ, මෙම මුදල් වර්ෂයෙන් බැහැර වූ 1969/70 අවසාන කාර්තුවේදී ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ආදයම පහත බැසීමයි. පෙට්‍රෝලියම් පිරිපහදු කම්හලේ නිෂ්පාදන කටයුතු ඇරඹීම පමා වීමද ඊට හේතු විය. 1970/71 දී පිරිවැටුම් බද්දෙන් අපේක්ෂිත ඉහළ ආදයමට තවත් හේතුවක් නම්, ශීර්ෂයන් කිහිපයකම බදු අනුපාතිකයන් ඉහළ නැංවීමයි.[2]

## වරණ අලෙවි බදු

ඉකුත් මුදල් වර්ෂය හා සසඳන විට 1969/70 දී වරණ අලෙවි බදුවලින් ලද ආදයම රුපියල් දශලක්ෂ 3 කින් අඩු විය. එසේ වුවද. එය මූලික ඇස්තමේන්තුවලට වඩා රුපියල් දශලක්ෂ 11 ක අධිකතරයක් පෙන්වීය. දුම්කොළ බදු සහ තේ බදුවලින් ලද ආදයම මඳකින් අඩුවීම ඉහත කී පහත බැස්මට හේතු විය. 1969/70 වර්ෂය සඳහා මූලික වශයෙන් ඇස්තමේන්තු කරන ලද ආදයමට වඩා මෙම මූලයෙන් වූ ලැබීමේ අධිකරතයට හේතු වූයේ, කෝ බදු එකතු කිරීම්වල රුපියල් දශලක්ෂ 11 ක සහ වෙනත් බදු ලැබීම්වල රුපියල් දශලක්ෂ 2 ක වැඩිවීමයි. එම වැඩිවීමේ බලපෑම තරමක් දුරට අඩු වූයේ සිගරට් සහ පයිප්ප දුම්කොළ අලෙවිය හීනවීම නිසා දුම්කොළ බද්දේ රුපියල් දශලක්ෂ 2 ක් වූ පහත් ලැබීම වේ. තේ බදු ලැබීම් ඉහළ යාමට හේතු වූයේ ලන්ඩන් සහ කොළඹ වෙන්දේසි වල බලාපොරොත්තු වූවාට වඩා යහපත් තේ මිලයන් පැවතීමයි.

1970/71 දී ඉකුත් වර්ෂයට වඩා රුපියල් දශලක්ෂ 25 ක වැඩි ආදයමක් වරණ අලෙවි බදු වලින් අපේක්ෂා කෙරේ. දුම්කොළ රාත්තලකට තීරු බද්ද රුපියල් 5 කින් වැඩිවීම නිසා, දුම්කොළ බදු ආදයම රුපියල් දශලක්ෂ 24 කින් වැඩි වේ යයි අපේක්ෂා කෙරේ. තේ බදු ආදයම රුපියල් දශලක්ෂ 3 කින් අඩු වේ යයිද, වෙනත් බදු ආදයම් රුපියල් දශලක්ෂ 4 කින් වැඩි වේ යයිද අපේක්ෂා කෙරේ.

## ආනයන බදු

රජයේ ආදයම ලැබෙන මාර්ගයක් වශයෙන් ආනයන බදුවල පහත වැටෙන උපනතියක් විශේෂයෙන්ම විවිහිස ක්‍රමය හඳුන්වා දීමෙන් පසුව පැවති බව ඉකුත් වර්ෂ දෙකේ වාර්තාවල පල විය. මෙම උපනතිය 1969/70 දීද පවතින අතර, ආනයන බදු ලැබීම් රුපියල් දශලක්ෂ 154 කින් නැතහොත් සියයට 34 කින් ඉකුත් වර්ෂයට වඩා තියුණු ලෙස අඩු විය. II (ඊ) 3 වැනි සංඛ්‍යා සටහනේ දැක්වෙන පරිදි සියළුම වර්ගවල ආනයන බදු ඉකුත් වර්ෂයට වඩා අඩු විය. එහි නිෂ්පාදිතයන් (රුපියල් දශලක්ෂ 115) සම්බන්ධයෙන් වූ අඩුවීම සැලකිය යුතු වන අතර, වෙනත් අඩුවීම් වූයේ රෙදිපිළි හා රෙදිපිළි ද්‍රව්‍ය (රුපියල් දශලක්ෂ 11), පිළියෙල

1. මෙම වෙනස්වීම් පිළිබඳ විස්තර 1969 වාර්ෂික වාර්තාවේ දැක්වේ. 147 වැනි පිටුව.
2. මෙම සංශෝධනය පිළිබඳ විස්තර මෙම වාර්තාවේ පසුව දක්වේ. ''1970/71 අයවැය ලේඛනය'' යන කොටස බලන්න.

1978 ජූනි 12



කරන ලද ආහාර, බීම වර්ග, දුම්කොළ ආදිය (රුපියල් දශලක්ෂ 10) සහ මූලික ලෝහ ද්‍රව්‍ය (රුපියල් දශලක්ෂ 7) පිළිබඳව වේ. ආනයන බදු ඉහළ නැගීම සිදු වූයේ රථවාහන, ගුවන් යානා, යාත්‍රා (රුපියල් දශලක්ෂ 4) සහ රසායනික නිෂ්පාදිතයන් හා ඊට අනුබද්ධ කර්මාන්තයන් (රුපියල් දශලක්ෂ 1) සම්බන්ධයෙනි. තවද, ආනයන බලපත්‍ර ගාස්තු ලැබීම්ද රුපියල් දශලක්ෂ 2 කින් වැඩි විය.

විදේශ විනිමය දුෂ්කරතා සහ ඒ අනුව පැනනැඟුණ ආයාත පරිමාවේ පහත බැසීම යන සාමාන්‍ය සාධකය හැරුණ විට ඒ ඒ ආනයන වර්ගවල ආනයන බදු ලැබීම් පහත බැසීමට ඇතැම් විශේෂිත කරුණු හේතු විය. මිහි නිෂ්පාදිතයන්ගේ ආනයන බදු අඩුවීමට හේතු වූයේ පිරිපහදු පෙට්‍රෝලියම් නිෂ්පාදිතයන් ආනයන කිරීම වැලැක්වීම සහ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ පිරිපහදු කම්හල සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය ආනයන කිරීමේ බදු අඩු කිරීමයි. ඇතැම් රෙදි පිළි ආනයන කිරීමේ බදු පිළිබඳව සීමාසහිත සළුසල වෙත ප්‍රදානය කරන ලද නීත්‍යානුකූල වරණය මූලික වශයෙන් රෙදිපිළි සහ රෙදි නිෂ්පාදිතයන්ගේ ආනයන බදු අඩුවීමට හේතු වූ අතර, අනෙක් අඩුවීම්වලට හේතු වූයේ ආයාත පරිමාවේ පහත බැසීමයි.

1969/70 දී ආනයන තීරු බදු ලැබීම් එම වර්ෂයේ මුල් ඇස්තමේන්තුවලට වඩා රුපියල් දශලක්ෂ 18 කින් පහත් වීය. අපේක්ෂිත ප්‍රමාණයට වඩා ආනායනයන් අඩුවීම මෙම පහත් මට්ටමට ප්‍රධාන හේතුව වීය.

1970/71 මුදල් වර්ෂයේදී ආයාත බදුවලින් ලබන ආදායම ආයාත පරිමාවේ අඩුවීම හේතු කොට ගෙන තවත් රුපියල් දශලක්ෂ 9 කින් අඩු වේ යයි අපේක්ෂා කෙරේ. මෙම අඩුවීම මිහි නිෂ්පාදනය (රුපියල් දශලක්ෂ 31), රථවාහන, ගුවන් යාන, යාත්‍රා ආදිය (රුපියල් දශලක්ෂ 4), සහ එළවළු නිෂ්පාදිතයන් (රුපියල් දශලක්ෂ 15) යන පහත බැසීම්වල ශුද්ධ ප්‍රතිඵලය ලෙස අපේක්ෂා කෙරේ. මිහි නිෂ්පාදිතයන් සම්බන්ධ බැසීමට පිරිපහදු පෙට්‍රෝ-ලියම් නිෂ්පාදිතයන් ආනයන පිළිබඳව තවදුරටත් අපේක්ෂිත අඩු කිරීම හේතුවන අතර, බදු රහිතව රෙදි පිළි ආනයනය කිරීමට සීමාසහිත සළුසලට දී තිබූ සහනය (අමතර නීත්‍යානුකූල වරණයක ස්වරූපයෙන්) ඉවත් කිරීම රෙදි පිළි සම්බන්ධයෙන් අපේක්ෂිත වැඩිවීමට හේතුවේ.[2]

**විවිහිස අලෙවියෙන් ආදායම**

මෙම මාර්ගයෙන් ලද ආදායම 1969/70 දී ඉකුත් වර්ෂයට වඩා රුපියල් දශලක්ෂ 161 කින් තියුණු ලෙස වැඩි වූ අතර, රජයේ දෙපාර්තමේන්තු බොහොමයක විදේශීය ගෙවීම් විවිහිස යටතට පත්වීම ඊට හේතු වීය. කෙසේ වුවද, 1969/70 විවිහිස ආදායම වූ රුපියල් දශලක්ෂ 94 එම වර්ෂයේ මූලික ඇස්තමේන්තුවලට වඩා පහත් වීය. මෙම අඩුවීමට ප්‍රධාන හේතුව වූයේ 1970 මැයි 29 දින සිට විවිහිස විකිණීම අත්හිටුවීම (ප්‍රධාන වශයෙන් විවෘත සාමාන්‍ය බලපත්‍ර ආයාත) සහ සුළු නිර්යාතනයන් පිළිබඳ අධික ගෙවීමය. 1970/71 දී විවිහිස අලෙවියෙන් ලබන ආදායම ආයාත පරිමාවෙහි අපේක්ෂිත අඩුවීම කරනකොට ගෙන රුපියල් දශලක්ෂ 11 කින් පමණ වැඩිවේ යයි අපේක්ෂා කෙරේ.

**අපනයන බදු**

ඉකුත් වර්ෂය හා සසඳන විට 1969/70 දී අපනයන බදු රුපියල් දශ ලක්ෂ 27 කින් වැඩි විය. සුළු නිර්යාත (රුපියල් දශ ලක්ෂ 19), තෙල් (රුපියල් දශ ලක්ෂ 7) සහ රබර් (රුපියල් දශ ලක්ෂ 6) යන ඒවායේ ඉහළ බදු ලැබීම් එම වැඩිවීමට හේතුවූ අතර, තේ බදුවල බැසීම (රුපියල් දශ ලක්ෂ 6) එම වැඩිවීමෙහි බලපෑම හීන කිරීමට හේතු විය. කුරුඳු පොතු පැඟිරි තෙල්,සහ මිනිරන් වැනි බදු විරහිත ඇතැම් සුළු අපනයනයන් 1969/70 දී සියයට 10 සිට සියයට 40 දක්වාවූ බදුවලට භාජනය වීම සුළු අපනයනයන්ගේ බදු ලැබීම්වල සැලකිය යුතු

2. ආනයන බදු පිළිබඳ යෝජිත විධිවිධානයන් පිළිබඳ විස්තරාත්මක පැහැදිලි කිරීමක් "1970/71 අයවැය ලේඛනයෙහි" අවසාන කොටසෙහි දැක්වේ.

වැඩිවීමට හේතු විය. පොල් නිර්යාතයන්ගේ ඉහළ බදු ලැබීම්වලට හේතු වූයේ ලන්ඩන් වෙන්දේසිවල පිලිප්පීනයේ කොප්පරා වලට ඉහල මිලයන් ලැබීම (මෙම ලැබීම් ඉකුත් වර්ෂයෙහි දෙගුණයනට වඩා වැඩිය.) සහ පොල් තෙල් නිර්යාත පරිමාව වැඩිවීමයි. මෙම ගනයට අයිති කුඩා ශීර්ෂය වන අමු ගෙඩි වලි හැර කොප්පරා, පොල්තෙල් සහ කපාපු පොල් යන සියලුම ප්‍රධාන නිර්යාතයන්ගෙන් ලැබුණු ආදයම වැඩිවිය. රබර්වලින් ලත් අපනයන බදු වැඩිවීම මූලික වශයෙන් නිර්යාත පරිමාව රාත්තල් දශ ලක්ෂ 31 කින් (සියයට 10 කින්) වැඩිවීමේ ප්‍රතිඵලයක් විය. එම වැඩිවීම (රබර්වලට වටිනාකම අනුව අය කරන ආනයන බදු පදනම් වී ඇති) සිංගප්පූරු වෙළඳ පොලේ මිල, විශේෂයෙන් නිර්යාත පරිමාව අධික ලෙස පැවති මෙම මුදල් වර්ෂයේ අවසාන කාර්තුවේදී අඩුවීම නිසා ඉහත දැක්වූ වැඩිවීමට තරමක් හිලව් විය. ඊට තවත් හේතුවක් වූයේ ඉකුත් වර්ෂයේ නැව් කටයුතුවලට සම්බන්ධ ඇතුල්වීමේ බිල්පත් 1969/70 වර්ෂයේදී අනුමත වීමයි. තේ නිර්යාතයන්ගේ ආනයන බදු අඩු වූයේ රාත්තල් දශ ලක්ෂ 30 කින් (සියයට 6 කින්) නිර්යාත පරිමාව අඩු වීමත්, මුළු තේ නිර්යාත පරිමාව තුල පැකට් කළ තේ පිළිබඳ සාපේක්ෂ ප්‍රතිශතය මඳක් වැඩිවීමත් නිසාය.

මූලික අයවැය ඇස්තමේන්තු සමඟ සසඳන විට, නිර්යාත බදු ආදයම රුපියල් දශ ලක්ෂ 29 ක අධිකතරයකි. මෙම අධිකතරය රබර් නිර්යාත බදු රුපියල් දශ ලක්ෂ 29 කින් පොල් නිර්යාත බදු රුපියල් දශ ලක්ෂ 13 කින් සහ සුළු නිර්යාතයන්ගේ බදු රුපියල් දශ ලක්ෂ 1 කින් යන වැඩිවීම්වල ශුද්ධ ප්‍රතිවිපාකයක්වූ අතර, තේ නිර්යාත බදු රුපියල් දශ ලක්ෂ 13 කින් අඩුවීම ඊට තරමක් හිලව් විය. රබර් නිර්යාත බදුවල තියුණු වැඩිවීම ප්‍රධාන වශයෙන් ඉහත දැක්වූ පරිදි රබර් නිර්යාත පරිමාව අපේක්ෂිත වැඩිවීමට වඩා සතුටුදායක වීමයි. පොල් නිර්යාතයන්ගේ බදු ප්‍රධාන වශයෙන් ලන්ඩන් වෙන්දේසිවල කොප්පරා වලට පැවති ඉහළ මිලෙහි සහ ඊට අනුරූපව වටිනාකම අනුව තීරුබදුවල ඉහළ නැඟීම්වල ප්‍රතිඵලයකි. තේ වලින් ලද ආදයමේ බැසීමට ප්‍රධාන හේතුව නිර්යාත පරිමාව අපේක්ෂිත පරිමාවට වඩා අඩුවීමත්, මුළු තේ නිර්යාත පරිමාව තුළ පැකට් කළ තේ පිළිබඳ ප්‍රතිශතයේ ඉහළ නැගීමත්ය.

1970/71 දී නිර්යාත බදුවලින් ලැබෙන ආදයම රුපියල් දශ ලක්ෂ 5කින් වැඩිවේ යයි ඇස්තමේන්තු කර ඇත. තේ සහ සුළු අපනයනයන්ගෙන් ලැබෙන ආදයම පිළිවෙලින් රුපියල් දශ ලක්ෂ 9 කින් හා රුපියල් දශ ලක්ෂ 4 කින් අඩු වේ යයි අපේක්ෂා කරන අතර තෙල් සහ රබර් වලින් ලැබෙන ආදයම පිළිවෙලින් රුපියල් දශ ලක්ෂ 7 කින් හා රුපියල් දශ ලක්ෂ 1 කින් අඩු වේ යයි අපේක්ෂා කෙරේ.

### බලපත්‍ර හා දේපල පැවරීම් බදු

බලපත්‍ර බදු (අරක්කු තැබෑරුම් රේන්ද, රා මැදීමේ බලපත්‍ර ගාස්තු, ගුවන් විදුලි බලපත්‍ර ගාස්තු යනාදිය) හා දේපල පැවරීම් බදු (මුද්දර ගාස්තු, රථවාහන පැවරීමේදී අය කෙරෙන බදු ආදිය) වලින් ලත් ආදයම 1968/69 වර්ෂයේ දී මුළුමනින්ම වාගේ පැවති මට්ටමේ පැවතුණි. එසේ වුවත්, 1969/70 සඳහා වූ අයවැය ඇස්තමේන්තු සමග සැසැඳීමේදී එහි මුද්දර ගාස්තු එකතු කිරීමෙහි රුපියල් දශ ලක්ෂ 2 ක සුළු වැඩිවීමක් විය. 1970/71 වර්ෂයේදී ද මෙම මූලයන්ගෙන් වන ආදයම රුපියල් දශ ලක්ෂ 3 කින් ඉහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ.

### රජයේ ඒකාධිකාරයන්ගේ අතිරික්තය

මෙම ආදයම් ශීර්ෂය මුළුමනින්ම සෑදී ඇත්තේ අරක්කු වෙළඳාමෙන් රජය ලත් ලාභයන්ගෙනි. 1969/70 දී එහි රුපියල් දශ ලක්ෂ 14 ක වැඩිවීමක් විය. වසරේ අයවැය ඇස්තමේන්තුවට වඩා ආදයම අඩු වූයේ ඉතා සුළු වශයෙන් පමණි. වැඩිවූ ආදයමට හේතු වූයේ වැඩිවූ අරක්කු අලෙවියයි. විශේෂයෙන්ම, පොල් අරක්කු හා ස්ප්‍රීතු කලවම් කළ අඩු මිල අරක්කුවල අලෙවියෙහි ඇතිවූ වැඩිවීම නිසයි. 1970/71 දී තවදුරටත් රුපියල් දශ ලක්ෂ 26 ක වැඩිවීමක් ඉහල යන්නා වූ අලෙවි ප්‍රමාණයන්ගේ පදනම මත අපේක්ෂා කෙරුණි.

ආහාර අලෙවියෙන් ලත් ලාභ

මෙම රජයේ ආදායම් මූලය ප්‍රධාන වශයෙන් සීනි හා පිටි අලෙවි කිරීමෙන් ලැබෙන ලාභයන්ගෙන් සමන්විත වෙයි. මෙම ලාභයන් 1969/70 වර්ෂයේ දී රුපියල් දශ ලක්ෂ 33 ක පහත වැටීමක් දක්වූයේ, එම අවුරුද්දේම මුල් ඇස්තමේන්තුවල වූ රුපියල් දශ ලක්ෂ 30 ක පහත වැටීමය. 1970/71 දී තවදුරටත් මෙම ලාභයන් රුපියල් දශ ලක්ෂ 104 කින් පහත වැටෙ යයි අපේක්ෂා කෙරේ. ආහාර අලෙවියෙන් ලැබෙන ලාභ ප්‍රමාණයන්ගේ මෙම පහත වැටීමට හේතු පසුව එන ශුද්ධ පිහිටාධාර කොටසෙහි දක්වේ.

3. පොලී සහ ලාභාංශ

1969/70 දී මෙම මූලයෙන් ලත් ආදයම රුපියල් දශ ලක්ෂ 23 කික් සැලකිය යුතු ලෙස වැඩි විය. ලාභ හා ලාභාංශ වශයෙන් පොදු සමාගම් හා රජයේ සමායතනයන්ගෙන් භාණ්ඩාගාරයට වැඩියෙන් ලැබුණ මුදල් මේ සඳහා බලපාන ලද ප්‍රධාන හේතුව ලෙස දක්විය හැකිය. මෙවැනි දයක මුදල් රුපියල් දශ ලක්ෂ 20 කින් වැඩි විය. එසේ වුවත්, මෙම මූලයෙන් ලද ආදයම් අයවැය ගත ඇස්තමේන්තුවට වඩා රුපියල් දශ ලක්ෂ 8 කින් පහත් විය. 1970/71 දී පොලී හා ලාභාංශ තවදුරටත් රුපියල් දශ ලක්ෂ 22[1] කින් වැඩි වේ යයි අපේක්ෂා කෙරේ.

4. වෙළඳ ව්‍යවසායයන් ලැබීම්

රජයේ වෙළඳ ව්‍යවසායයන්ගේ දළ ලැබීම් (ප්‍රධාන වශයෙන් දුම්රිය, විදුලිබලය, තැපැල් සහ පණිවුඩ සේවා හා වරාය)[1] ,1969/70 දී රුපියල් දශ ලක්ෂ 88 කින් අඩු වින. මෙම තියුණු පහත වැටීම සඳහා ප්‍රධාන හේතුව වී ඇත්තේ, 1969 නොවැම්බර්වලදී කළ යලි ව්‍යවස්ථාපනයේ ප්‍රතිඵලයක් වශයෙන් 'ලංකා විදුලිබල මණ්ඩලය' නමින් රජයේ විදුලිබල දෙපාර්තමේන්තුව රජයේ සමායතනයක් බවට පත්වීම නිසා එහි ලැබීම් අයවැය ගිණුම්වලින් ඉවත්ව තිබීමය. වෙළඳ ව්‍යවසායයන්ගෙන් 1969/70 දී ලැබුණ ලැබීම් වර්ෂය සඳහා අයවැය ගත ඇස්තමේන්තුවට වඩා රුපියල් දශ ලක්ෂ 118 කින්ද, පහත වැටුනේ පසුව නිදහස් වූ විදුලිබල දෙපාර්තමේන්තුවෙ ලැබීම් ඇතුළත් වූ බැවිනි. එසේ වුවත්, 1969/70 දී අනෙකුත් සියලු ව්‍යවසායයන්ගෙන් ඉහල යන ලැබීම් පෙන්වූ අතර, විශේෂයෙන්ම දුම්රියෙන් රුපියල් දශ ලක්ෂ 9 ක ඉහළ යාමක් විය. 1970/71 දී වෙළඳ ව්‍යවසායයන්ගෙන් වන ලැබීම් රුපියල් දශ ලක්ෂ 19 කින් වැඩි වෙතැයි අපේක්ෂා කෙරේ. මෙම වැඩිවීම, තැපැල් හා විදුලි පණිවුඩ සේවාවලින් (රුපියල් දශ ලක්ෂ 21 ක) හා වරාය හා නැව්තොට සේවාවලින් (රුපියල් දශ ලක්ෂ 8 ක) වලින් බලාපොරොත්තු වූ, (දුම්රිය සේවාවෙන් අපේක්ෂික ලැබීම් හි (රුපියල් දශ ලක්ෂ 5 ක) පහත වැටීමකින් සමහන්ව) ඉහළ යන ලැබීම් නිසාය.

5. වෙනත් වර්තන ලැබීම්

වෙනත් විවිධ මූලයන්ගෙන් වන වර්තන ලැබීම් 1969/70 දී ඉකුත් වර්ෂයේ වූ ප්‍රමාණයට වඩා රුපියල් දශ ලක්ෂ 10 කින් වැඩි විය. ජාතික ලොතරැයි මණ්ඩලයෙන් ලද ලැබීම් රුපියල් දශ ලක්ෂ 5 කින් පහත වැටුණත්, වෙනත් විවිධ මූලයන්ගෙන් ලද රුපියල් දශ ලක්ෂ 14 ක වැඩිවූ ලැබීම්වලින් මෙම පහත වැටීම වඩාත් මකා දමීය· 1970/71 දී වෙනත් වර්තන ලැබීම් රුපියල් දශ ලක්ෂ 12 කින් ඉහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ. එයින් රුපියල් දශ ලක්ෂ 3 ක් බලාපොරොත්තු වන්නේ ජාතික ලොතරැයි මණ්ඩලයෙනි.

---

1. රජයේ සමායතනයන්ගෙන් වන දයක ගෙවුම් පිළිබඳ වැඩි විස්තර සඳහා. "1970/71 අයවැය ලේඛනය යටතේ පසුව එන කොටස් බලන්න.

2. 11 (ඊ) 3 සංඛ්‍යා සටහනෙහි දක්වෙන ලැබීම්, රජයේ ගිණුම්වල මෙම දෙපාර්තමේන්තුව යටතේ දක්වා ඇති ආදයමට වඩා වැඩිය. මෙම වෙනසට හේතු වූයේ ආපසු ගෙවුම් (ශීර්ෂ viii), පොලිය හා වාර්ෂික මුදල් යනාදිය (ශීර්ෂ *) ඇතුලත් කිරීම නිසාය.

**6. ප්‍රාග්ධන ලැබීම්**

බුදල් බද්දෙන් හා පුද්ගල බද්දෙන් (එනම් ධන හා ත්‍යාග බදු හා ඒකාබද්ධ අරමුදලෙන් වූ අත්තිකාරම පිළිබඳ ගෙවීමය) ප්‍රධාන කොට සමන්විතවන ප්‍රාග්ධන ලැබීම් ඉකුත් වර්ෂයට වඩා රුපියල් දශ ලක්ෂ 16 කින් වැඩි විණ. මෙම වැඩිවීමෙන් බොහොමයක් වෙනත් ප්‍රාග්ධන ලැබීම් නිසා විය. ඒවායින් ප්‍රධාන ශීර්ෂය වූයේ රුපියල් දශ ලක්ෂ 15 ක අත්තිකාරමක් (ඒකාබද්ධ අරමුදලෙන් සිදු කළ) පිළිබඳව විදුලි බල මණ්ඩලයෙන් කළ ආපසු ගෙවීමය. 1970/71 දී මෙම මූලයන්ගෙන් වන ආදායම රුපියල් දශ ලක්ෂ 8 කින් ඉහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ. ඒ ප්‍රධාන වශයෙන් බුදල් බදු එකතු කිරීම් (රුපියල් දශ ලක්ෂ 3 ක) හා වෙනත් ප්‍රාග්ධන ලැබීම් (රුපියල් දශ ලක්ෂ 5 ක) ඉහළ යාමේ හේතුවෙනි.

## (ඇ) වියදම

1969/70 මුදල් වර්ෂයේ මුළු වියදම රුපියල් දශ ලක්ෂ 3,886 ක්වූ අතර, එය රුපියල් දශ ලක්ෂ 3,685 ක සම්මත වියදමකින් හා රුපියල් දශ ලක්ෂ 201 ක අත්තිකාරම් ගිණුම් ගෙවීම්වලින් සමන්විත විය. ඉකුත් වර්ෂයේ මුළු වියදමට වඩා රුපියල් දශ ලක්ෂ 441 ක හෙවත් සියයට 13 ක වැඩිවීමක් පෙන්නුම් කළ මෙය, ප්‍රාග්ධන සම්මතයන් යටතේ වන වියදම්වල රුපියල් දශ ලක්ෂ 40 ක පහත වැටීමකින් තරමක් දුරට, සමහන් වන පුනරාවර්තන සම්මතයන් යටතේ එන වියදම්වල රුපියල් දශ ලක්ෂ 329 ක ඉහළ යාමකින් හා අත්තිකාරම් ගිණුම් යටතේ එන ගෙවීම්හි රුපියල් දශ ලක්ෂ 152 ක වැඩිවීමකින් සමන්විත විය. අයවැය ලේඛනයෙහි කිසිදු ප්‍රතිපාදනයක් සිදු නොකළ අත්තිකාරම් ගිණුම් යටතේ එන රුපියල් දශ ලක්ෂ 201 ක ශුද්ධ ගෙවීමක් හේතුකොට ගෙන, නියම (තාවකාලික) වියදම අයවැය ඇස්තමේන්තුවලට වඩා රුපියල් දශ ලක්ෂ 93 කින් හෙවත් සියයට 2කින් වැඩිවිය. පුනරාවර්තන සම්මතයන් යටතේ එන වියදමෙහි රුපියල් දශ ලක්ෂ 50 ක සහ ප්‍රාග්ධන සම්මතයන් යටතේ එන වියදමෙහි රුපියල් දශ ලක්ෂ 58 ක පහත බැසීම් මගින් එම වැඩිවීම තරමක් සමහන් විය.

1968/69 සිට 1970/71 මුදල් වර්ෂය දක්වා වියදම පිළිබඳ විස්තර පහත එන II (ඊ) 4 වන සංඛ්‍යා සටහනේ දක්වේ.

### II (ඊ) 4 වැනි සංඛ්‍යා සටහන

### රජයේ වියදම 1968/69 සිට 1970/71 දක්වා

රුපි. දශලක්ෂ

| ශීර්ෂ | 1968/69 | 1969/70 මුල් ඇස්තමේන්තු | 1969/70 තාවකාලික | 1970/71 මුල් ඇස්තමේන්තු |
|---|---|---|---|---|
| 1· සම්මත වියදම .. | 3,396 | 3,793 | 3,685 | 4,058 |
| 1· 1 පුනරාවර්තන වියදම* .. | 2,544 | 2,923 | 2,873 | 3,089 |
| 1· 2 ප්‍රාග්ධන වියදම* .. | 852 | 870 | 812 | 969 |
| 2· අත්තිකාරම් ගිණුම් කටයුතු .. | 49 | – | 201 | – |
| 3· මුළු වියදම .. | 3,445 | 3,793 | 3,886 | 4,058 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

* II (ඊ) 1 වන සංඛ්‍යා සටහනෙහි (ඇ) පා සටහන බලන්න.

ඉහත සංඛ්‍යා සටහන පුනරාවර්තන හා ප්‍රාග්ධන වියදම් සඳහා අයවැය ලේඛනයේදී සැකසූ ප්‍රතිපාදනය පෙන්වයි. 1969/70 මුදල් වර්ෂය තුළදී අනුමත කරන ලද පුනරාවර්තන සම්මත වෙනුවෙන් රුපියල් දශ ලක්ෂ 100 ක අතිරේක ඇස්තමේන්තු හා ප්‍රාග්ධන වියදම වෙනුවෙන් රුපියල් දශ ලක්ෂ 34 ක ඇස්තමේන්තු ගැන සලකන කල්හි පුනරාවර්තන වියදම් හා ප්‍රාග්ධන වියදම් පිළිබඳ මුළු ප්‍රතිදානය පිළිවෙලින් රුපියල් දශ ලක්ෂ 3,023 ක් හා රුපියල් දශ ලක්ෂ 904 ක් විය.

1970/71 සඳහා වූ අයවැය ලේඛනය, 1969/70 සඳහා වූ නියම (තාවකාලික) වියදමට වඩා රුපියල් දශ ලක්ෂ 172 ක හෙවත් රුපියල් දශ ලක්ෂ 4,058 ක මුළු වියදමක් සැපයේ. 1969/70 දී අදල සම්මතයන් යටතේ යන නියම (තාවකාලික) වියදමද සමග සසැඳීමේදී, 1970/71 සඳහා වූ අයවැය ප්‍රතිපාදනයන් පුනරාවර්තන සම්මතයන් යටතේ එන වියදමෙහි රුපියල් දශ ලක්ෂ 216ක හා ප්‍රාග්ධන සම්මතයන් යටතේ එන වියදමෙහි රුපියල් දශ ලක්ෂ 157 ක වැඩිවීමක් පෙන්වයි. අනෙක් අතට, 1969/70 දී රුපියල් දශ ලක්ෂ 201 ගෙවීමක් සඳහා ගණන්ගැණුනු, අත්තිකාරම් ගිණුම් කටයුතු සඳහා අයවැය ලේඛනයේදී ප්‍රතිපාදන කිසිවක් සකස් නොවීන.

II වන පරිශිෂ්ඨයේ එන 35 වෙනි සංඛ්‍යා සටහන රජයේ වියදම් පිළිබඳ ආර්ථික හා ශ්‍රිතීය වර්ගීකරණයක් දක්වයි. මෙම වර්ගීකරණයේ පදනම මත, පුනරාවර්තන වියදම රුපියල් දශ ලක්ෂ 2,850 ක්වූ අතර, ප්‍රාග්ධන වියදම රුපියල් දශ ලක්ෂ 883 ක් විය. මෙම වියදම් වර්ග 2 අත්තිකාරම් ගිණුම සමඟ එකතු කළ විට රුපියල් දශ ලක්ෂ 3,928 ක මුළු වියදමක් 1969/70 මුදල් වර්ෂය සඳහා පෙන්වයි. ඉකුත් වර්ෂයේ මුළු වියදම රුපියල් දශ ලක්ෂ 3, 573 ක්වූ අතර,එය රුපියල් දශ ලක්ෂ 2,612 ක වර්තන වියදමකින් ද, රුපියල් දශ ලක්ෂ 910 ක ප්‍රාග්ධන වියදමකින් හා අත්තිකාරම් ගිණුම් යටතේ එන රුපියල් දශ ලක්ෂ 51 කින් ද සමන්විත වේ. 1969/70 දී රුපියල් දශ ලක්ෂ 355 කින් හෙවත් සියයට 10 කින් මුළු වියදම වැඩි විය.

## 1· වර්තන වියදම

1968/69 දී රුපියල් දශ ලක්ෂ 220 ක හෙවත් සියයට 9 ක වැඩිවීමක් වාර්තාගත රජයේ වර්තන වියදම 1969/70 වර්ෂයේදී තවදුරටත් රුපියල් දශ ලක්ෂ 238 කින් නැතහොත් සියයට 9 කින් වැඩි විය. 1969/70 දී වැඩි වූ ජංගම වියදමට, රජයේ සේවකයින්ගේ වැටුප් සහ වේතන පිළිබඳ ඒකාබද්ධ කිරීම් හේතු කොටගෙන ඇති වූ අතිරේක ගෙවීම් හා රජයේ දෙපාර්තමේන්තුවල විවිහිස වියදමෙන් කොටසක් ඇතුලත් වේ. මෙය රජයේ විදුලිබල දෙපාර්තමේන්තුව සමායතනයක් බවට හැරවීම (වෙළඳ ව්‍යවසායයන්ගේ දළ ගෙවීම්වල සැලකිය යුතු වැඩිවීමක් දක්වෙන) මගින් තරමක් සමහන් විය. 1970/71 මුදල් වර්ෂයේදී වර්තන වියදමෙහි ඇස්තමේන්තු කළ වැඩිවීම රුපියල් දශ ලක්ෂ 159 ක් හෙවත් සියයට 6 ක් විය.

### පරිපාලනය

සමාලෝචිත වර්ෂයේදී, සිවිල් පරිපාලනය හා ආරක්ෂක කටයුතු පිළිබඳ වර්තන වියදම පිළිවෙලින් රුපියල් දශ ලක්ෂ 58 කින් හා රුපියල් දශ ලක්ෂ 9 කින් වැඩි විය. එය මූලික වශයෙන් රජයේ සේවකයින්ගේ වැටුප්වල හා වේතනවල ඒකාබද්ධයෙහි ප්‍රතිඵලයක් වශයෙන් වැටුප් හා වේතන ගෙවීම් වැඩිවූ නිසාය. වර්තන පරිපාලන වියදම් 1969/70 මුළු වර්තන වියදමෙහි සියයට 14 ක පමණ ප්‍රමාණයක් සඳහා ගණන් ගැණින. 1970/71 දී පරිපාලනය මත වර්තන වියදම තව දුරටත් රුපියල් දශ ලක්ෂ 19 කින් වැඩි වේ යැයි අපේක්ෂා කෙරේ.

### සමාජ සේවා

1969/70 දී සමාජ සේවා පිළිබඳ වර්තන වියදම රුපියල් දශ ලක්ෂ 90 කින් හෙවත් සියයට 14 කින් වැඩි විය. මෙම වැඩිවීම අධ්‍යාපනය පිළිබඳ වූ රුපියල් දශ ලක්ෂ 62 ක වැඩිවීමකින් ද, සෞඛ්‍ය කටයුතු පිළිබඳ රුපියල් දශ ලක්ෂ 26 ක වැඩිවීමකින් ද, අනෙකුත් සමාජ සේවා පිළිබඳව වූ රුපියල් දශ ලක්ෂ 3 ක වැඩිවීමකින්ද සමන්විත විය. සමාජ සේවා පිළිබඳ වර්තන වියදම රජයේ මුළු වර්තන වියදමෙන් ¼ ක් පමණ වේ. 1970/71 දී තවදුරටත් රුපියල් දශ ලක්ෂ 19 කින් හෙවත් සියයට 3 කින් සමාජ සේවා පිළිබඳ වර්තන වියදම් වැඩිවීමට අපේක්ෂිතය.

## II (ඊ) 5 වැනි සංඛ්‍යා සටහන

## 1967/68 සිට 1970/71 දක්වා රජයේ වර්තන වියදම්*

| ශීර්ෂය | 1967/68 | | 1968/69 | | 1969/70 මුල් | | 1969/70 තාවකාලික | | 1970/71 මුල් | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | මුදලය රුපියල් දශ ලක්ෂ | ප්‍රතිශතය | මුදලය රුපියල් දශ ලක්ෂ | ප්‍රතිශතය | මුදලය රුපියල් දශ ලක්ෂ | ප්‍රතිශතය | මුදලය රුපියල් දශ ලක්ෂ | ප්‍රතිශතය | මුදලය රුපියල් දශ ලක්ෂ | ප්‍රතිශතය |
| **1· පරිපාලනය** | **331·9** | **13·9** | **343·2** | **13·1** | **421·0** | **14·3** | **410·4** | **14·4** | **429·6** | **14·3** |
| 1·1 සිවිල් .. | 255·5 | 10·7 | 260·5 | 10·0 | 328·8 | 11·2 | 318·4 | 11·2 | 332·6 | 11·1 |
| 1·2 ආරක්ෂක .. | 76·4 | 3·2 | 82·7 | 3·1 | 92·2 | 3·1 | 92 0 | 3·2 | 97·0 | 3·2 |
| **2- සමාජසේවා කටයුතු ..** | **596·8** | **24·9** | **642·9** | **24·6** | **723·3** | **24·6** | **732·9** | **25·7** | **752·1** | **25·0** |
| 2·1 අධ්‍යාපනය .. | 377·1 | 15·8 | 410·6 | 15·7 | 464·4 | 15·8 | 472·4 | 16·6 | 484·6 | 16·1 |
| 2·2 සෞඛ්‍යය .. | 196·1 | 8·2 | 210·0 | 8·0 | 233·0 | 7·9 | 235·7 | 8·3 | 240·1 | 8·0 |
| 2·3 වෙනත් .. | 23·6 | 1·0 | 22·3 | 0·9 | 25·9 | 0·9 | 24·8 | 0·9 | 27·4 | 0·9 |
| **3· ආර්ථික සේවා කටයුතු ..** | **109·0** | **4·6** | **120·1** | **4·6** | **140·7** | **4·8** | **130·3** | **4·6** | **161·0** | **5·4** |
| 3·1 කෘෂිකර්මය සහ වාරිමාර්ග | 51·8 | 2·2 | 57·0 | 2·2 | 70·6 | 2·4 | 66·5 | 2·3 | 78·4 | 2·6 |
| 3· පළිඛුඩ භුවමාරු .. | 24·1 | 1·0 | 26·5 | 1·0 | 29·0 | 1·0 | 24·2 | 0·9 | 31·7 | 1·1 |
| 3·3 වෙනත් .. | 33·1 | 1·4 | 36·6 | 1·4 | 41·1 | 1·4 | 39·6 | 1·4 | 50·9 | 1·7 |
| **4· වෙළෙඳ ව්‍යවසායයන්ගේ දළ ගෙවීම් ..** | **288·1** | **12·0** | **301·0** | **11·5** | **326·7** | **11·1** | **249·9** | **8·8** | **250·0** | **8·3** |
| **5· අන්තර් දෙපාර්තමේන්තුමය ගෙවීම් ..** | **3·9** | **0·2** | **4·0** | **0·2** | **4·0** | **0·1** | **4·3** | **0·2** | **4·5** | **0·2** |
| **6· සංක්‍රාම ගෙවීම් ..** | **1062·7** | **44·4** | **1201·1** | **46·0** | **1310·2** | **44·5** | **1281·9** | **45·0** | **1372·6** | **45·6** |
| 6·1 පිහිටාධාර .. | 610·3 | 25·5 | 668·8 | 25·6 | 670·5 | 22·8 | 647·6 | 22·7 | 665·6 | 22·1 |
| ඉන් ආහාර පිහිටාධාරය | (578.7) | (24.2) | (620.4 | (23.7) | (621·5) | (21.1) | (599.1) | (21.0) | (614.4) | (20·4) |
| 6·2 රාජ්‍ය ණය පොළී .. | 166·5 | 7·0 | 206·2 | 7·9 | 262·5 | 8·9 | 253·3 | 8·9 | 309·0 | 10·3 |
| 6·3 විශ්‍රාම වැටුප් .. | 154·9 | 6·5 | 161·1 | 6·2 | 168·9 | 5·7 | 182·9 | 6·4 | 186·5 | 6·2 |
| 6·4 වෙනත් පෞද්ගලික ජංගම ගිනුම් වලට .. | 44·0 | 1·8 | 40·4 | 1·5 | 57·3 | 1·9 | 63·1 | 2·2 | 59·3 | 2·0 |
| 6·5 ප්‍රාදේශීය බලමණ්ඩලයන්ට .. | 52·5 | 2·2 | 61·9 | 2·4 | 69·5 | 2·4 | 58·9 | 2·1 | 60·8 | 2·0 |
| 6·6 වෙනත් .. | 34·5 | 1·4 | 62·7 | 2·4 | 81·5 | 2·8 | 76·1 | 2·7 | 91·4 | 3·0 |
| **7· මුළු ගණන ..** | **2392·4** | **100·0** | **2612·3** | **100·0** | **2942·7†** | **100·0** | **2849·8†** | **100·0** | **3009·3†** | **100·0** |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව·

* II පරිශිෂ්ටයෙහි 35 (අ) සංඛ්‍යා සටහනට වූ පා සටහන් බලන්න.

† 1969/70 (මුල්) ඇස්තමේන්තු සඳහා රුපියල් දශ ලක්ෂ 16·8 ක්ද, 1969/70 ඇස්තමේන්තු (තාවකාලික) සඳහා රුපියල් දශලක්ෂ 40 ක හා 1970/71 සඳහා රුපියල් දශ ලක්ෂ 39·5 ක ද වෙන් කළ නොහැකි වූ වි·වි·හි·ස· වියදම අතුළත් වෙයි.

### ආර්ථික සේවා

1969/70 දී ආර්ථික සේවා පිළිබඳ වර්තන වියදම, ඉකුත් වර්ෂයේ පැවති ප්‍රමාණයට වඩා රුපියල් දශ ලක්ෂ 10 ක හෙවත් සියයට 8 ක වැඩිවීමක් වාර්තාගත කරමින් රුපියල් දශ ලක්ෂ 130 ක් විය. වැඩිවුණ වර්තන වියදමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ, කෘෂිකාර්මික හා වාරිමාර්ග කටයුතු පිළිබඳ වියදම්වල රුපියල් දශ ලක්ෂ 9 ක වැඩිවීමක් නිසාය. ආර්ථික සේවා මත කෙරෙන වියදම මුළු වර්තන වියදමෙන් සියයට 5 ක් පමණවේ. 1970/71 දී ආර්ථික සේවා පිළිබඳ වර්තන වියදම රුපියල් දශ ලක්ෂ 31 කින් නැතහොත් සියයට 24 කින් ඉහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ.

### වෙළඳ ව්‍යවසායයන්ගේ දළ ගෙවීම්

රජයේ වෙළඳ ව්‍යවසායයන් මගින් වන ගෙවීම් 1968/69 දී රුපියල් දශ ලක්ෂ 301 සිට 1969/70 දී රුපියල් දශ ලක්ෂ 250 දක්වා සැළකිය යුතු ලෙස පහත වැටිණ. මෙය ප්‍රධාන වශයෙන් සිදු වූයේ රජයේ ගිණුම්වලින් එහි ගෙවීම් ඉවත් කිරීම සඳහා හේතුවූ රජයේ විදුලිබල දෙපාර්තමේන්තුව යළි ව්‍යවස්ථාපිත කිරීමෙන් සමායතනයන් යටතට ගෙන ඒමෙනි. 1970/71 දී ද, රජයේ වෙළඳ ව්‍යවසායයන්ගේ ගෙවීම් රුපියල් දශ ලක්ෂ 250 ක් පමණ වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

### වර්තන සංක්‍රාම

1969/70 දී වර්තන සංක්‍රාම රුපියල් දශ ලක්ෂ 81 කින් නැතහොත් 7% කින් වැඩි වූ අතර, එය පොලී ගෙවීම පිළිබඳව වූ රුපියල් දශ ලක්ෂ 47 ක වැඩිවීමකින්ද විශ්‍රාම වැටුප් පිළිබඳ රුපියල් දශ ලක්ෂ 22 ක වැඩිවීමකින්ද ගෘහීය අංශයට කළ සංක්‍රාම පිළිබඳ රුපියල් දශ ලක්ෂ 23 ක වැඩිවීමකින්ද 'අනෙකුත්' සංක්‍රාම යටතේ වන රුපියල් දශ ලක්ෂ 13 ක වැඩිවීමකින්ද සමන්විත විය. මෙම වැඩිවීම්වලින් තරමක් සහල් සහනාධාරය පිළිබඳ රුපියල් දශ ලක්ෂ 21 ක අඩුවීමකින්ද,[1] පළාත්පාලන ආයතන කළ සංක්‍රාමයන්ගේ රුපියල් දශ ලක්ෂ 3 ක වැඩිවීමකින් ද සමහන් වුනි. පසුගිය අවුරුදු කිහිපය තුළ මෙන්ම, මුළු වර්තන ගෙවුම්වලින් වර්තන සංක්‍රාම සියයට 45 ක් පමණ විය. 1970/71 දී තවදුරටත් වර්තන සංක්‍රාම රුපියල් දශ ලක්ෂ 91 ක් නැතහොත් 7% කින් වැඩිවේයයි අපේක්ෂා කෙරෙන අතර, එයට ප්‍රධාන වශයෙන් හේතු වන්නේ සහනාධාරයන්හි රුපියල් දශ ලක්ෂ 18 ක වැඩිවීමක්, පොළී ගෙවීම් පිළිබඳව රුපියල් දශ ලක්ෂ 56 ක වැඩිවීමක් හා අනෙකුත් සංක්‍රාම මත රුපියල් දශ ලක්ෂ 15 ක වැඩිවීමක්ය.

### 2. ප්‍රාග්ධන වියදම

II (ඊ) 6 වැනි සංඛ්‍යා සටහනින් දැක්වෙන පරිදි 1969/70 දී රජයේ ප්‍රාග්ධන වියදම රුපියල් දශ ලක්ෂ 27 ක හෙවත් සියයට 3 ක අඩුවීමක් පෙන්වමින් රුපියල් දශ ලක්ෂ 883 ක් විය. විදුලි දෙපාර්තමේන්තුමේ ප්‍රාග්ධන වියදමින් විශාල කොටසක් (ඉහත දැක්වූ හේතු නිසා) මුළු ප්‍රාග්ධන වියදමට ඇතුලත් නොවූ නමුත්, ප්‍රාග්ධන වියදම හා සම්බන්ධ වි.වි.හි.ස. ගෙවීම් ඊට ඇතුලත් වේ. එහි ප්‍රතිඵලයක් වශයෙන්, 1969/70 දී මුළු ප්‍රාග්ධන වියදම ආශ්‍රිත දත්තයන් ඊට පෙර මුදල් වර්ෂවල එම දත්තයන් හා නොසැසඳේ. කෙසේ වූවත්, ඉහත දැක්වූ සාධක දෙකට ඉඩ හැරි විට, 1969/70 දී ප්‍රාග්ධන වියදම ඉකුත් පස් අවුරුද්ද තුල සියයට 14 ක වර්ධණ අනුපාතිකයට (සංයුක්ත) ප්‍රතිවිරුද්ධව පහත බැසීමක් පෙන්විය.

1969/70 දී ප්‍රාග්ධන වියදම රුපියල් දශ ලක්ෂ 518 ක් (සියයට 59 ක්) රජයේ දෙපාර්තමේන්තුවල ප්‍රාග්ධන වියදමින් ද, රුපියල් දශ ලක්ෂ 320 ක් (සියයට 36 ක්) ප්‍රාග්ධන සංක්‍රාමවලින්ද, රුපියල් දශ ලක්ෂ 46 ක් (සියයට 5 ක්) මූල්‍ය වත්කම් ලබා ගැනීමෙන් ද සමන්විත විය. ඉකුත් වර්ෂයේදී, ඊට අනුරූප දත්තයන් නම්, පිළිවෙලින් රුපියල් දශ ලක්ෂ 556 (සියයට 58), රුපියල් දශ ලක්ෂ 332 (සියයට 37) සහ රුපියල් දශ ලක්ෂ 51

---

1. වැඩි විස්තර සඳහා, 'ශුද්ධ ආහාර පිහිටාධාරය' පිළිබඳව පසුව එන කොටස සහ II (ඊ) 7 වැනි සංඛ්‍යා සටහන බලන්න.

## II (ඊ) 6 වැනි සංඛ්‍යා සටහන

## 1967/68 - 1970/71 - රජයේ ප්‍රාග්ධන වියදම්*

| ශීර්ෂ | 1967/68 | | 1968/69 | | 1969/70 මුල් ඇස්තමේන්තු | | 1969/70 තාවකාලික | | 1970/71 මුල් ඇස්තමේන්තු | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ප්‍රමාණය රු. දශලක්ෂ | ප්‍රතිශතය | ප්‍රමාණය රු. දශලක්ෂ | ප්‍රතිශතය | ප්‍රමාණය රු. දශලක්ෂ | ප්‍රතිශතය | ප්‍රමාණය රු. දශලක්ෂ | ප්‍රතිශතය | ප්‍රමාණය රු. දශලක්ෂ | ප්‍රතිශතය |
| 1. මූර්ත වත්කම් ලබාගැනීම සහ නඩත්තු කිරීම | 493.9 | 62.6 | 526.2 | 57.8 | 750.6† | 69.5 | 518.0 | 58.7 | 784.5† | 65.7 |
| 1.1 සිවිල් පාලන කටයුතු | 13.1 | 1.7 | 16.7 | 1.8 | 24.1 | 2.2 | 19.4 | 2.2 | 18.8 | 1.6 |
| 1.2 සමාජයීය සේවා .. | 93.8 | 11.9 | 112.9 | 12.4 | 140.6 | 13.0 | 120.6 | 13.7 | 202.6 | 17.0 |
| 1.2.1 අධ්‍යාපනය .. | 33.1 | 4.2 | 31.6 | 3.5 | 52.1 | 4.8 | 40.1 | 4.5 | 68.2 | 5.7 |
| 1.2.2 සෞඛ්‍ය .. | 24.5 | 3.1 | 37.5 | 4.1 | 41.8 | 3.9 | 38.0 | 4.3 | 47.3 | 4.0 |
| 1.2.3 නිවාස .. | 30.6 | 3.9 | 35.8 | 3.9 | 36.1 | 3.3 | 34.1 | 3.9 | 50.0 | 4.2 |
| 1.2.4 අනෙකුත් .. | 5.6 | 0.7 | 8.0 | 0.8 | 10.6 | 1.0 | 8.4 | 1.0 | 37.1 | 3.1 |
| 1.3 ආර්ථික සේවා .. | 387.0 | 49.0 | 396.6 | 43.6 | 552.2 | 51.1 | 378.0 | 42.8 | 548.8 | 45.9 |
| 1.3.1 කෘෂිකර්මය සහ වාරිමාර්ග .. | 140.0 | 17.7 | 168.1 | 18.5 | 227.5 | 21.0 | 172.8 | 19.6 | 250.8 | 21.0 |
| 1.3.2 ධීවර කර්මාන්තය . | 0.1 | ... | 0.1 | ... | 2.3 | 0.2 | 1.0 | 0.1 | 18.3 | 1.5 |
| 1.3.3 නිෂ්පාදනය සහ පතල් කටයුතු . | 24.2 | 3.1 | 5.0 | 0.5 | 10.8 | 1.0 | 8.8 | 1.0 | 16.6 | 1.4 |
| 1.3.4 වෙළඳාම .. | 3.4 | 0.4 | 13.9 | 1.5 | 9.0 | 0.8 | 7.0 | 0.8 | 34.2 | 2.9 |
| 1.3.5 පණිවුඩ හුවමාරුව .. | 154.9 | 19.6 | 170.0 | 18.7 | 242.2 | 22.4 | 185.1 | 21.0 | 228.9 | 19.2 |
| 1.3.6 බලය .. | 64.4 | 8.2 | 39.5 | 4.3 | 60.4 | 5.6 | 3.3 | 0.4 | — | — |
| 2. ප්‍රාග්ධන සංක්‍රාම .. | 267.9 | 33.9 | 332.4 | 36.5 | 296.9 | 27.5 | 319.5 | 36.2 | 357.7 | 29.9 |
| 2.1 පළාත් පාලන ආයතන | 13.0 | 1.6 | 14.0 | 1.5 | 14.1 | 1.3 | 15.5 | 1.8 | 15.5 | 1.3 |
| 2.2 පොදු සමායතන .. | 210.1 | 26.6 | 285 6 | 31.4 | 259.2 | 24.0 | 282.8 | 32.0 | 317.0 | 26.5 |
| 2.2.1 කෘෂිකර්මය සහ වාරිමාර්ග .. | 70.9 | 9.0 | 70.0 | 7.7 | 70.8 | 6.6 | 77.2 | 8.7 | 161.1 | 13.5 |
| 2.2.2 ධීවර .. | 15.6 | 2.0 | 16.7 | 1.8 | 14.9 | 1.4 | 14.1 | 1.6 | 11.0 | 0.9 |
| 2.2.3 නිෂ්පාදනය සහ පතල් කටයුතු . | 106.1 | 13.4 | 182.8 | 20.1 | 158.1 | 14.6 | 175.5 | 19.9 | 116.9 | 9.8 |
| 2.2.4 අනෙකුත් .. | 17.5 | 2.2 | 16.2 | 1.8 | 15.4 | 1.4 | 16.0 | 1.8 | 28.0 | 2.3 |
| 2.3 අනෙකුත් .. | 44.8 | 5.7 | 32.8 | 3.6 | 23.6 | 2.2 | 21 2 | 2.4 | 25.2 | 2.1 |
| 3. මූල්‍ය වත්කම් ලබාගැනීම | 27.4 | 3.5 | 51.2 | 5.6 | 32.3 | 3.0 | 45.6 | 5.2 | 52.3 | 4.4 |
| 4. මුළු ගණන .. | 789.2 | 100.0 | 909.8 | 100.0 | 1079.8 | 100.0 | 883.1 | 100.0 | 1194.5 | 100.0 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

* II පරිශිෂ්ඨයේ 35 වෙනි සංඛ්‍යා සටහනෙහි පා සටහන් බලන්න.

† විභජනය නොකළ විවිධ වියදම, සංරචක ශීර්ෂයන්ට ඇතුලත්ව ඇති නිසා එම ශීර්ෂයන්ගේ එකතුව මෙහි උප එකතුවට ගැලපෙන්නේ නැත. II පරිශිෂ්ඨයෙහි 35 වෙනි සංඛ්‍යා සටහනෙහි (ඇ) පා සටහන බලන්න.

(සියයට 6) වේ. 1969/70 දී ප්‍රාග්ධන වියදමෙහිවූ රුපියල් දශ ලක්ෂ 27 ක අඩුවීම රජයේ දෙපාර්තමේන්තුවල ප්‍රාග්ධන වියදම්හි රුපියල් දශ ලක්ෂ 8 ක අඩුවීමකින්ද, ප්‍රාග්ධන සංක්‍රාමයන්හි රුපියල් දශ ලක්ෂ 13 ක අඩුවීමකින්සහ මූල්‍ය වත්කම් ලබා ගැනීමෙහි රුපියල් දශ ලක්ෂ 6 ක අඩුවීමකින් ද සමන්විත විය. ඉකුත් මුදල් වර්ෂයේදී ප්‍රාග්ධන වියදමෙහිවූ රුපියල් දශ ලක්ෂ 121 ක වැඩිවීම රජයේ දෙපාර්තමේන්තුවල ප්‍රාග්ධන වියදමෙහි රුපියල් දශ ලක්ෂ 32 ක වැඩිවීමකින් ද, ප්‍රාග්ධන සංක්‍රාමයන්හි රුපියල් දශ ලක්ෂ 65 ක වැඩිවීමකින් සහ මූල්‍ය වත්කම් ලබා ගැනීමෙහි රුපියල් දශ ලක්ෂ 24 ක වැඩිවීමකින් ද සමන්විත වුනි.

1970/71 දී දළ ප්‍රාග්ධන වියදම රුපියල් දශ ලක්ෂ 1,195 ක්වේ යයි ද, එය රජයේ දෙපාර්තමේන්තුවල රුපියල් දශ ලක්ෂ 785 ප්‍රාග්ධන වියදමින් ද, ප්‍රාග්ධන සංක්‍රාමයන්හි රුපියල් දශ ලක්ෂ 358 කින් සහ මූල්‍ය වත්කම් ලබා ගැනීමෙන් රුපියල් දශ ලක්ෂ 52 කින් ද සමන්විත වේ යයි අපේක්ෂා කෙරේ. මෙලෙසට, රජයේ දෙපාර්තමේන්තුවල ප්‍රාග්ධන වියදම් 1969/70 දීට වඩා රුපියල් දශ ලක්ෂ 267 කින් වැඩි වේ යයි අපේක්ෂා කෙරේ. ප්‍රාග්ධන සංක්‍රාම සහ මූල්‍ය වත්කම් අත්කර ගැනීමද 1970/71 දී පිළිවෙලින් රුපියල් දශ ලක්ෂ 38 කින් සහ රුපියල් දශ ලක්ෂ 7 කින් වැඩිවේ යයි අපේක්ෂා කෙරේ.

රජයේ දෙපාර්තමේන්තුවල ප්‍රාග්ධන වියදම්

සමාලෝචිත වර්ෂයේදී, රජයේ දෙපාර්තමේන්තුවල ප්‍රාග්ධන වියදම ඉකුත් වර්ෂයට වඩා රුපියල් දශ ලක්ෂ 8කින් නැතහොත් සියයට 2 කින් අඩු වී රුපියල් දශ ලක්ෂ 518 ක් විය. මෙම බැසීමට ප්‍රධාන හේතුව වූයේ ආර්ථික සේවා පිළිබඳ වියදමෙහි රුපියල් දශ ලක්ෂ 19 ක අඩුවීමකි. මෙම අඩුවීම සිවිල් පරිපාලනය පිළිබඳ රුපියල් දශ ලක්ෂ 3 ක සහ සමාජ සේවාවන්හි රුපියල් දශ ලක්ෂ 8 ක වැඩිවීම් මගින් තරමක් සමහන්ව ඇත. ආර්ථික සේවා සඳහා වූ වියදම්වල පහල බැසීමට ප්‍රධාන හේතුව වූයේ (විදුලිබල දෙපාර්තමේන්තුව, මණ්ඩලයක් බවට හැරවීම ඊට හේතුව ලෙස කලින් දැක්වූ) බලය පිළිබඳව රුපියල් දශ ලක්ෂ 36 ක සහ වෙළඳාම පිළිබඳව රුපියල් දශ ලක්ෂ 7 ක බැසීම වූ අතර, එය කෘෂිකර්මය සහ වාරිමාර්ග පිළිබඳව රුපියල් දශ ලක්ෂ 5 ක, නිෂ්පාදනය සහ පතල් කටයුතු පිළිබඳව රුපියල් දශ ලක්ෂ 4 ක සහ පණිවුඩ හුවමාරුව පිළිබඳව රුපියල් දශ ලක්ෂ 15 ක නැගීම මගින් තරමක් සමහන් විය. සමාජ සේවා පිළිබඳව රුපියල් දශ ලක්ෂ 8 ක නැගීම අධ්‍යාපනය පිළිබඳව රුපියල් දශ ලක්ෂ 9 ක සහ සෞඛ්‍යය පිළිබඳව රුපියල් දශ ලක්ෂ 1 ක නැගීම් වලින් සමන්විත වූ අතර, නිවාස පිළිබඳව රුපියල් දශ ලක්ෂ 2 ක බැසීමකින් එය තරමක් සමහන් විය.

1970/71 දී රජයේ දෙපාර්තමේන්තුවල ප්‍රාග්ධන වියදම රුපියල් දශ ලක්ෂ 785 ක් වේ යයි අපේක්ෂා කරන අතර, එය සිවිල් පාලනය පිළිබඳව රුපියල් දශ ලක්ෂ 19 කින් සමාජ සේවා පිළිබඳව රුපියල් දශ ලක්ෂ 203 කින් සහ ආර්ථික සේවා පිළිබඳව රුපියල් දශ ලක්ෂ 545 කින් සංයුක්ත වේ. රජයේ දෙපාර්තමේන්තුවල ප්‍රාග්ධන වියදම ප්‍රධාන වශයෙන් සමාජ සේවා පිළිබඳව රුපියල් දශ ලක්ෂ 82 ක සහ ආර්ථික සේවා පිළිබඳව රුපියල් දශ ලක්ෂ 171 ක වැඩිවීම්වලින් සමන්විතව, 1969/70 වර්ෂයට වඩා රුපියල් දශ ලක්ෂ 267 කින් වැඩි වේ යයි අපේක්ෂිතය. රජයේ දෙපාර්තමේන්තුවල ප්‍රාග්ධන වියදමේ වැඩිවීමෙහි වැඩි කොටසකට හේතු වී ඇත්තේ සේවා නියුක්ති වැඩ පිළිවෙල යටතේ රුපියල් දශ ලක්ෂ 200 ක් වෙන්කිරීම නිසාය. අධ්‍යාපනය සඳහා රුපියල් දශලක්ෂ 28, සෞඛ්‍යය සඳහා රුපියල් දශ ලක්ෂ 9, නිවාස සඳහා රුපියල් දශ ලක්ෂ 16 සහ ආර්ථික සේවා සඳහා රුපියල් දශ ලක්ෂ 29 යන අධික වෙන් කිරීම් ආරක්ෂක කටයුතු පිළිබඳ ප්‍රාග්ධන වියදමෙහි වැඩිවීමට හේතු වී ඇත. ආරක්ෂක කටයුතු පිළිබඳ වියදමෙහි රුපියල් දශ ලක්ෂ 171 ක් වූ වැඩිවීම කෘෂිකර්ම සහ වාරිමාර්ග සඳහා රුපියල් දශ ලක්ෂ 78 කින් ද, ධීවර කර්මාන්තය සඳහා රුපියල් දශ ලක්ෂ 17 කින් ද, නිෂ්පාදනය සහ පතල් කටයුතු සඳහා රුපියල් දශ ලක්ෂ 8 කින්ද, වෙළඳාම සඳහා වූ රුපියල් දශ ලක්ෂ 27 ක් සහ පණිවුඩ හුවමාරුව සඳහා රුපියල් දශ ලක්ෂ 44 කින් ද සමන්විත වේ. මෙය බලය සඳහා රුපියල් දශලක්ෂ 3 ක අඩුවීමකින් තරමක් සමහන් විය.

**ප්‍රාග්ධන සංක්‍රාම (පැවරුම්)**

1969/70 දී රජයේ ප්‍රාග්ධන සංක්‍රාම රුපියල් දශ ලක්ෂ 320 ක් වූ අතර, එය 1968/69 ට වඩා රුපියල් දශ ලක්ෂ 13 කින් පහළ විය. ඉකුත් වර්ෂයේදී මෙන්ම, මුළු ප්‍රාග්ධන සංක්‍රාම වලින් (රුපියල් දශ ලක්ෂ 283 නැතහොත් සියයට 89) වැඩි කොටසක් පොදු සමායතනවලට ලැබුන අතර, පළාත්පාලන ආයතන සහ 'අනෙකුත්' යන ශීර්ෂයන් සඳහා පිළිවෙලින් රුපියල් දශ ලක්ෂ 16 ක් සහ රුපියල් දශ ලක්ෂ 25 ක් ලැබුණි. 1970/71 දී ප්‍රාග්ධන සංක්‍රාම වශයෙන් රුපියල් දශ ලක්ෂ 358 ක් අපේක්ෂා කරන අතර, ඉන් පොදු සමායතන සඳහා පැවරිය යුතු කොටස රුපියල් දශ ලක්ෂ 317 ක් නැතහොත් සියයට 89 කි.

කර්මාන්ත අංශයෙහි සමායතනවලට ප්‍රාග්ධන සංක්‍රාම මුළු ප්‍රාග්ධන සංක්‍රාම ප්‍රමාණයෙන් සියයට 62 ක් වන අතර, 1969/70 දී එහි වූ ප්‍රමාණයට වඩා රුපියල් දශ ලක්ෂ 7 කින් අඩු වී ඇත. මෙම අඩුවීමට ප්‍රධාන හේතුව ජාතික පේෂ කර්මාන්ත සංස්ථාවේ (තුල්හිරිය යෝජනා ක්‍රමය) ප්‍රාග්ධනය සඳහා දයක ගෙවීම් රුපියල් දශ ලක්ෂ 64 කින් අඩු වීමයි. එම අඩුවීම සමායතන කිහිපයක් සඳහා-ඉන් ප්‍රධාන ඒවා නම්, නැගෙනහිර කඩදසි කර්මාන්ත සංයුක්ත මණ්ඩලය (රුපියල් දශ ලක්ෂ 21) සහ ලංකා තුනී ලැලි සංයුක්ත මණ්ඩලය (රුපියල් දශ ලක්ෂ 18) කරන දයක ගෙවීම් ඉහළ යාම් මගින් තරමක් දුරට සමහන් විය. 1970/71 දී කෘෂිකාර්මික අංශයෙහි සමායතනවලට ප්‍රාග්ධන පැවරුම් රුපියල් දශ ලක්ෂ 84 ක සැලකිය යුතු වැඩීමක් පෙන්වන අතර, කාර්මික සමායතන සඳහා ප්‍රාග්ධන පැවරුම් රුපියල් දශ ලක්ෂ 59 කින් අඩුවේ යයි ඇස්තමේන්තු කර ඇත. කෘෂිකාර්මික සමායතන පිළිබඳ වැඩිවීමට අළුතින් පිහිට වූ මහවැලි සංවර්ධන මණ්ඩලයට ප්‍රදනය කරන ලද විභජනයන් ද, කර්මාන්ත සමායතන පිළිබඳ අඩුවීමට ජාතික පේෂ කර්මාන්ත සංස්ථාව (තුල්හිරිය යෝජනා ක්‍රමය) දෙනු ලබන දීමනාවන්හි අඩුවීමද හේතු වී ඇත.

**මූල්‍ය වත්කම් ලබා ගැනීම**

1969/70 දී මූල්‍ය වත්කම් ලබා ගැනීම සඳහා රජය දැරූ වියදම රුපියල් දශ ලක්ෂ 46 ක් වූ අතර, ජාතික නිවාස අරමුදලට රුපියල් දශ ලක්ෂ 25, දේශීය ණය සහ සංවර්ධන අරමුදලට රුපියල් දශ ලක්ෂ 8 හා සීමාසහිත හෝටල් සේවා (ලංකා) හි ප්‍රාග්ධනයට රුපියල් දශ ලක්ෂ 6 ක් වූ දයක දීමනා ද යන මේවා එහි අන්තර්ගත ප්‍රධාන ශීර්ෂයන් විය. 1970/71 මුදල් වර්ෂයේදී රජය මගින් මූල්‍ය වත්කම් ලබා ගැනීම රුපියල් දශ ලක්ෂ 52, ක් වේ යයි අපේක්ෂා කරන අතර, ජාතික නිවාස අරමුදලට රුපියල් දශ ලක්ෂ 20, දේශීය ණය සහ සංවර්ධන අරමුදලට රුපියල් දශ ලක්ෂ 10 සහ සේවා නියුක්ති වැඩ පිළිවෙල යටතේ ස්වයං-සේවා නියුක්තිය සඳහා ණය ප්‍රදනය කිරීමට රුපියල් දශ ලක්ෂ 8 ක විභජනයක් යන මේවායින් එය සමන්විත වේ.

## (ඇ) ශුද්ධ ආහාර පිහිටාධාරය

රජයේ ශුද්ධ ආහාර පිහිටාධාරය, සහල් සලාක නිකුතුව හා සහල් හා රතු ළූණු නිෂ්පාදකයින්ට සහතික මිලක් ගෙවීමෙන් දෙනු ලබන නිෂ්පාදන පිහිටාධාරය සඳහා, සීනි හා පිටි අලෙවිය හා අනෙකුත් ආනයන ද්‍රව්‍ය කිහිපයක් ආනයන කිරීම නියා වන ලාභ කැප කරනු ලැබූ ශුද්ධ ගෙවීම්වලින් සමන්විත වෙයි. අනෙකුත් සමහර භාණ්ඩ අලෙවි කිරීමෙන් හා ආනයන කිරීමෙන් වන ලාභ/අලාභයන්ට උම්බලකඩ, පරිප්පු ආදි ද්‍රව්‍ය සැළකෙන අතර, ඉහත කී භාණ්ඩ සම්බන්ධයෙන් වන බෙදා හැරීමේ ගාස්තු හා වෙනත් අයකිරීම් සහ සහල් සහනාධාර බද්ද ආදියද, ශුද්ධ පිහිටාධාරය[1] ගණන් ගැනීමේදී සැළකිල්ලට භාජනය වේ.

1969/70 හා 1970/71 මුල් ඇස්තමේන්තු සමග වන පසුගිය තෙවසර තුළ වූ ශුද්ධ සහල් සහනාධාරය පිළිබඳ විස්තර II (ඊ) 7 වෙනි සංඛ්‍යා සටහනෙහි දක්වෙයි.

---

1 1967/68 වර්ෂයේ පටන් අමතර ශීර්ෂයක් එනම්; සමුපකාර සමාගම් විසින් නිකුත් කළ ණය ආපසු ගෙවීම් වෙනුවට ආපසු භාරගත් සහල් සලාක කූපන්වල අගය වෙනමම දක්වේ

## II (ඊ) 7 වැනි සංඛ්‍යා සටහන

## 1967/68 සිට 1969/70 ශුද්ධ ආහාර පිහිටාධාරය

රුපියල් දශලක්ෂ

| ශීර්ෂ | 1967/68 | 1968/69 | 1969/70 මුල් ඇස්තමේන්තු | 1969/70 (තාවකාලික) | 1970/71 මුල් ඇස්තමේන්තු |
|---|---|---|---|---|---|
| 1. ආනයන යකළ සහල් වෙනුවෙන් පාරිභෝගිකයයාට දෙන ලද පිහිටාධාරය .. | 279.9 | 276.1 | 237.2 | 263.9 | 524.8අ (1 හා 2) |
| 2. මෙරට නිපදවූ සහල් වෙනුවෙන් නිෂ්පාදකයාට සහ පාරිභෝගිකයාට දුන් සහනාධාරය .. | 250.3 | 269.2 | 319.6 | 252.5 | |
| 3. මෙරට නිපදවූ රතුළුණු වෙනුවෙන් පිහිටාධාරය | 6.8 | 6.8 | 8.0 | 8.0 | 8.5 |
| 4. බෙදහැරීමේ වියදම් සහ අනිකුත් ගාස්තු .. | 37.2 | 51.8 | 48.5 | 61.1 | 79.9 |
| 5. වෙනත් භාණ්ඩ අලෙවි කිරීමෙන් වූ අලාභ .. | 4.1 | 5.4 | 8.2 | 3.6 | 1.2 |
| 6. ණය ගෙවීම් වෙනුවට සමූපකාර සමාගම් විසින් ආපසු ලබාගත් සහල් සලාක කූපන්වල වටිනාකම .. | 0.4 | 11.1 | — | 10.0 | — |
| 7. මුළු දළ පිහිටාධාරය (1 සිට 6) .. | 578.7 | 620.4 | 621.5 | 599.1 | 614.4 |
| 8. සීනි අලෙවියෙන් ලාභ .. | 239.5 | 254.6 | 210.6 | 222.6 | 120.1ඇ |
| 9. පිටි අලෙවියෙන් ලාභ .. | 41.0 | 33.9 | 49.1ඈ | 33.0 | 32.2 |
| 10. සහල් සහනාධාර බද්ද .. | 1.9 | 3.1 | 2.0 | 3.5 | 3.0 |
| 11. මුළු ගණන (8 – 10) .. | 282.4 | 291.6 | 261.7 | 259.1 | 155.3 |
| 12. ශුඩ ආහාර පිහිටාධාරය (8–10) .. | 296.3 | 328.8 | 359.8 | 340.0 | 459.1 |

මූලය: ආහාර කොමසාරිස්.

(අ) පළමු හා දෙවන සේරුව යටතේ නිකුත් කළ ප්‍රමාණයන්හි (ආයාත කළ හා මෙරට සහල්) විශ්වාසදායක ඇස්තමේන්තුවක් ලබා ගැනීමට නොහැකි විය. එහෙයින් 1 හා 2 වන ශීර්ෂයන් සකස් නොකළ ඒවාය.

(ආ) පරිප්පු, උම්බලකඩ හා තිරිඟු ඇට යනාදිය ඇතුළත්ය.

(ඇ) සීනි ආයාත කිරීමේදී වූ විවිිධ වියදම් වන රුපියල් දශ ලක්ෂ 86.1 ක් අත් හැරීමෙනි.

(ඈ) මහජන නීති 480 යටතේ අය කළ පිටි ආනයනයන් මත වන රුපියල් දශ ලක්ෂ 20.6 ක ප්‍රතිදානයක් ඇතුළත් වෙයි.

1969/70 වසරේදී, ශුද්ධ පිහිටාධාරය රුපියල් දශලක්ෂ 11 ක වැඩිවීමක් පෙන්වයි. ඉකුත් වසරේ එය වැඩි වූයේ රුපියල් දශලක්ෂ 33 කිනි.

1968/69 වසරේදී සිදු වූ වැඩිවීම ප්‍රධාන වශයෙන් සිදුවූයේ, මෙරට සහල් පිහිටාධාරයෙහි රුපියල් දශලක්ෂ 19 ක ඉහල යාමක්ද, බෙදු හැරීමේ ගාස්තු හා වෙනත් අය කිරීම්වල සිදු වූ රුපියල් දශලක්ෂ 10 ක ඉහල යාමක්ද, සමූපකාර සමාගම් මගින් නිකුත් කළ ණය ආපසු ගෙවුම් වෙනුවට කූපන් ආපසු බාර දීම කෙරෙන් වූ රුපියල් දශලක්ෂ 11 ක එකතුවක් ද නිසායි. මේ සියලු හේතූන්ගෙන් දළ ආහාර පිහිටාධාරයෙහි වූ වැඩිවීම රුපියල් දශලක්ෂ 41 කි. දළ පිහිටාධාර වියදමෙහි වූ මෙම වැඩිවීමෙන් පංගුවක් සීනි හා පිටි අලෙවි කිරීමෙන් ලැබුණ ලාභ හා සහල් සහනාධාර බද්දෙන් ලද ආදයමෙහි වූ රුපියල් දශලක්ෂ 9 ක වැඩිවීමකින් සමහන් විය. පිටි අලෙවි කිරීමෙන් ලද ලාභය රුපියල් දශලක්ෂ 7 කින් අඩු වෙද්දී, සීනි අලෙවි කිරීමෙන් ලැබුණ ලාභය රුපියල් දශලක්ෂ 15 ක වැඩිවීමක් පෙන්නුම් කෙරුණි. සීනි ටොන් එකක සාමාන්‍ය මිලෙහි රුපියල් 559 සිට රුපියල් 576 දක්වා සිදු වූ ඉහළ යාමක් මගින් තරමක් සමහන් ව, සීනි අලෙවි කිරීමෙන් ලැබුණු ලාභය විශාල වශයෙන් වැඩි වූයේ දිගු ටොන් 30,000 ක (සියයට 12 ක) වැඩි වූ අලෙවි ප්‍රමාණයන් නිසාය. මේ අතර පිටි අලෙවි කිරීමෙන් සිදු වූ ලාභය මූලික වශයෙන් අඩු වූයේ, පිටි ටොන් එකක ආනයන සාමාන්‍ය මිල රුපියල් 681 දක්වා සියයට 9 කින් ඉහළ යාමෙනි.

දළ පිහිටාධාරයෙහි රුපියල් දශලක්ෂ 21 ක අඩුවීමක් තිබියදීත්, ඉකුත් වර්ෂයට වඩා 1969/70 වසරේදී ශුද්ධ පිහිටාධාරය පිළිබඳ තාවකාලික දත්තයෙහි වැඩිවීම සිදු වීය. දළ පිහිටාධාරයෙහි වූ මෙම අඩුවීම, බෙද හැරීමේ වියදම් හා වෙනත් ගාස්තුවල සිදු වූ රුපියල් දශලක්ෂ 9 ක වැඩිවීමකින් සමහන් ව, ආනයනය කළ සහල් පිහිටාධාරයේ රුපියල් දශලක්ෂ 12 ක අඩුවීමක් හා මෙරට සහල් පිහිටාධාරයේ රුපියල් දශලක්ෂ 17 ක අඩුවීමක් නිසා,

මූලික වශයෙන් සිදු වුනි. මෙරට සහල් සහනාධාරය ප්‍රධාන වශයෙන් අඩුවූයේ, සහල් නිකුතුවේ සිදු වූ ටොන් 21,200 ක (සියයට 9 යක අඩුවීමක) පහල වැටීමක් නිසාය. ආනයනය කළ සහල් සහනාධාරයේ අඩුවීම, රුපියල් 920 සිට 787 දක්වා (සියයට 14 ක පහත වැටීමක) සහල් ගොඩ බෑමේ සාමාන්‍ය වියදමෙහි පැහැදිලි පහත වැටීමක ප්‍රතිඵලයකි. මෙයින් පංගුවක් එම සහල් නිකුතුවේ සියයට 22 ක හෝ දිගු ටොන් 58,700 ක වැඩිවීමක් මගින් සමහන් වුනි. කෙසේ වුවත්, සීනි හා පිටි අලෙවියෙන් ලත් ලාභයන්ගෙන් හා සහල් සහනාධාර බද්දෙන් ලද ආදායමේ රුපියල් දශලක්ෂ 30 ක අඩුවීමක් වූ අතර, එය පිහිටාධාරයේ අඩුවීමෙන් වඩාත් සමහන් විය. එහි ප්‍රතිඵලක් වශයෙන් ශුද්ධ සහනාධාරය රුපියල් දශලක්ෂ 11 කින් ඉහළ නැංවිණි. සහල් සහනාධාර බද්ද හා පිටි හා සීනි අලෙවියෙන් ලත් ලාභවලින් වූ ආදායමේ අඩුවීම සිදුවූයේ, ප්‍රධාන වශයෙන් ආනයන මිල සාමාන්‍යය රුපියල් 576 සිට රුපියල් 765 දක්වා (සියයට 33 ක වැඩිවීමක) තියුණු ඉහළ යාමක ප්‍රතිඵලයක් වශයෙන් සීනි වෙළඳාමෙන් වූ ලාභයෙහි රුපියල් දශලක්ෂ 32 ක හෙවත්, සියයට 13 ක සැලකිය යුතු පහත වැටීමක් නිසාය.

1970/71 දී ශුද්ධ සහනාධාරය රුපියල් දශලක්ෂ 119 කින් හෙවත් සියයට 35 කින් තියුණු ලෙස වැඩි වේ යයි ඇස්තමේන්තු කෙරේ. මෙම වැඩිවීම මූලික වශයෙන් සීනි ආනයන බිලෙහි මුළු ප්‍රමාණය කෙරේ රුපියල් දශලක්ෂ 86 ක් එකතු කිරීමට අපේක්ෂා කෙරෙන විදේශ විනිමය සහතික පත් ක්‍රමයට සීනි ආනයනය කිරීම සඳහා වූ ප්‍රතිඵලයකි. ඊට අමතරව 1969/70 දී තියුණු ලෙස ඉහළ ගිය සීනි ආනයන මිල 1970/71 දී ද තවදුරටත් ඉහළ යාමට අපේක්ෂා කෙරුණි. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් සීනි අලෙවියෙන් ලත් ලාභය රුපියල් දශලක්ෂ 103 කින් අඩුවීමට අපේක්ෂා කෙරේ. මෙය ප්‍රධාන කොට, සහල් සහනාධාර බද්දෙන් හා සීනි හා පිටි අලෙවිවලින් ලැබෙන ලාභ වලින් අපේක්ෂිත ආදායමෙහි දළ වශයෙන් පහත වැටෙන ප්‍රමාණයම සඳහා සැළකේ. අනෙක් අතට, දළ සහල් සහනාධාරය රුපියල් දශලක්ෂ 15 කින් වැඩි වීමටද අපේක්ෂා කෙරේ. මෙම වැඩිවීම, වෙනත් භාණ්ඩ අලෙවි කිරීමේදී වන පාඩුවලින් රුපියල් දෙලක්ෂයක අඩුවීමකින් පංගුවක් සමහන්ව, බෙද හැරීමේ ගාස්තු හා වෙනත් වියදම් පිළිබඳව රුපියල් දශ ලක්ෂ 19 ක වැඩිවීමක හා ආනයන කළ සහල් මෙරට සහල් සහනාධාරයේ රුපියල් 8 ලක්ෂයක වැඩිවීමක ප්‍රතිඵලයක් වශයෙන් සිදු වූවකි. ආනයන සහල් හා මෙරට සහල් බෙද හැරීමේ වියදම් හා අනෙකුත් ගාස්තුවල අපේක්ෂිත වැඩිවීම මූලික වශයෙන් 1970 සැප්තැම්බර් 26 වැනිදයින් ක්‍රියාත්මක වන පරිදි සේරුව ශත 75 කට අමතර හාල් සේරුවක් නිකුත් කිරීමට ගත් තීරණය නිසා සිදුවන්නකි.

## (ඉ) අමාත්‍යාංශයන්ගේ ඌණ වියදම්

1967/68 සිට 1969/70 දක්වා වූ මුදල් වර්ෂ තුනෙහි ප්‍රාග්ධන සම්මතයන් යටතේ එන වියදම පිළිබඳ මුළු ප්‍රතිපාදනය (අතිරේක ඇස්තමේන්තු ඇතුළුව) හා නියම වියදම එක් එක් අමාත්‍යාංශයන් අනුව බෙදී යන අයුරු පහත II (ඊ) 8 වෙනි සංඛ්‍යා සටහනින් දක්වෙයි.

1969/70 මුදල් වර්ෂයේදී ප්‍රාග්ධන සම්මත කෙරෙන් වූ මුළු ප්‍රතිපාදනය රුපියල් දශ ලක්ෂ 964 ක් වූයේ, එය රුපියල් දශ ලක්ෂ 152 හෙවත් සියයට 16 ක ඌණ වියදමක් පෙන්වමින් නියම වියදම රුපියල් දශ ලක්ෂ 812 ක් විය. ඉකුත් මුදල් වර්ෂයේදී, ඌණ වියදම රුපියල් දශ ලක්ෂ 143 ක් හෙවත් සියයට 14 ක් වූ අතර, 1967/68 දී රුපියල් දශ ලක්ෂ 124 ක් හෙවත්, සියයට 15 ක් විය. 1969/70 දී මුදල් වර්ෂය සඳහා වූ මුළු ප්‍රතිපාදනය විදුලිබල දෙපාර්තමේන්තුව පිළිබඳ සම්පූර්ණ මූල් ඇස්තමේන්තු ඇතුළත් කළද, 1969 නොවැම්බර්වල දෙපාර්තමේන්තුව මණ්ඩලයක් බවට පත් කළ ද සිට නියම සංඛ්‍යාවන්හි ඇතුළත් වූයේ එක් එක් මාසයක වියදම පමණි. තවද, ප්‍රාග්ධන ගෙවීම් හා සම්බන්ධ විවිධිස වියදම්වලින් කොටසක් ප්‍රාග්ධන සම්මතයන්ට අඩංගුවන අතර ප්‍රාග්ධන සම්බන්ධ-යෙන් යටතේ විවිධිස වියදම් සඳහා කිසිදු ප්‍රතිපාදනයක් නොවිණ. මේ කරුණ උඩ තත්වාකාර ඇස්තමේන්තුවක් කළ නොහැක.

# II (ඊ) 8 වැනි සංඛ්‍යා සටහන

## 1967/68 සිට 1969/70 දක්වා අමාත්‍යාංශ අනුව ප්‍රාග්ධන වියදම(අ)

රුපියල් දශ ලක්ෂ

| අමාත්‍යාංශය | 1967/68 | | | 1968/69 | | | 1969/70 | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | මුළු ප්‍රතිපාදන | නියම වියදම | ඌණ වියදම | මුළු ප්‍රතිපාදන | නියම වියදම | ඌණ වියදම | මුළු ප්‍රතිපාදන | නියම වියදම | ඌණ වියදම |
| 1· අමාත්‍යාංශ යටතේ නොගැනෙන අග්‍රාණ්ඩුකාරවරයා, අගමැති, ශ්‍රේෂ්ඨාධිකරණය ආදිය .. | 0·2 | 0·1 | 0·1 | 0·1 | 0·1 | — | 0·1 | 0·1 | — |
| 2· රාජ්‍යාරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශය .. | 9·9 | 7·0 | 2·9 | 11·1 | 8·8 | 2·3 | 9·1 | 8·8 | 0·3 |
| 3· ක්‍රමසම්පාදන සහ රැකී රක්ෂා අමාත්‍යාංශය .. | ... | ... | ... | 11·1 | 11·1 | — | 15·7 | 10·8 | 4·9 |
| 4· වාරිමාර්ග, විදුලිය හා මහාමාර්ග අමාත්‍යාංශය (ආ) .. | 295·7 | 286·4 | 9·3 | 334·1 | 295·0 | 39·1 | 335·5 | 217·1 | 118·4 |
| 5· විදේශීය හා දේශීය වෙළඳ අමාත්‍යාංශය .. | 3·6 | 1·7 | 1·9 | 13·6 | 10·7 | 2·9 | 4·9 | 4·2 | 0·7 |
| 6· අධ්‍යාපන අමාත්‍යාංශය .. | 36·8 | 24·8 | 12·0 | 36·9 | 26·6 | 10·3 | 40·4 | 34·4 | 6·0 |
| 7· නාවික හා සංචාරක කටයුතු අමාත්‍යාංශය .. | 24·3 | 17·0 | 7·3 | 40·4 | 30·8 | 9·6 | 24·3 | 23·8 | 0·5 |
| 8 කම්කරු අමාත්‍යාංශය .. | 2·4 | 2·5 | – 0·1 | 6·1 | 5·6 | 0·5 | 4·6 | 3·5 | 1·1 |
| 9· රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය .. | 36·8 | 25·5 | 11·3 | 43·1 | 34·6 | 8·5 | 48·1 | 45·5 | 2·6 |
| 10· කර්මාන්ත හා විද්‍යා කටයුතු අමාත්‍යාංශය .. | 146·9 | 136·0 | 10·9 | 214·7 | 189·1 | 25·6 | 147·6 | 164·7 | – 17·1 |
| 11· මුදල් අමාත්‍යාංශය .. | 29·7 | 26·7 | 3·0 | 28·2 | 26·8 | 1·4 | 37·7 | 38·6 | – 0·5 |
| 12· ගමනාගමන අමාත්‍යාංශය .. | 48·4 | 32·9 | 15·5 | 46·8 | 33·7 | 13·1 | 39·1 | 47·1 | – 8·0 |
| 13· වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය | 40·6 | 40·6 | — | 36·8 | 36·8 | — | 28·9 | 28·9 | — |
| 14· අධිකරණ අමාත්‍යාංශය .. | 0·2 | 0·2 | — | 0·1 | 0·2 | – 0·1 | 0·3 | 0·3 | — |
| 15· කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශය .. | 94·0 | 68·3 | 25·7 | 96·9 | 88·0 | 8·9 | 121·9 | 102·3 | 19·6 |
| 16· ධීවර අමාත්‍යාංශය .. | 30·5 | 16·6 | 13·9 | 20·6 | 18·8 | 1·8 | 19·2 | 16·6 | 2·6 |
| 17· නිවාස හා ගොඩනැගිලි අමාත්‍යාංශය (ආ) .. | 1·6 | 8·6 | – 7·0 | 7·0 | 7·0 | — | 42·3 | 33·5 | 8·8 |
| 18· තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යාංශය .. | 18·3 | 5·8 | 12·5 | 17·5 | 9·2 | 8·3 | 16·9 | 9·4 | 7·5 |
| 19· සෞඛ්‍ය අමාත්‍යාංශය .. | 11·1 | 10·8 | 0·3 | 17·0 | 11·6 | 5·4 | 13·9 | 12·3 | 1·6 |
| 20· ප්‍රවෘත්ති හා ගුවන්විදුලි අමාත්‍යාංශය .. | 5·2 | 1·7 | 3·5 | 9·7 | 5·4 | 4·3 | 10·1 | 7·8 | 2·3 |
| 21· සමාජ සේවා අමාත්‍යාංශය .. | 0·6 | 0·3 | 0·3 | 0·5 | 0·3 | 0·2 | 0·7 | 0·2 | 0·5 |
| 22· සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය .. | 2·0 | 1·5 | 0·5 | 2·3 | 1·8 | 0·5 | 2·2 | 1·6 | 0·6 |
| 23· පාර්ලිමේන්තු කටයුතු හා ක්‍රීඩා අමාත්‍යාංශය .. | 0·1 | — | 0·1 | — | — | — | 0·5 | 0·4 | 0·1 |
| 24· ව්‍යවසාය කටයුතු අමාත්‍යාංශය .. | — | — | — | — | — | — | 0·1 | — | 0·1 |
| එකතුව | 838·5 | 714·4 | 124·1 | 994·5 | 852·0 | 142·5 | 964·2 | 812·0 | 152·2 |

(අ) 1970/71 මුදල් වර්ෂය සඳහා ලංකාණ්ඩුවේ ආදායම් හා වියදම් ඇස්තමේන්තුවල දක්වෙන පරිදි දෙපාර්තමේන්තු හා කාර්යයන් විවිධ අමාත්‍යාංශ යටතේ වෙන් කිරීමට හැකිතරම් අනුකූල වන පරිදි, 1967/68, 1968/69 හා 1969/70 සඳහා වූ සංඛ්‍යාවන් සංසන්දනය කිරීමේ කාර්යය සඳහා නැවත වර්ග කර ඇත. ''මුළු ප්‍රතිපාදනය'' පිළිබඳ සංඛ්‍යාවන්ට අතිරේක ඇස්තමේන්තු ඇතුළත් වන අතර, ''නියම වියදම'' පිළිබඳ සංඛ්‍යාවන්ට සම්මතයන්ගෙන් සිදු කිරීමට අපේක්ෂා කරන විදේශීය ණය වියදම් ඇතුළත්ය. නිදන් අරමුදල් දායක දීමනා, රාජ්‍ය ණය පිළිබඳ සෘජු ආපසු ගෙවීම් සහ ජාත්‍යන්තර සංවිධානයන්ට විශේෂ ගෙවීම් මේ සංඛ්‍යාවන්ගෙන් අත්හැර ඇත. ඌණ වියදම් තීරුව යටතේ එන සෘණ ලකුණක් මුළු ප්‍රතිපාදනයට වඩා නියම වියදමෙහි අතිරික්තය පෙන්වයි.

(ආ) 1968/69 මුදල් වර්ෂයේදී රජයේ වැඩ දෙපාර්තමේන්තු වියදම මහා මාර්ග, බලය හා වාරිමාර්ග අමාත්‍යාංශය යටතේ වර්ග කොට ඇත. 1969/70 වර්ෂයේදී මෙම දෙපාර්තමේන්තුව ගොඩනැගිලි දෙපාර්තමේන්තුව හා මහා මාර්ග දෙපාර්තමේන්තුව යනුවෙන් බෙදන ලද අතර, පූර්ව ගොඩනැගිලි හා නිවාස අමාත්‍යාංශය යටතේ දක්වා ඇත. එහෙයින් 1969/70 වර්ෂයේදී අමාත්‍යාංශ දෙක සඳහා වූ සංඛ්‍යාවන් පසුගිය වර්ෂ 2 ක සඳහා එවැනි සංඛ්‍යාවන් සමග සැසඳිය නොහැක.

රජයේ ප්‍රාග්ධන වියදමෙන් දළ වශයෙන් 1/3 ක ප්‍රමාණයක් ගණන් ගැනෙන වාරිමාර්ග, බලය හා මහා මාර්ග අමාත්‍යාංශයෙහි සම්මතයන්ගේ 1969/70 දී සිදුවී තිබෙන මුළු ඌණ වියදම්වල වඩාත් වැදගත්ම කොටස වන බවද මෙම සටහනින් පෙනේ. කලින් දක්වා ඇති පරිදි මෙම අමාත්‍යාංශයේ විශාල ඌණ වියදමේ කොටසකට හේතු වී ඇත්තේ මුල් ඇස්තමේන්තුවල විදුලි බල දෙපාර්තමේන්තුවේ සම්මතයන් ඇතුලත් වීමත්, පසුව එම දෙපාර්තමේන්තුව විදුලිබල මණ්ඩලයක් බවට හැරවීම නිසාත්‍ය. මෙම කරුණ සඳහා ඉඩ හැරීමෙන් පසුව පවා, එය ඌණ වියදම්හි ඇති කළ බලපෑම රුපියල් දශ ලක්ෂ 63·0 ක හෙවත් සියයට 23 ක සැළකිය යුතු ගණනක් වුනි. මෙය 1967/68 දී වූ සියයට 3 ක හෙවත්, රුපියල් දශ ලක්ෂ 9·3 ක් හා 1968/69 දී වූ සියයට 12 ක හෙවත් රුපියල් දශ ලක්ෂ 39·1 ක් හා සැසඳේ. කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශය 1969/70 දී රුපියල් දශ ලක්ෂ 19·6 ක ඌණ වියදමක් හෙවත් සියයට 16 ක ඌණ වියදමක් පෙන්වූයේය. මෙය 1967/68 දී වූ රුපියල් දශ ලක්ෂ 25·7 ක හෙවත්, සියයට 27 ක් සමගද, 1968/69 දී වූ රුපියල් දශ ලක්ෂ 89 ක හෙවත්, සියයට 9 ක් සමගද සැසඳේ. 1969/70 ප්‍රාග්ධන අයවැය ලේඛනයෙහි සඳහන් කළ හැකි ලක්ෂණයක් නම්, කර්මාන්ත හා විද්‍යා කටයුතු පිළිබඳ අමාත්‍යාංශය, විදුලි සංදේශ සේවා අමාත්‍යාංශය හා මුදල් අමාත්‍යාංශය යන අමාත්‍යාංශ තුනෙහි ඉටු කළ කාර්ය ඒවායේ නියම වියදම් ප්‍රතිපාදන ඉක්මවා යාමකි. කර්මාන්ත හා විද්‍යා කටයුතු අමාත්‍යාංශයෙහි 1969/70 දී එම අතිරික්තය රුපියල් දශ ලක්ෂ 17·1 ක් විය. එය 1968/69 සඳහා වූ සියයට 12 ක හෙවත් රුපියල් දශ ලක්ෂ 25·6 ක හා 1967/68 දී සියයට 7 ක හෙවත් රුපියල් දශ ලක්ෂ 10·9 ක ඌණ වියදමක් සමග සැසඳේ. විදුලි සංදේශ සේවා අමාත්‍යාංශයෙහි ප්‍රාග්ධන වියදම් ද 1969/70 දී රුපිලේ දශ ලක්ෂ 8·0 ක අතිරික්තයක් පෙන්වයි. ඒ 1968/69 දි රුපියල් දශ ලක්ෂ 13· 1 ක් හෙවත් සියයට 28 ක්ද, 1967/68 දී රුපියල් දශ ලක්ෂ 15·5 ක් හෙවත් සියයට 32 ක් ද වූ ඌණ වියදම්වලට ප්‍රති විරුද්ධ වශයෙනි.

## (ඊ) අත්තිකාරම් ගිණුම්

1969/70 දී රජයේ ''අත්තිකාරම් ගිණුම්''[1] කටයුතුවලින් රුපියල් දශ ලක්ෂ 201 ක ශුද්ධ ගෙවීමක් කෙරුණ අතර ඉකුත් වර්ෂයේදී රුපියල් දශ ලක්ෂ 49 ක ශුද්ධ ගෙවීමක් විය. වර්ෂයේ ශුද්ධ මූල්‍ය හිඟයට සැහෙන පමණ ආධාරකාරී වූ 1969/70 ශුද්ධ ගෙවීමට හේතු වූයේ රජයේ දෙපාර්තමේන්තුවලට රුපියල් දශ ලක්ෂ 125 ක, ලංකා/චීන වෙළඳ ගිණුම යටතේ රුපියල් දශ ලක්ෂ 56 ක හා ගබඩා සඳහා රුපියල් දශ ලක්ෂ 22 ක ගෙවීම් විය. රුපියල් දශ ලක්ෂ 2 ක විවිධ ලැබීමක් මගින් එය තරමක් සමහන් වුනි. ඉකුත් වර්ෂයේ රුපියල් දශ ලක්ෂ 49 ක ගෙවීම ප්‍රධාන වශයෙන් රජයේ දෙපාර්තමේන්තුවලට කරන ලද රුපියල් දශ ලක්ෂ 61 ක ගෙවීමක ප්‍රතිඵලයක් වූ අතර, ලංකා/චීන වෙළඳ ගිණුම යටතේ චීනයට හිතකර වන ලෙසින් ශේෂයෙහි සිදු වූ රුපියල් දශ ලක්ෂ 12 ක නැගීමක් මගින් එය තරමක් සමහන් විය. 1969/70 දී රජයේ දෙපාර්තමේන්තුවලට වූ රුපියල් දශ ලක්ෂ 125 ක විශාල ගෙවීමට හේතු වූයේ ඉකුත් මුදල් වර්ෂයේ අවසානය වන විට නොබේරා පැවති රුපියල් දශ ලක්ෂ 92 ක ආහාර බිල්පත් ආපසු ගෙවීම වූ අතර, ලංකා/චීන වෙළඳ ගිණුම යටතේ රුපියල් දශ ලක්ෂ 56 ක ගෙවීම එම ගිවිසුම යටතේ චීන මහජන සමූහාණ්ඩුවට හිමිව පැවති ශේෂයෙහි අඩුවීමක් නිරූපනය කරයි.

---

1. වැඩි වශයෙන් වානිජ සවභාවයකින් යුතු මුළුමණින්ම හෝ අර්ධ වශයෙන් සවයං මූල්‍ය කාරක රජයේ කටයුතු අත්තිකාරම් ගිණුම් නමින් හැඳින්වේ. එවැනි ගිණුම් ප්‍රධාන වර්ග තුනකි. ඒවා නම් ගබඩා ගිණුම්, වෙළඳ ගිණුම් සහ විශේෂ ගිණුම්ය. මෙම කටයුතුවල ලැබීම් හා ගෙවීම් පහසුවෙන් නිශ්චිතව කලින් දැන ගැනීමට නොහැකි බැවින්, රජයේ ඇස්තමේන්තුවල සංකේත සම්මතයක් පමණක් දක්වීම සාමාන්‍ය සිරිතක්ව පවතී. එම අත්තිකාරම් ගිණුම්වල ලැබීම් රජයේ ඇස්තමේන්තුවල II වන කොටසෙහි දක්වා ඇති සීමාවන්ට යටත්ව ඒවායේ වියදම පියවා ගැනීම සඳහා උපයෝජනය කිරීමට අවසර දී ඇත. කෙසේ වුවද, මෙම අත්තිකාරම් ගිණුමක ශුද්ධ ප්‍රතිඵලය පූර්වකථනය කළහැකි වූ විට එහි අතිරික්තය හෝ හිඟය ඇස්තමේන්තු යටතේ සම්මත කරනු ලැබේ. උදා:-ශුද්ධ ආහාර පිහිටාධාරය.

## (උ) ශුද්ධ අයවැය හිඟය හා එය පියවූ ආකාරය

1969/70 වසරේ අයවැය ලේඛනය මුලදී රුපියල් දශලක්ෂ 722 ක ශුද්ධ මූල්‍ය හිඟයක් බලාපොරොත්තු විය. එසේ වුවත්, රජයේ අයවැය කටයුතුවල අවසානයේදී රුපියල් දශලක්ෂ 936 ක (තාවකාලික සංඛ්‍යා) වඩාත් ඉහළ හිඟයක් ඇති කෙරිණ. මෙය ඉකුත් මුදල් වසරේ දී ඇතිවූ රුපියල් දශලක්ෂ 788 ක හිඟය සමග සැසඳේ. 1969/70 දීවූ හිඟය මෙතෙක් වාර්තා ගතවී ඇති ඉහළම හිඟය විය. මෑත අවුරුදුවල, ශුද්ධ මූල්‍ය හිඟයන් අනුක්‍රමයෙන් වැඩිවන උපනතියක් පෙන්වා ඇත. මේ පිළිබඳ හේතූන් (කලින් එන කොටස්වල) විග්‍රහ කොට තිබේ.

1969/70 දී ශුද්ධ මූල්‍ය හිඟයවූ රුපියල් දශලක්ෂ 148 ක නැගීම වර්තන වියදමේ රුපියල් දශලක්ෂ 275 ක හා අත්තිකාරම් ගිණුම් කටයුතුවල රුපියල් දශලක්ෂ152 ක වැඩිවීමේ[1] ඒකාබද්ධ ප්‍රතිඵලය විය. මෙය තරමක් දුරට, ආදයම් ලැබීම්හි එන රුපියල් දශලක්ශ 239 ක වැඩිවීමකින් හා ප්‍රාග්ධන සම්මතයන්ට වන වියදමේ රුපියල් දශලක්ෂ 40 ක අඩුවීමකින් සමහන් විය.

1969/70 දී ශුද්ධ මූල්‍ය හිඟය, එම වර්ෂයේ මුල් ඇස්තමේන්තුවලට වඩා රුපියල් දශලක්ෂ 214 කින් ඉක්මවා ගියේය, මෙම වැඩිවීම මුල් ඇස්තමේන්තුවල නොදැක්වූ අත්තිකාරම් ගිණුම් කටයුතුවල රුපියල් දශලක්ෂ 201 ක ශුද්ධ ගෙවීමක් හා ආදයමෙහිවූ රුපියල් දශලක්ෂ 98 ක පහත වැටීමක් නිසා සිදු වූ අතර ඒ වැඩිවීම තරමක් දුරට ප්‍රාග්ධන හා වර්තන වියදම් පිළිවෙලින් රුපියල් දශලක්ෂ 15 ක හා රුපියල් දශලක්ෂ 28 ක පහත බැසීම්වලින් සමහන් විය.

1970/71 පවත්නා මුදල් වර්ෂය තුළදී, ශුද්ධ මූල්‍ය හිඟය රුපියල් දශලක්ෂ 932 ට ඇස්තමේන්තු කොට ඇති අතර 1969/70 ප්‍රමාණයට වඩා එය රුපියල් දශලක්ෂ 4 කින් පහත් විය. වියදම රුපියල් දශලක්ෂ 172 කින් වැඩිවීමට අපේක්ෂිත වුවද, ආදයම් ලැබීම්හි ඇස්තමේන්තු කළ රුපියල් දශ ලක්ෂ 142 ක වැඩිවීම ණය ආපසු ගෙවුම් පිළිබඳව වැඩිවූ රුපියල් දශලක්ෂ 35 ක ප්‍රතිදානයන් සමග එක්ව අපේක්ෂා කෙරුණේ 1970/71 දීවූ ශුද්ධ මූල්‍ය හිඟයෙහි මෙම සුළු අඩුවීම ඇති කිරීමටය.

**හිඟය පියවීම**

1970/71 පවතින මුදල් වර්ෂය සමග එක්ව 1966/67 සිට 1969/70 දක්වා වර්ෂවලදී හිඟය පියවූ ආකාරයත්, එය පියවීමෙන් ඇතිවේයැයි ගණන් බලා ඇති ප්‍රසාරණාත්මක බලපෑමත්, පිළිබඳ දත්තයන් II (ඊ) 9 වෙනි සංඛ්‍යා සටහනින් දක්වේ.

1969/70 දීවූ රුපියල් දශලක්ෂ 936 ක ශුද්ධ මූල්‍ය හිඟය දේශීය බැංකු මාර්ගයෙන් ලබා ගත් රුපියල් දශලක්ෂ 454 කින්ද, දේශීය බැංකු නොවන මාර්ගයන්ගෙන් ලබා ගත් රුපියල් දශලක්ෂ 266 කින්ද, වෙළඳ පොළ නොවන දේශීය මාර්ගයන්ගෙන් ලබා ගත් රුපියල් දශලක්ෂ 22 කින් හා විදේශීය ආධාර වලින් ලබා ගත් රුපියල් දශලක්ෂ 220 කින්ද පියවා ගනු ලැබීය, එහි ප්‍රතිඵලයක් වශයෙන්, මුදල් ශේෂයන් රුපියල් දශලක්ෂ 26 කින් (ප්‍රතිපාර්ශ්වීය අර මුදල් ඇතුළුව) වැඩි වුනි. අනෙක් අතට, 1970/71 පවතින මුදල් වසරේ රුපියල් දශලක්ෂ 932 ක ශුද්ධ මූල්‍ය හිඟය රුපියල් දශලක්ෂ 491 ක විදේශ ආධාර විශාල ප්‍රමාණයකින් හා බැංකු නොවන අංශයෙන් රැස් කෙරෙන රුපියල් දශලක්ෂ 344 කින් පියවා ගැනීමටය. එහි ඉතිරි රුපියල් දශලක්ෂ 97 ක ශේෂය බැංකු ණය ගැනීම්වලින් පියවා ගත යුතු වෙයි.

1969/70 දී රාජ්‍ය මූල්‍ය කටයුතුවල ශුද්ධ ප්‍රසාරණාත්මක බලපෑම රුපියල් දශලක්ෂ 428 කි. එය ඉකුත් වසරේ එවැනි කටයුතුවල ප්‍රසාරණාත්මක බලපෑමට වඩා රුපියල් දශ ලක්ෂ 249 ක තියුණු වැඩිවීමක් පෙන්වයි. ප්‍රසාරණාත්මක බලපෑමෙහිවූ මෙම වැඩිවීම

---

1. අත්තිකාරම් ගිණුමේ කටයුතු නිසා 1968/69 හා 1969/70 යන වර්ෂවලදී පිළිවෙලින් රුපියල් දශලක්ෂ 48·7 ක හා රුපියල් දශලක්ෂ 201.1 ක ශුද්ධ ගෙවුම් විය.

## II (ඊ) 9 වැනි සංඛ්‍යා සටහන

### හිඟය පියවූ ආකාරය – 1966/67 සිට 1967/68 දක්වා (අ)

(රුපියල් දශ ලක්ෂ)

| මූලයන් | 1966/67 | | | 1967/68(ආ) | | | 1968/69 (ආ) | | | 1969/70 නියම (තාවකාලික) | | | 1970/71 මුල් ඇස්තමේන්තු |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1· විදේශීය මුදල් | | | | | | | | | | | | | |
| (අ) සංවර්ධන යෝජනා ක්‍රම ණය (දළ) .. | 42·4 | | | 38·8 | | | 93·9 | | | 53·3 | | | |
| නිදන් අරමුදල් දයක දීමනා සහ ආපසු ගෙවීම් අඩු කොට .. | 44·9 | –2·5 | | 47·8 | – 9·0 | | 47·0 | 46·9 | | 72·2 | –18·9 | | |
| (ආ) සංවර්ධන ක්‍රම නොවන (භාණ්ඩ) ණය (දළ) .. | 193·9 | | | 178·9 | | | 312·2 | | | 229·1 | | | |
| නැවත ගෙවීම් අඩුකොට .. | 2·1 | 191·8 | | 8·7 | 170·2 | | 25·0 | 287·2 | | 46·5 | 182·6 | | |
| (ඇ) දීමනා .. | | 19·3 | 208·6 | | 29·0 | 190·2 | | 19·5 | 363·6 | | 56·5 | 220·2 | 490·9 |
| 2· වෙළෙඳ පොලින් නොවන දේශීය ණයගැනීම් | | | 72·3 | | | 9·8 | | | 52·2 | | | 21·8 | – |
| 3· දේශීය වෙළෙඳ පොලේ බැංකු ක්‍රමයෙන් ගත් ණය (ඇ) | | | | | | | | | | | | | |
| (අ) මහ බැංකුව .. | | 125·7 | | | 302·1 | | | 114·9 | | | 376·4 | | |
| (ආ) වෙළෙඳ බැංකු .. | | –74·5 | 51·3 | | 1·4 | 303·5 | | –46·8 | 68·1 | | 77·1 | 453·5 | 97·1 |
| 4· බැංකු නොවන මාර්ගයන්ගෙන් වෙළෙඳ පොළින් ණය ගැනුම් | | | | | | | | | | | | | |
| ණයට ගත් ප්‍රමාණය දළ වශයෙන් .. | | 364·5 (ඈ) | | | 324·0 | | | 287·8 | | | 359·2 | | |
| නිදන් අරමුදල්දයක දීමනා අඩුකොට .. | | 67·5 | 297·0 | | 75·7 | 248·3 | | 85·3 | 202·5 | | 93·2 | 266·0 | 343·5 |
| 5· මුදල් ශේෂ හා විදේශාධාර ප්‍රතිපාර්ශ්වීය අරමුදල් අඩුවීම් | | | | | | | | | | | | | |
| (අ) මුදල් ශේෂ .. | | 21·5 | | | –48·4 | | | 62·9 | | | –30·6 | | |
| (ආ) විදේශාධාර ප්‍රතිපාර්ශ්වීය අරමුදල් (දළ බැර) .. | –193·9 | | | –187·7(ඉ) | | | –318·7 (ඉ) | | | –268·4(ඉ) | | | |
| අයවැය කටයුතු සඳහා උපයෝගී කොටගත් ප්‍රමාණය අඩු කොට .. | 150·0 | –43·9 | –22·4 | 200·0 | 12·3 | –36·1 | 367·0 | –48·3 | –111·2 | 273·4 | 5·0 | –25·6 | – |
| 6· ශුද්ධ මූල්‍ය හිඟය .. | | | 606·8 | | | 715·7 | | | 787·6 | | | 935·6 | 931·5 |
| 7· ජ.ජ. ප්‍රතිපාර්ශ්වීය අ. මුදලෙහි අඩුවීම් .. | | | 27·2 | | | — | | | – 0·3 | | | ... | – |
| 8· රජයේ මූල්‍ය කටයුතුවල ශුද්ධ ප්‍රසාරණාත්මක බල පෑම (3+5+7) .. | | | 56·1 | | | 267·4 | | | 179·0 | | | 427·9 | 97·1 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) සෘණ ලකුණකින් දක්වෙනුයේ 1 සිට 4 දක්වා සහ 8 වෙනි ශීර්ෂයන් සම්බන්ධයෙන් ආපසු ගෙවීමක් හා 5 හා 7 වෙනි ශීර්ෂයන් සම්බන්ධයෙන් වැඩිවීමක්ය.

(ආ) 1967/68 මුදල් වර්ෂයේ ජන නීති 480 ණය යටතේ ලැබුණු රුපියල් දශලක්ෂ 28·9, 1968/69 භාණ්ඩ ආධාර ලැබීම් වශයෙන් රජයේ ගිණුම් වලට හර කරනු ලැබිය. ප්‍රස්තුත ගැලපීම් කළහොත්, මුදල් වර්ෂ දෙකේ රාජ්‍ය මූල්‍ය කටයුතුවල ප්‍රසාරණාත්මක බලපෑම පිළිවෙලින් රුපියල් දශලක්ෂ 238·5 සහ රුපියල් දශලක්ෂ 207·9 ක් වේ.

(ඇ) මෙම සංඛ්‍යාවන්හි බැංකු ක්‍රමය විසින් දරන ලැබූ රජයේ ආනයන (ආහාර) බිල්පත්වල වටිනාකම ගනන් නොගන්නා ලදී. මෙම හිඟව තිබෙන ආහාර බිල්පත්වල වටිනාකම පිළිවෙලින් සැප්තැම්බර් අවසානයට 1966, 1967, 1968 හා 1969 යන වර්ෂයන්හිදී රුපියල් දශලක්ෂ 76·0, රුපියල් දශලක්ෂ 122·3, රුපියල් දශලක්ෂ 100·7, සහ රුපියල් දශලක්ෂ 92·4 ක් විය.

(ඈ) මෙම ආයතන හා නියෝජ්‍ය ආයතන විසින් දුරු මහ බැංකු සුරකුම් පත් නිදහස් කිරීමෙන් පසු, ඉතුරුම් ආයතන හා රජයේ නියෝජ්‍ය ආයතන වලින් මිල දී ගත් රුපියල් දශ ලක්ෂ 53·4 ක්වූ රජයේ සුරකුම් පත්‍ද ඇතුළත්ය.

(ඉ) 1967/68 සිට 1969/70 දක්වා මුදල් වර්ෂයන්හි සමහර දීමනා භාණ්ඩ වශයෙන් ලැබීම නිසා ඒවාද ප්‍රතිපාර්ශ්වීය අරමුදලට බැර කිරීමේ හේතුවෙන් (භාණ්ඩ) ණය ලැබීම්වලට වඩා ප්‍රතිපාර්ශ්වීය අරමුදලේ බැර සංඛ්‍යාව වැඩිවී ඇත.

ප්‍රධාන වශයෙන් සිදුවූයේ එහිම ශුද්ධ මුදල් ශේෂයන්හි වැඩිවූ ප්‍රමාණය[1] නිසාය. එය බැංකු ණය ප්‍රමාණය අඩු කිරීමට ආධාරකාරිවූ බැංකු නොවන දේශීය මාර්ගයන්ගෙන් ලබාගත හැකි සම්පත්වල වැඩිවීමත් බැංකු නොවන දේශීය මාර්ගයන්ගෙන් (පරිපාලන ණය ගැනීම්) හා විදේශීය මාර්ගයන්ගෙන් ලබාගත් සම්පත්වල අඩුවීමත් ඊට සම්බන්ධ විය.

මෙලෙසට 1967/68 දිවූ සියයට 37.4 සිට 1968/69 දිවූ සියයට 22·4 දක්වා පහත වැටුණු මූළු ශුද්ධ මුදල් ශේෂයන්හි ප්‍රසාරණාත්මක සංචරකයෙහි අනුපාතය 1969/70 දී සියයට 45·7 දක්වා සැලකිය යුතු ලෙස ඉහළ ගියේය.

1969/70 දී, රජය, ශ්‍රී ලංකා මහ බැංකුවට එහි ණයගැතිබව රුපියල් දශලක්ෂ 376 කින් වැඩි කළ අතර වාණිජ බැංකුවලට එහිවූ ණයගැතිබව ද රුපියල් දශලක්ෂ 77 කින් වැඩි කළේය. ශ්‍රී ලංකා මහ බැංකුවෙන් කළ ණය ගැනීම් ඉකුත් වර්ෂයේ දී කළ එම ණය ගැනීම්-වලට වඩා රුපියල් දශලක්ෂ 262 කින් වැඩිවූ අතර වාණිජ බැංකුවලින් කළ ණය ගැනීම් රුපියල් දශලක්ෂ 124 ක් වැඩිවුනි.[2] සමාලෝචිත මුදල් වර්ෂයේදී ශ්‍රී ලංකා මහ බැංකුවෙන් සිදුකළ ණය ගැනීම්හි, රජයේ සුරැකුම්පත්වල මහ බැංකුවට අයිති ප්‍රමාණයන්හි රුපියල් දශලක්ෂ 137 ක වැඩිවීමක්ද, භාණ්ඩාගාර බිල්පත්වල දශලක්ෂ 197 ක වැඩිවීමක් හා නොබේරා ඉතිරිව ඇති මහ බැංකු අත්තිකාරම්වල රුපියල් දශලක්ෂ 43 ක්ද අඩංගු විය. වාණිජ බැංකුවලටවූ එහි ණය ගැති බවෙහි වැඩිවීම, රජයේ සුරැකුම්පත්වල රුපියල් දශලක්ෂ 82 ක වැඩිවීමක හා බද්ද සංචිත සහතිකවල රුපියල් දශලක්ෂ 3 ක වැඩිවීමක ප්‍රතිඵලය විය. මෙම වැඩිවීම නිසාවූ ප්‍රතිඵලය භාණ්ඩාගාර බිල්පත්වල දැරීම්හි සිදුවූ රුපියල් දශලක්ෂ 8 ක පහත වැටීමකින් සමහන් වුනි.

1969/70 දී බැංකු නොවන මාර්ගයන්ගෙන්වූ රුපියල් දශලක්ෂ 266 ක ශුද්ධ දේශීය වෙළඳ පොළ ණය ගැනීම් ඉකුත් වර්ෂයේවූ එම ණය ප්‍රමාණයට වඩා රුපියල් දශලක්ෂ 64 කින් ඉහළ විය. 1968/69 දී එය, ඊට කලින් වසර තුළවූ එම ණයවලට වඩා රුපියල් දශලක්ෂ 46 ක පහත වැටීමක් හා සැසඳේ.

පසුගිය මුදල් වර්ෂයන් හතර සඳහාවූ බැංකු නොවන ආයෝජක කණ්ඩායම්වල ශුද්ධ දායකත්වයන් (එනම් රජයේ සුරැකුම්පත් දැරීම්හි වෙනස්කම්) පහත එන II (ඊ) 10 වෙනි සංඛ්‍යා සටහනෙහි දක්වේ.

### සංඛ්‍යා සටහන II (ඊ) 10

### බැංකු නොවන ආයෝජක කණ්ඩායම් විසින් රජයේ සුරැකුම්පත්වලට(අ) කළ දායකයන්

රුපි. දශලක්ෂ

| දායකයන් | 1966/67 | 1967/68 | 1968/69 | 1969/70 | වැඩිවීම: 1968/69 හා සසඳන කළ 1967/68 | වැඩිවීම: 1969/70 හා සසඳන කළ 1968/69 |
|---|---|---|---|---|---|---|
| 1. ඉතුරුම් ආයතන .. | 88·6(ආ) | 41·5 | 0·6 | 11·0 | —40·9 | 10·4 |
| 2. සේවක අර්ථසාධක අරමුදල .. | 85·2 | 92·1 | 101·6 | 98·0 | 9·5 | — 3·6 |
| 3. වෙනත් අර්ථසාධක අරමුදල් සහ විශ්‍රාම වැටුප් .. | 41·3 | 30·2 | 28·6 | 46·1 | — 1·6 | 17·5 |
| 4. දෙපාර්තමේන්තු සහ වෙනත් නිල අරමුදල් .. | 16·3(ආ) | 7·0 | 3·7 | 5·4 | — 3·3 | 1·7 |
| 5. රක්ෂණ සංස්ථාව .. | 47·9 | 52·8 | 42·4 | 45·5 | —10·4 | 3·1 |
| 6. වෙනත් රක්ෂණ අරමුදල් .. | 0·1 | 4·2 | 3·5 | 8·8 | — 0·7 | 5·3 |
| 7. අනෙකුත් රාජ්‍ය සමායතන .. | — 0·7 | — | — | — 0·7 | — | — 0·7 |
| 8. සමාගම් සමාජ සහ ආයතන .. | —12·3 | — 1·6 | 5·6 | 5·6 | 7·2 | — |
| 9. පුද්ගලයන් .. | 6·5 | 0·1 | — 3·2 | 10·5 | — 3·3 | 13·7 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) මෙම සටහන ඉහත දක්වූ ආයතනයන්ට අයිති රුපියල් සුරැකුම්පත්, භාණ්ඩාගාර බිල්පත් හා බද්ද සංචිත සහතික පත්වල ශුද්ධ වෙනස්වීම් පෙන්වයි.

(ආ) මෙම ආයතන වෙත පැවති මහ බැංකු සුරැකුම්පත් ගෙවා දැමීමෙන් පසු ඉතුරුම් ආයතන හා රජයේ නියෝජ්‍ය ආයතන විසින් මිලදීගත් රුපියල් දශලක්ෂ 53·4ක්වූ රජයේ සුරැකුම්පත් ඇතුළුව.

1. බැංකු ක්‍රමයේ ණය ගැනීම්වල මෙම වැඩිවීම සහ ඒ අනුව ඇතිවූ වැඩිවීමට තරමක් දුරට හේතුවූයේ ඉකුත් මුදල් වර්ෂයේ අවසානය වන විට නොබේරා ඉතිරිව පැවති රුපියල් දශලක්ෂ 92 ක ආහාර බිල්පත්ය.
2. රජය 1968/69 දී රුපියල් දශලක්ෂ 47 කින් වාණිජ බැංකුවලට ඇති ණයගැතිබව අඩු කළ අතර 1969/70 දී එහි ණයගැතිබව රුපියල් දශලක්ෂ 77 කින් වැඩිවිය.

## II (ඊ) 11 වෙනි සංඛ්‍යා සටහන

## ශුද්ධ විදේශීය ආධාර ලැබීම්

රුපි. දශ ලක්ෂ

| මූලය හා වර්ගය | 1962/63 | 1963/64 | 1964/65 | 1965/66 | 1966/67 | 1967/68 | 1968/69 | 1969/70 (තාව කාලිකයි) |
|---|---|---|---|---|---|---|---|---|
| **1. ණය** | **60·9** | **63·5** | **75·6** | **76·5** | **189·3** | **161·2** | **334·1** | **230·0†** |
| 1·01 සං.ප්‍ර.ජා.බැ. ලෝක බැංකුව | 21·2 | 11·3 | 5·0 | –1·2 | – 0·3 | –7·7 | –8·4 | –9·3 |
| 1·02 ජාත්‍යන්තර සංවර්ධන සංගමය | — | — | — | — | — | — | — | 4·7 |
| 1·03 කැනඩාව | 0·8 | –0·2 | 11·4 | 2·5 | 8·1 | 8·6 | 8·5 | 6·0 |
| 1·04 චීන මහජන සමූහාණ්ඩුව | — | 12·4 | 18·9 | 9·7 | – 4·9 | –5·5 | –5·5 | 4·8 |
| 1·05 එක්සත් රාජධානිය | 10·4 | 4·9 | –2·3 | 10·6 | 49·4 | 51·9 | 37·0 | 38·2 |
| 1·06 අමෙරිකා එක්සත් ජනපදය | – 0·7 | 2·7 | –1·2 | 23·8 | 31·0 | 45·6 | 177·9 | 49·8 |
| 1·07 සෝවියට් සමාජවාදී සමූහාණ්ඩු සංගමය | 13·5 | 32·0 | 28·8 | 9·3 | –10·0 | –8·3 | –9·6 | –9·2 |
| 1·08 බටහිර ජර්මන් ජනරජය | 11·5 | 0·4 | 7·4 | 6·7 | 66·2 | 25·0 | 17·4 | 29·3 |
| 1·09 යුගොස්ලේවියාව | 4·3 | ... | –0·3 | 0·8 | – 1·4 | –0·7 | –0·8 | –0·4 |
| 1·10 පෝලන්තය | — | — | 2·4 | 0·1 | 0·1 | 1·4 | –0·6 | –0·9 |
| 1·11 ප්‍රංශය | — | — | 5·5 | 1·6 | 10·8 | 22·0 | 1·6 | 10·2 |
| 1·12 ජපානය | — | — | — | 10·0 | 31·3 | 24·0 | 18·3 | 13·7 |
| 1·13 ඉන්දියාව | — | — | — | 2·6 | 8·0 | –3·4 | 16·9 | 23·6 |
| 1·14 ජර්මන් ප්‍රජාතන්ත්‍රවාදී ජන රජය | — | — | — | — | 1·1 | 8·3 | 79·6 | 28·3 |
| 1·15 ඩෙන්මාර්කය | — | — | — | — | — | — | 1·6 | 8·0 |
| 1·16 ඉතාලිය | — | — | — | — | — | — | — | 6·3 |
| **2. දීමනා** | **31·1** | **31·9** | **24·1** | **41·5** | **19·2** | **29·0** | **19·5** | **56·5** |
| 2·01 කොළඹ ක්‍රමය | 8·2 | 6·0 | 9·0 | 25·9 | 17·5 | 22·1 | 1·4 | 23·1 |
| 2·01·1 ඕස්ට්‍රේලියාව | 2·5 | — | 3·9 | 0·3 | 4·6 | — | 0·1 | 4·8 |
| 2·01·2 කැනඩාව | 5·7 | 5·7 | 5·1 | 25·6 | 12·8 | 22·1 | — | 15·9 |
| 2·01·3 ජපානය | — | 0·3 | — | — | — | — | — | 2·4 |
| 2·01·4 නවසීලන්තය | — | — | — | — | 0·1 | ... | 1·3 | — |
| 2·02 වෙනත් | 22·9 | 25·9 | 15·1 | 15·6 | 1·7 | 6·8 | 18·2 | 33·3 |
| 2·02·1 එක්සත් ජාතීන්ගේ සංවිධානය | — | — | — | 1·0 | 1·5 | 6·3 | 3·1 | 2·0 |
| 2·02·2 චීන මහජන සමූහාණ්ඩුව | 19·7 | 24·5 | 15·1 | 2·5 | — | ... | ... | 4·7 |
| 2 02·3 අමෙරිකා එක්සත් ජනපදය | 0·9 | 1·4 | ... | 12·1 | 0·2 | 0·5 | 0·8 | 6·6 |
| 2·02·4 බටහිර ජර්මන් ජනරජය | 2·3 | — | ... | — | — | — | — | 6·4 |
| 2·02·5 චෙකොස්ලෝවෙකියාව | — | — | — | — | ... | — | — | — |
| 2·02·6 එක්සත් රාජධානිය | — | — | — | — | ... | ... | 14·3 | 13·6 |
| **3. ණය සහ දීමනාවල එකතුව** | **92·0** | **95·4** | **99·7** | **118·0** | **208·6** | **190·2** | **353·6** | **259·5** |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

† II වන පරිශිෂ්ඨයේ 30 වෙනි සංඛ්‍යා සටහනෙහි එන සම්බන්ධිත සංඛ්‍යාව සමග මෙම මුළු ණය පිළිබඳ සංඛ්‍යාව නොසැසඳේ. ඒ විදේශීය ණය ගෙවීම් ඇති වි. වි. හි. ස. රුපියල් දශ ලක්ෂ 39·2 ක ප්‍රමාණයක් මෙම සටහනේ දී සැළකිල්ලට නොගත් බැවිනි.

සේවක අර්ථසාධක අරමුදල හා "අනෙකුත් රාජ්‍ය සමායතනයන්" එනම් ප්‍රධාන වශයෙන් ලංකා ඛනිජ තෙල් සංස්ථාව, අත්හැරි කල්හි 1969/70 දී රජයේ ණය වැඩ පිළිවෙලට කළ බැංකු නොවන අංශයේ ශුද්ධ දයකයන්හි සාමාන්‍ය වැඩිවීමක් සිදුවී තිබේ. මෙයින් වැදගත්වනුයේ "අනෙකුත් සේවක අර්ථසාධක සහ විශ්‍රාම වැටුප් අරමුදල්", ඉතුරුම් ආයතන හා පුද්ගලයන්ගෙන් සිදුවූ දයකයන්හි වැඩිවීමය.

රජයට එහි රාජ්‍ය මූල්‍ය කටයුතු පියවීම සඳහා වර්ෂය තුළදී ලැබුණු මුළු විදේශීය මුදල් ප්‍රමාණය රුපියල් දශලක්ෂ 339 ක්වූ අතර එයට රුපියල් දශලක්ෂ 53 ක සංවර්ධන යෝජනා ක්‍රම ණය, රුපියල් දශලක්ෂ 229 ක සංවර්ධන යෝජනා ක්‍රම නොවන (භාණ්ඩ) ණය, හා රුපියල් දශලක්ෂ 57 ක දීමනා ඇතුළත් විය. නිදන් අරමුදල් දයක දීමනා හා ආපසු ගෙවීම් ඇති කළ විට ලැබුණු රුපියල් දශලක්ෂ 220 ක විදේශීය මුදල් ප්‍රමාණය ඉකුත් වසරේ ලද රුපියල් දශලක්ෂ 354 හා සැසඳේ. ඇත්තෙන්ම, නිදන් අරමුදල් දයක දීමනා නිසා සංවර්ධන යෝජනා ක්‍රම ණය පිළිබඳව රුපියල් දශලක්ෂ 19 ක ශුද්ධ ගෙවීමක් සිදුවූ අතර වර්ෂය සඳහා වූ එම ණයවල ලැබීම්වලට[1] වඩා ආපසු ගෙවීම් ඉහළ විය. එසේ වුවත්, රුපියල් දශලක්ෂ 183 ක සංවර්ධන යෝජනා ක්‍රම නොවන (භාණ්ඩ) ණය ශුද්ධ ලැබීම් හා රුපියල් දශලක්ෂ 57 ක දීමනා සංවර්ධන යෝජනා ක්‍රම ණය පිළිබඳවූ ශුද්ධ ගෙවීම් වඩාත් සමහන් කිරීමටත් වඩා වැඩි විය.

මෑත අවුරුදු වලදී, සංවර්ධන යෝජනා ක්‍රම නොවන (භාණ්ඩ) ණය වල වැඩිවීම විදේශ ආධාර උපයෝජනයෙහි කැපී පෙනෙන ලක්ෂණයක්ව පවතී. 1969/70 දී රුපියල් දශලක්ෂ 83 කින් රුපියල් දශලක්ෂ 229 දක්වා භාණ්ඩ ණය (ද්‍රව්‍යාධාර ණය) පහත වැටුණත්, තවමත් මේවා ශුද්ධ මූල්‍යාභිභයෙහි සියයට 24 ක අගයක් ගනී. 1969/70 දී ලැබුණු විදේශීය මුදල්වල දීමනා සංචරකයේ සැලකිය යුතු වැඩිවීමක් විය. මෑත අවුරුදුවල පහත යෑමකින් අනතුරුව වැඩිවූ මෙය එම වර්ෂයේ ලැබුණු මුළු විදේශීය මුදල් ප්‍රමාණයෙහි සියයට 26 ක ප්‍රතිශතයක් සැපයේ. කෙසේ වුවත් ඉකුත් වර්ෂයේදී මෙන්ම ණයවලින් ලැබුණු මුදල් විදේශීය මුදල් ප්‍රමාණයේ ප්‍රධාන කොටස ලෙස ගණන් ගැනේ.

II (ඊ) 11 වන සංඛ්‍යා සටහන, පසුගිය අට වසර තුළ මූලය හා වර්ගය අනුවවූ විදේශාධාර ශුද්ධ ලැබීම් විස්තර දක්වයි.

1. මූර්ත ගෙවුම් බරක් පිළිඹිබු කරනවාට වඩා තරමක් මෙම ශුද්ධ ගෙවුම් 1969/70 පටන්වූ වි. වි. හි. ස, අනුපාතයන්ට වාර්තාගත කෙරෙන ආපසු ගෙවුමක ප්‍රතිඵලය වන අතර, ලැබීම් නිල විනිමය අනුපාතිකය අනුව සඳහන් කෙරිණ.

## (ඌ) රාජ්‍ය ණය

1969/70 මුදල් වර්ෂයේදී රජයේ දළ ණය ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 985 කින් වැඩිවී, රුපියල් දශ ලක්ෂ 7, 873 ක් විය. (සැපයුම් කරුවන්ගේ ණය මුදල සම්බන්ධයෙන් රජයේ දෙපාර්තමේන්තුවල වගකීම මෙයට එකතු කළේ නම්, එය රුපියල් දශ ලක්ෂ 7,932 ක් වේ.) රජයේ නොබේරා ඉතිරිව ඇති මුළු දළ ණය ප්‍රමාණයෙන් සියයට 80 ක් හෙවත් රුපියල් දශලක්ෂ 6, 295 ක් දේශීය ණය ගැනීම් වූ අතර, ඉතිරිය (රුපියල් දශලක්ෂ 1,578 ක් හෙවත් මුළු ණය ගැනීම්වලින් සියයට 20 ක්) විදේශීය ණයවලින් සමන්විත විය. ශුද්ධ රාජ්‍ය ණය*, රුපියල් දශලක්ෂ 998 කින් වැඩි වී රුපියල් දශලක්ෂ 7, 737 ක් වුනි.

රාජ්‍ය ණයෙහි හිමිකම් හා සංයුතිය පිළිබඳ විස්තර දෙවෙනි පරිශිෂ්ඨයෙහි 37 වෙනි හා 38 වෙනි සංඛ්‍යා සටහන් වලින් දක්වෙන අතර, II (ඊ) 12 වෙනි සංඛ්‍යා සටහනෙහි එහි සාරාංශයක් දැක්වේ.

### II (ඊ) 12 වැනි සංඛ්‍යා සටහන

### 1966 සිට 1970 දක්වා මුළු රාජ්‍ය ණය (අ)

රුපියල් දශ ලක්ෂ

| සැප්තැම්බර් අවසානයට | 1966 | | 1967 | | 1963 | | 1969 | | 1970 | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ප්‍රමාණය රුපියල් දශලක්ෂ | % | ප්‍රමාණය රුපියල් දශලක්ෂ | % | ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ | % | ප්‍රමාණය රුපියල් දශලක්ෂ | % | ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ | % |
| 1· දළ ණය .. | 4,743·3 | 100·0 | 5,321·5 | 100·0 | 6,270·8 | 100·0 | 6,888·5 | 100·0 | 7,873·2 | 100·0 |
| I. විදේශීය .. | 548·8 | 11·6 | 739·3 | 13·9 | 1,074·3 | 17·1 | 1,375·5 | 20·0 | 1,578·4 | 20·1 |
| II. දේශීය .. | 4,194·5 | 88·4 | 4,582·2 | 86·1 | 5,196·5 | 82·9 | 5,513·0 | 80·0 | 6,294·8 | 79·9 |
| 2· ශුද්ධ ණය (ආ) .. | 4267·6 | 100·0 | 4,782·3 | 100·0 | 5,689·3 | 100·0 | 6,238·9 | 100·0 | 7,236·8 | 100·0 |
| I විදේශීය .. | 521·1 | 12·2 | 708·0 | 14·8 | 1,038·3 | 18·3 | 1,337·3 | 21·4 | 1,550·9 | 21·4 |
| II. දේශීය .. | 3,746·5 | 87·8 | 4,074·3 | 85·2 | 4,651·0 | 81·7 | 4,901·6 | 78·6 | 5,685·9 | 78·6 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) (I) 1970 සැප්තැම්බර් අවසානයට, පිළිවෙලින් රුපියල් දශ ලක්ෂ 116·0 ක සහ රුපියල් දශ ලක්ෂ 32·2 ක ජාතික නිවාස සහ රාජ්‍ය උකස් බැංකුවේ ණයකරයන් හැර; (II) සැපයුම් කරුවන්ගේ ණය මාර්ගයෙන් රජයේ දෙපාර්තමේන්තු විසින් ගෙන්වන ලද ආනයනයන් සම්බන්ධයෙන් වූ රුපියල් දශ ලක්ෂ 59·1 ක ණය මුදල හැර; (III) ජාත්‍යන්තර මූල්‍ය සංවිධානයන් වෙත නිකුත් කෙරුණු පොරොන්දු පත්‍ර හැර.

(ආ) රන් පවුම් හා රුපියල් ණය වෙනුවෙන් වූ නිදන් අරමුදල් හැර දළ ණය

සමාලෝචනයට භාජනය වන මුදල් වර්ෂයේදී, පිළිවෙලින් දළ හා ශුද්ධ ණයේ, රුපියල් දශ ලක්ෂ 985 හා රුපියල් දශ ලක්ෂ 998 ක වැඩිවීම්, ඉකුත් වසරේ වාර්තාගත ලෙස පිළිවෙලින් රුපියල් දශ ලක්ෂ 618 ක හා රුපියල් දශ ලක්ෂ 590 ක වැඩිවීම් සමග සසඳන කළ, ඊට වඩා වැඩි විය. 1969/70 මුදල් වර්ෂයේ, දළ ණයෙහි සිදු වූ රුපියල් දශ ලක්ෂ 985 ක වැඩිවීමෙන් රුපියල් දශ ලක්ෂ 782 ක් (සියයට 80 ක්) දේශිය ණය ගැනීම් නිසාද, රුපියල් දශ ලක්ෂ 203 ක් (සියයට 20 ක්) විදේශීය ණය ගැනීම් නිසාද විය. ඉකුත් මුදල් වර්ෂයේ දළ ණයේ දේශීය හා විදේශීය ණයවල වැඩිවීම් පිළිවෙලින් රුපියල් දශ ලක්ෂ 317 ක් හා රුපියල් දශ ලක්ෂ 301 ක් වුනි. එසේ 1969/70 මුදල් වසරේ දළ ණයෙහි රුපියල් දශ ලක්ෂ 782 කින් වූ වැඩිවීම, ඉකුත් මුදල් වසරවල සිදු වූ වැඩිවීම්වලට වඩා සැළකිය යුතු ලෙස ඉහල මට්ටමක පැවතිණ. මේ අතර 1969/70 වසරේ විදේශීය ණය වගකීමේ රුපියල් දශ ලක්ෂ 203 ක වැඩිවීම ඉකුත් මුදල්වසරේ වැඩිවීම සමග සසඳන කළ සැළකිය යුතු ලෙස පහත මට්ටමක පැවතුනි.

1970/71 මුදල් වසරේදී, බැංකු නොවන දේශීය මාර්ගයන්ගෙන් වූ ණය රුපියල් දශ ලක්ෂ 445 ක් හා විදේශීය මාර්ගයන්ගෙන් වූ ණය රුපියල් දශ ලක්ෂ 658 ක් ඉසිලීමට අපේක්ෂා කෙරේ. පසුව දැක්වූ රුපියල් දශ ලක්ෂ 658, රුපියල් දශ ලක්ෂ 133 ක සංවර්ධන යෝජනා ක්‍රම ණය හා රුපියල් දශ ලක්ෂ 525 ක සංවර්ධන යෝජනා ක්‍රම නොවන (භාණ්ඩ) ණයවලින් සමන්විත වේ.

* එනම්, දළ රාජ්‍ය ණයවලින් රුපියල් ණය නිදන් අරමුදල්වලට හා රන්පවුම් ණය නිදන් අරමුදල්වලට කෙරෙන දයක දීමනා අඩු කිරීමෙනි.

1. දේශීය ණය

1969/70 මුදල් වර්ෂය අවසානයේදී රුපියල් දශ ලක්ෂ 6,295 ක් වූ දළ දේශීය ණය ඉකුත් මුදල් වර්ෂයට වඩා රුපියල් දශ ලක්ෂ 782 ක වැඩිවීමක් පෙන් විය. පසුගිය මුදල් වර්ෂ හතරේ සැප්තැම්බර් අවසානයට, දේශීය ණය සංයුක්තිය හා වෙනස්කම් පහත දැක්වෙන II (ඊ) 13 වෙනි සංඛ්‍යා සටහනින් දැක්වේ

## II (ඊ) 13 වැනි සංඛ්‍යා සටහන

## දේශීය රාජ්‍ය ණය සංයුතියේ වෙනස්වීම්—1966—1970

රුපියල් දශ ලක්ෂ

| සැප්තැම්බර් මස අවසානයට | රුපියල් ණය | | | භාණ්ඩාගාර බිල්පත් | බදු සංචිත සහතික පත් | මහ බැංකු අත්තිකාරම් (ආ) | ජාතික සංවර්ධන පිළිනපත් (ඇ) | එකතුව | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | දළ | නිදන් අරමුදල් (අ) | ශුද්ධ | | | | | දළ | ශුද්ධ |
| 1966 | 2,474·6 | 448·0 | 2,026·6 | 1,425·0 | 32·2 | 262·6 | 0·1 | 4,194·5 | 3,746·5 |
| 1967 | 2,784·8 | 507·8 | 2,276·9 | 1,500·0 | 25·7 | 271·6 | 0·1 | 4,582·2 | 4,074·3 |
| 1968 | 3,117·9 | 545·5 | 2,572·4 | 1,750·0 | 24·0 | 304·5 | 0·1 | 5,196·5 | 4,651·0 |
| 1969 | 3,409·1 | 611·4 | 2,797·7 | 1,750·0 | 24·5 | 329·3 | 0·1 | 5,513·0 | 4·901·6 |
| 1970 | 3,924·9 | 608·9 | 3,316·0 | 1,950·0 | 45·4 | 374·4 | 0·1 | 6,294·8 | 5,685·9 |
| වෙනස 1967/66 | +310·2 | +59·8 | +250·3 | + 75·0 | −6·5 | + 9·0 | — | +387·7 | +327·8 |
| වෙනස 1968/67 | +333·1 | +37·7 | +295·5 | +250·0 | −1·7 | +32·9 | — | +614·3 | +576·7 |
| වෙනස 1969/68 | +291·2 | +65·9 | +225·3 | — | +0·5 | +24·8 | — | +316·5 | +250·6 |
| වෙනස 1970/69 | +515·8 | − 2·5 | +518·3 | +200·0 | +20·9 | +45·1 | — | +781·8 | +784·3 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) නිදන් අරමුදල් වෙනුවෙන් පැවති ආයෝජනයන්හි වෙළඳ වටිනාකම නියෝජනය කෙරේ. (අතිරේක නිදන් අරමුදල් ඇතුළත්ය.)

(ආ) ජා. මූ. අ., ජා. ප්‍ර. ස. බ., ජා. ස. ස. බැ., ආදියෙහි සාමාජික මුදල් ගෙවීම සඳහා වූ විශේෂ ණයද ඇතුළත්ය 1969 සහ 1970 සැප්තැම්බර් අගදී ණය පිළිවෙලින්, රුපියල් දශ ලක්ෂ 89·4 හා රුපියල් දශ ලක්ෂ 92·0 ක් වූ මෙම ණය හැරුණු විට, 1969/70 දී මහ බැංකු අත්තිකාරම් රුපියල් දශ ලක්ෂ 42·6 කින් වැඩි විය. ජාත්‍යන්තර මූල්‍ය සංවිධානයන් වෙනුවෙන් නිකුත් කළ පොරොන්දු පත්‍ර මෙම විශේෂ ණයවලට ඇතුලත් නොවේ.

(ඇ) 1969 යේ සැප්තැම්බර් අගදී නිකුත් කරන ලද හා ගෙවීමට නියමිත ජාතික සංවර්ධන පිළිනපත්හි වටිනාකම රුපියල් 58,828 ක් වූ අතර, මෙම වටිනාකම 1969 සැප්තැම්බර් මස අගදී නො වෙනස්ව පැවතුණි.

දළ දේශීය ණයෙහි රුපියල් දශ ලක්ෂ 782 කින් වූ වැඩිවීම, රුපියල් ණයෙහි රුපියල් දශ ලක්ෂ 516 ක වැඩිවීමකින්ද, භාණ්ඩාගාර බිල්පත්හි රුපියල් දශ ලක්ෂ 200 ක වැඩි- වීමකින් ද, බදු සංචිත සහතික පත්වලින් වූ රුපියල් දශ ලක්ෂ 21 ක වැඩිවීමකින් හා මහ බැංකු අත්තිකාරම්හි රුපියල් දශ ලක්ෂ 45 ක වැඩිවීමකින් ද සමන්විත විය. ඉකුත් වර්ෂයේ දේශීය ණයේ රුපියල් දශ ලක්ෂ 317 කින් වූ වැඩිවීම, රුපියල් දශ ලක්ෂ 291 කින් රුපියල් ණය හා රුපියල් දශ ලක්ෂ 25 කින් මහ බැංකු අත්තිකාරම්, වැඩිවීමෙහි හා බදු සංචිත සහතිකයන්හි ආන්තිකයක වැඩිවීමෙහි අන්‍යොන්‍ය ප්‍රතිඵලයකි.

1970 සැප්තැම්බර් 30න් අවසන් වන මුදල් වසර සඳහා වූ දළ දේශීය ණයෙහි එතරම් සැළකිය යුතු ව්‍යුහමය වෙනස්වීම් නොමැත. මුළු දළ දේශීය ණය ප්‍රමාණයෙන් රුපියල් ණය සුරැකුම්පත් කොටස සියයට 62 ක්ව පෙරසේම පවතිද්දී, භාණ්ඩාගාර බිල්පත් කොට- සෙහි සියයට 32 සිට සියයට 31 දක්වා ආන්තික බැස්මක් විය. මේ අතර, මහ බැංකු අත්තිකාරම් හා බදු සංචිත සහතිකයන් පිළිබඳ අනුපාතයන්ගේ වෙනස්වීම් නොසැළකිය යුතු තරම් විය.

1970 සැප්තැම්බර් අවසානයට දළ දේශීය ණයෙහි කල් පිරීමේ රටාව පදනම් කොටගෙන කරන ලද විශ්ලේෂණයක් ඉකුත් මුදල් වර්ෂ හතර සඳහා අනුරූප සංඛ්‍යා සමඟ II (ඊ) 14 වෙනි සංඛ්‍යා සටහනින් දැක්වේ.

## II (ඊ) 14 වැනි සංඛ්‍යා සටහන
## කල්පිරීම අනුව දේශීය ණය විශ්ලේෂණය
### (සැප්තැම්බර් අවසානයට)

| | 1966 | | 1967 | | 1968 | | 1969 | | 1970 | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ප්‍රමාණය රු. දශලක්ෂ | ප්‍රතිශතය | ප්‍රමාණය රු. දශලක්ෂ | ප්‍රතිශතය | ප්‍රමාණය රු. දශලක්ෂ | ප්‍රතිශතය | ප්‍රමාණය රු. දශලක්ෂ | ප්‍රතිශතය | ප්‍රමාණය රු. දශලක්ෂ | ප්‍රතිශතය |
| 1· අරමුදල්ගත නොවූ ණය (අ) .. | **1,719·9** | **41·0** | **1,797·3** | **39·2** | **2,078·6** | **40·0** | **2,103·8** | **38·2** | **2,369·9** | **37·6** |
| 2· අරමුදල්ගත ණය (ආ) .. | **2,474·6** | **59·0** | **2,784·8** | **60·8** | **3,117·9** | **60·0** | **3,408·6** | **61·8** | **3,924·9** | **62·4** |
| 2·1 මුල් පස් වස .. | 292·1 | 7·0 | 330·6 | 7·2 | 452·1 | 8·7 | 534·9 | 9·7 | 491·1 | 7·8 |
| 2·2 වස 5—10 .. | 354·4 | 8·4 | 289·6 | 6·3 | 315·7 | 6·1 | 235·8 | 4·3 | 383·2 | 6·1 |
| 2·3 වස 10—15 .. | 386·0 | 9·2 | 386·0 | 8·4 | 249·1 | 4·8 | 247·0 | 4·5 | 534·6 | 8·5 |
| 2·4 වස 15—20 .. | 324·1 | 7·7 | 421·8 | 9·2 | 600·0 | 11·5 | 795·0 | 14·4 | 1,047·4 | 16·6 |
| 2·5 වස 20—25 .. | 1,118·0 | 26·7 | 1,356·8 | 29·6 | 1,501·0 | 28·9 | 1,595·9 | 29·0 | 1,468·5 | 23·3 |
| 3. එකතුව .. .. | **4,194·5** | **100·0** | **4,582·1** | **100·0** | **5,196·5** | **100·0** | **5,512·4** | **100·0** | **6,294 8** | 100·0 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

(අ) භාණ්ඩාගාර බිල්පත්, බදු සංචිත සහතිකපත්, මහ බැංකු අත්තිකාරම් සහ ජාතික සංවර්ධන පිළිණපත් ඇතුලත්ව.
(ආ) කල්පිරෙන අවසන් දිනට.

1969/70 වසරේදී, අරමුදල්ගත ණයවලට (මුළු මණින්ම රුපියල් සුරැකුම්පත්වලින් සමන්විත) වූ අරමුදල් ගත නොවූ ණයවල (මුළුමණින්ම භාණ්ඩාගාර බිල්පත්වලින් සමන්විත) අනුපාතය කලින් මුදල් වර්ෂ හතරේ මෙන් දළ වශයෙන් 2 : 3 ක්ව පැවතිණ. එසේ වුවද, එහි අරමුදල්ගත නොවූ ණය දරූ කොටසෙහි ක්‍රමික පිරිහීමක් දැකිය හැකිය. (1966 සැප්තැම්බර් මස අවසානයේදී සියයට 41 ක සිට 1970 සැප්තැම්බර් අවසානයේදී සියයට 38 ක් විය.) තවද, පළමු වසර 5 තුළදී, පරිණත වන සුරැකුම්පත් සහ වර්ෂ 20 – 25 දක්වා කාලය තුළදී පරිණත වන සුරැකුම්පත්, දරූ කොටසෙහිද සුළු පිරිහීමක් දක්නට ලැබේ. මේ අතර අවුරුදු 5 – 20 දක්වා කාලය තුළ පරිණත වන සුරැකුම්පත් දරණ කොටසෙහි සාපේක්ෂ වැඩිවීමක් සිදුවී ඇත. මෙයට හේතුවක් වී ඇත්තේ 1969/70 දී සම්පත් රැස්කිරීම සඳහා දිගුකාලීන ණය නිකුතුවෙන් මැදි කාලීන ණය නිකුතුවට වූ විතැන්වීමක බලපෑමයි. පසුගිය වසරේ වාර්ෂික වාර්තාවෙන්[1] පෙනී යන දෙයක් නම්, කල් පිරීම් (පරිනතවීම්) අසමාන ලෙස ව්‍යාප්තව පැවති අතර, කෙටි හා මැදි කාලීන ණය නිකුත් කිරීම මගින් වඩාත් සමාන ලෙස ණය ආපසු ගෙවීම පුළුල් කිරීම සඳහා යම් යම් ඉඩකඩ පැවති බවයි. එයින් සමාලෝචනය කෙරෙන වසරේ දිගු කාලීන ණයවලට වැඩි වරණයක් ඇතිව මැදි හා කෙටිකාලීන ණය නිකුතුව සිදු වුවද, කෙටි-කාලීන හා මැදි කාලීන ණය නිකුත් කිරීම සඳහා තවමත් ඉඩකඩ ඇත.

(i) රුපියල් සුරැකුම්පත්

1969/70 මුදල් වර්ෂයේ රුපියල් දශ ලක්ෂ 579 ක මුදලක් සඳහා රජයේ ණය නිකුතු 15 ක් විය. මෙම ගණනින් රුපියල් දශ ලක්ෂ 27 ක් පරිවර්ත්‍යය ණය 3 ක් හී විය. ඉකුත් මුදල් වසරේ රජයේ ණය නිකුතු 11 කින්, රුපියල් දශ ලක්ෂ 340 ක ණය මුදලක් ඉසිලීය. (1968/69 වර්ෂයේදී පරිවර්ත්‍ය ණය නොවුනි) 1969/70 දී රජයට ලැබුණු ණය මුදලෙහි මෙම සැළකිය යුතු වැඩිවීම ප්‍රධාන වශයෙන් වාණිජ බැංකු[2] හා ඉතුරුම් ආයතනයන්[3] විසින් වැඩි කළ දයක පංගු පිළිවෙලින් රුපියල් දශ ලක්ෂ 118 (හෙවත් සියයට 20) ක්, හා රුපියල් දශලක්ෂ 156[4] (හෙවත් සියයට 27 ක්) නිසා සිදු විය. සේවක අර්ථසාධක අරමුදල (රුපියල් දශලක්ෂ 98 ක් හෙවත් සියයට 17 කි), නිදන් අරමුදල් (රුපියල් දශ ලක්ෂ 83 ක් හෙවත් සියයට 14 කි), භාරකාර මණ්ඩල, සුභසාධක, විශ්‍රාම, වැටුප් හා වෙනත් සේවක අර්ථසාධක අරමුදල් (රුපියල් දශ ලක්ෂ 54 ක් හෙවත් සියයට 9 කි) හා ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව (රුපියල් දශ ලක්ෂ 46 ක් හෙවත් සියයට 8 කි,) අනෙකුත් ප්‍රධාන දායකයෝ වූහ.

1969/70 දී නිකුත් කරන ලද එක් එක් රුපියල් ණය සඳහා දයක ගෙවීම පිළිබඳ විස්තර 11 වෙනි පරිශිෂ්ඨයේ 40 වෙනි සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත. ඉකුත් මුදල් වර්ෂ හතර තුළදී නිකුත් කරන ලද රුපියල් ණය සඳහා වූ ගෙවීම් ප්‍රමාණයන් II (ඊ) 15 වෙනි සංඛ්‍යා සටහනෙහි සාරාංශ කොට දක්වේ.

ඉකුත් මුදල් වසරේ අත් දුටුවා වූ පහත වැටෙන උපනතිය හා සැසැඳීමේදී, රුපියල් ණය මූලයෙන් රජය විසින් රැස් කළ සම්පත් ප්‍රමාණය තියුණු ලෙස වැඩි විය. පසුගිය සිව් වසර තුළ ක්‍රමයෙන් රජයේ සුරැකුම්පත්වලට ඇතුලුවීම අඩු කොට තිබූ බැංකු අංශයේ[1] දයකයෙහි ඉහළ යාම නිසා මෙය ප්‍රධාන වශයෙන් සිදුවුනි. 1968/69 වසරේදී රුපියල් දශ ලක්ෂ

---

1. මහ බැංකු වාර්තාව, 1969, පිට 168.

2. රජය විසින් කළ රුපියල් දශ ලක්ෂ 125 ක නොම්බරු ආහාර (දයක) බිල් බෙරුම් කිරීමට යාම නිසා ලංකාණ්ඩුවේ 1982 – 85 'ඊ' කාණ්ඩයේ ණයට ·බැංකු ක්‍රමය රුපියල් දශ ලක්ෂ 118 දයක විය.

3. තැපැල් කන්තෝරු ඉතුරුම් බැංකුව, ලංකා ඉතුරුම් බැංකුව, සහ ඉතුරුම් සහතික පත් අරමුදල මෙයට අඩංගු වේ.

4. මෙම ගණනින්, රුපියල් දශ ලක්ෂ 155·5 කට තැපැල් කන්තෝරු ඉතුරුම් බැංකුව දයක විය. තැ·ක· ඉ·බැ· විසින් ශ්‍රී ලංකා මහ බැංකුවට කළ රුපියල් දශ ලක්ෂ 144 ක පහත්-එලදවක් ගෙන දෙස සුරැකුම්පත් අලෙවිය, පූර්වය, 'ඊ' කාණ්ඩ 1982–85 වූ ලංකාණ්ඩු ණයට දයක කිරීමට සමත් විය.

## II (ඊ) 15 වැනි සංඛ්‍යා සටහන

## රුපියල් සුරැකුම්පත් සඳහා ගෙවුම් වර්ග කිරීම

| දයකයා | 1966/67 | | 1967/68 | | 1968/69 | | 1969/70 | |
|---|---|---|---|---|---|---|---|---|
| | ප්‍රමාණය රු. ද. ලක්ෂ | ප්‍රතිශතය | ප්‍රමාණය රු. ද. ලක්ෂ | ප්‍රතිශතය | ප්‍රමාණය රු. ද. ලක්ෂ | ප්‍රතිශතය | ප්‍රමාණය රු. ද. ලක්ෂ | ප්‍රතිශතය |
| **1· බැංකු අංශය ..** | **13·5** | **3·5** | **0·8** | **0·2** | **0·6** | **0·2** | **117·5** | **20·3** |
| 1·1 වෙළඳ බැංකු .. | 13·5 | 3·5 | 0·8 | 0·2 | 0·6 | 0·2 | 117·5 | 20·3 |
| **2· බැංකු නොවන අංශය ..** | **377·3** | **96·5** | **358·9** | **99·7** | **339·4** | **99·8** | **461·7** | **79·7** |
| 2·1 ඉතුරුම් ආයතනයන් .. | 74·6 | 19·1 | 48·8 | 13·6 | 36·0 | 10·6 | 156·1 | 26·9 |
| 2·2 නිදන් අරමුදල් .. | 96·3 | 24·6 | 144·1 | 31·7 | 111·8 | 32·9 | 83·0 | 14·3 |
| 2·3 දෙපාර්තමේන්තු හා වෙනත් නිල අරමුදල් .. | 10·2 | 2·6 | 9·5 | 2·6 | 8·4 | 2·5 | 6·2 | 1·1 |
| 2·4 සේවක අර්ථසාධක අරමුදල .. .. | 85·0 | 21·8 | 92·6 | 25·7 | 101·3 | 29·8 | 97·9 | 16·9 |
| 2·5 රක්ෂණ සංස්ථාව .. | 47·9 | 12·3 | 53·2 | 14·8 | 42·5 | 12·5 | 45·5 | 7·9 |
| 2·6 පෞද්ගලික අර්ථසාධක විශ්‍රාම වැටුප් අරමුදල් .. | 43·1 | 11·0 | 29·2 | 8·1 | 36·8 | 10·8 | 53·9 | 9·3 |
| 2·7 රක්ෂණ සමාගම් .. | 10·6 | 2·7 | 4·4 | 1·2 | 0·6 | 0·2 | 16·1 | 2·8 |
| 2·8 වෙනත් සමාගම් .. | 0·3 | 0·1 | 0·8 | 0·2 | 0·2 | 0·1 | 0·6 | 0·1 |
| 2·9 පුද්ගලයන්, සමාජ හා ආයතනයන් .. | 9·2 | 2·3 | 6·6 | 1·8 | 1·5 | 0·4 | 2·5 | 0·4 |
| **3· මුළු ගණන .. ..** | **390·8** | **100·0** | **359·7** | **100·0** | **340·0** | **100·0** | **579·2** | **100·0** |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

(අ) රුපියල් ණය පමණක් සඳහන් වේ.

36ක් දයක කොට තිබෙන ඉතුරුම් ආයතනයන් 1969/70 වසරේදී ඔවුන්ගේ දයක ගෙවීමේ රුපියල් දශලක්ෂ 156[1] දක්වා සැළකිය යුතු ප්‍රමාණයකින් වැඩි කළේය. මේ අතර බැංකු නොවන පෞද්ගලික අංශය මගින් කළ දයක ගෙවුම වූ 1968/69 වසරේ රුපියල් දශ ලක්ෂ 39 1969/70 දී රුපියල් දශ ලක්ෂ 73 දක්වා වැඩි විය. පුද්ගලික අංශය මගින් වැඩි කළ දායක ගෙවුම් ප්‍රධාන වශයෙන් ඇති වූයේ, පුද්ගලික භාරකාර මණ්ඩල ශුභ සාධක, විශ්‍රාම වැටුප් හා අර්ථසාධක අරමුදල් (සේවක අර්ථසාධක අරමුදලට වඩා වෙනස්) වලින් ය.

අවුරුදු ගණනාවක (1968/69 වසරේ අඩුවීම හැර) ඔවුන්ගේ දයක ගෙවීම් වැඩි කරමින් පැවති අර්ධ රාජ්‍ය ආයතනයන් (නිදන් අරමුදල්, දිගු කාලීන ඉතුරුම් ආයතන, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව හා වෙනත් නිල අරමුදල් ඇතුළුව) 1969/70 දී රුපියල් දශ ලක්ෂ 89 ක තියුණු වැඩිවීමක් පෙන් විය. මෙය ප්‍රධාන කොට සිදු වූයේ ඉතුරුම් ආයතනයන් කළ දයක ගෙවීම්හි වැඩිවීමෙනි. මෙම අංශය, පසුගිය මුදල් වර්ෂයේදී මෙන්ම නිකුත් කළ රුපියල් ණය සඳහා ප්‍රධාන දයක කරුවීම නොකඩවා පවත්වාගෙන ගියත්, එය 1968/69 වර්ෂයේ ලබාගත් සියයට 88 ක දයක කොටස් ප්‍රමාණය 1966/70 දී සියයට 67 දක්වා අඩු වුනි.

ඉකුත් මුදල් වර්ෂ හතර සඳහා ඇති තුලනාත්මක දත්තයන් සමඟ 1968/69 මුදල් වර්ෂය අගදී පැවති රජයේ සුරකුම්පත්වල හිමිකම් වර්ග කිරීමක්, II (ඊ) 16 වෙනි සංඛ්‍යා සටහනින් දක්වා තිබේ.

1· මෙම ගණනින් රුපියල් දශ ලක්ෂ 155·5 කට තැපැල් කන්තෝරු ඉතුරුම් බැංකුව දයක විය තැ·කා·ඉ·බැංකුව ශ්‍රී ලංකා බැංකුවට කළ රුපියල් දශ ලක්ෂ 144 ක පහන්-එලදවක් ගෙන දෙන සුරැකුම්පත්අලෙවිය. පූර්වය 'ඊ' කාණ්ඩ 1982-85 වූ ලංකාණ්ඩුවේ ණයට දයක කිරීමට සමත් විය.

## II (ඊ) 16 වෙනි සංඛ්‍යා සටහන.

### රුපියල් සුරැකුම්පත්වල හිමිකම - වර්ෂයන් අවසානයට 1965/66 සිට 1969/70 (අ)

(රුපියල් දශලක්ෂ)

| හිමියන් | 1965/66 | 1966/67 | 1967/68 | 1968/69 | 1969/70 |
|---|---|---|---|---|---|
| 1· බැංකු අංශය .. | **324·5** | **281·2** | **328·8** | **367·0** | **586·0** |
| 1·1 මහ බැංකුව .. | 8·0 | 7·4 | 70·0 | 111·8 | 249·0 |
| 1·2 වාණිජ බැංකු .. | 316·4 | 273·7 | 258·8 | 255·3 | 337·0 |
| 2· බැංකු නොවන අංශය .. | **2,150·2** | **2,503·6** | **2,789·0** | **3,042·0** | **3,338·9** |
| 2·1 ඉතුරුම් ආයතන .. | 511·6 | 600·5 | 641·2 | 641·7 | 651·5 |
| 2·2 නිදන් අරමුදල් .. | 407·0 | 474·2 | 532·3 | 614·1 | 696·2 |
| 2·3 දෙපාර්තමේන්තු හා වෙනත් නිල අරමුදල් .. | 123·8 | 140·0 | 147·1 | 150·8 | 156·2 |
| 2·4 සේවක අර්ථසාධක අරමුදල .. | 434·8 | 519·8 | 612·1 | 713·5 | 811·4 |
| 2·5 වෙනත් අර්ථසාධක අරමුදල් .. | 322·9 | 364·3 | 394·5 | 423·2 | 469·3 |
| 2·6 රක්ෂණ සංස්ථාව .. | 133·8 | 181·6 | 234·5 | 276·9 | 322·4 |
| 2·7 රක්ෂණ සමාගම් .. | 136·6 | 136·5 | 140·7 | 139·0 | 149·8 |
| 2·8 වෙනත් රාජ්‍ය සංස්ථා .. | 3·5 | 2·9 | 2·9 | 2·9 | 2·2 |
| 2·9 වෙනත් (ආ) .. | 76·3 | 83·8 | 83·7 | 79·8 | 79·8 |
| 3· මුළු ගණන .. .. | 2,474·6 | 2,784·8 | 3,117·9 | 3,409·1 | 3,924·9 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) රුපියල් ණයවලට පමණක් සීමාවේ.

(ආ) සමුපකාර බැංකු, වෙනත් සමාගම්, සමාජ, ආයතන සහ පුද්ගලයන් ඇතුලත් වේ.

සමාලෝචනය වන මුදල් වර්ෂයේ රජය දරූ රුපියල් සුරැකුම්පත් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 3, 925 ක් විය. මෙය රුපියල් දශ ලක්ෂ 516 ක හෙවත් සියයට 15 ක වැඩිවීමක් පෙන්වයි. මෙම වැඩිවීමෙන් රුපියල් දශ ලක්ෂ 219 ක් බැංකු අංශයෙන් ද, රුපියල් දශ ලක්ෂ 297 ක් බැංකු නොවන අංශයෙන් ද සිදුවුනි.

1969/70 මුදල් වසරේ මහ බැංකුව සතු සුරැකුම්පත් ප්‍රමාණයන් රු. දශ ලක්ෂ 137 කින් වැඩිවෙද්දී වාණිජ බැංකු ඔවුන්ගේ රුපියල් සුරැකුම්පත් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 82 කින් වැඩි කළේය. මහ බැංකුවේ සුරැකුම්පත් දැරීම් වැඩිවීම සිදු වූයේ, රජයේ නව තොගයන්හි ආයෝජනය කිරීමට සමත් වියහැකි වීම සඳහා තැපැල් කන්තෝරු ඉතුරුම් බැංකුවෙන්, බැංකුව විසින් රුපියල් දශ ලක්ෂ 144 ක (අවුරුද්ද ගෙවීමේදී පරිණත වූ තොගයන්ගෙන් කොටසක් සමහන් වී) සුරැකුම්පත් මිලදී ගැනීමට යාම නිසාය. මෙලෙසට සමාලෝචනය වන වසරේදීද; ශ්‍රී ලංකා මහ බැංකුව රජයේ රුපියල් ණය වැඩ පිළිවෙළට (අවක්‍ර ලෙසින්) ආධාර දීමේ ප්‍රතිපත්තිය නොකඩවා පවත්වාගෙන ගියේය.

බැංකු නොවන අංශය තුල, ඉතුරුම් ආයතනයන්, නිදන් අරමුදල්, සේවක අර්ථසාධක අරමුදල, හා ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව යන මේවායින් නියෝජනය වූ අර්ධ රාජ්‍ය ආයතනයන් රුපියල් සුරැකුම් පත් හි ප්‍රධාන පංගුව දැරිය. කෙසේ වුවත් වර්ෂය තුළදී අනෙකුත් අර්ධ රාජ්‍ය ආයතනයන් හා සැසඳීමේදී ඉන් ඉතුරුම් ආයතනයන් දැරූ සුරැකුම්පත් ප්‍රමාණයේ වැඩිවීම එතරම් සැලකිය යුතු නොවන්නේය.

### (ii) භාණ්ඩාගාර බිල්පත්

1970 සැප්තැම්බර් අවසානය වන විට නිකුත් කරනු ලැබ නොබේරා ඉතිරිව ඇති භාණ්ඩාගාර බිල්පත්වල වටිනාකම රුපියල් දශ ලක්ෂ 1950 ක්ව පැවති අතර, වර්ෂය තුළ රුපියල් දශලක්ෂ 200 ක වැඩිවීමක් පෙන්නුම් කෙරේ. මීට පෙර වර්ෂය තුළදී භාණ්ඩාගාර බිල්පත් නිකුතුවේ ශුද්ධ වැඩිවීමක් නොවිණ. භාණ්ඩාගාර බිල්පත් නිකුතුව පිළිබඳ නීත්‍යානුකූල සීමාව 1969/70 දී මුදල් වසරේදී රුපියල් දශලක්ෂ 1950 ක්ව, නොවෙනස්ව පැවතුණි.

භාණ්ඩාගාර බිල්පත් නිකුතුව පිළිබඳ විස්තර II වැනි පරිශිෂ්ඨයේ 41 වැනි සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත. 1970 සැප්තැම්බර් අවසානයේදී භාණ්ඩාගාර බිල්පත් හිමිකම පිළිබඳ වර්ගීකරණයක් කලින් මුදල් වර්ෂ හතරෙහි සාපේක්ෂ සංඛ්‍යා තොරතුරු සමග II (ඊ) 17 වැනි සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත.

## II (ඊ) 17 වෙනි සංඛ්‍යා සටහන

### භාණ්ඩාගාර බිල්පත් අයිතිය - 1965/66-1969/70 වර්ෂ අවසානයේදී

රුපියල් දශලක්ෂ

| හිමියෝ | 1965/66 | 1966/67 | 1967/68 | 1968/69 | 1969/70 |
|---|---|---|---|---|---|
| 1· බැංකු අංශය .. | **1,369·3** | **1,456·7** | **1,682·2** | **1,691·4** | **1,880·3** |
| 1·1 මහ බැංකුව .. | 1,257·9 | 1,377·2 | 1,586·3 | 1,637·3 | 1,833·8 |
| 1·2 වාණිජ බැංකු .. | 111·4 | 79·5 | 95·9 | 54·1 | 46·5 |
| 2· බැංකු නොවන අංශය .. | **55·7** | **43·3** | **67·8** | **58 6** | **69·7** |
| 2·1 නිදන් අරමුදල් .. | 42·9 | 36·6 | 60·3 | 41·4 | 55·3 |
| 2·2 සේවක අර්ථසාධක අරමුදල .. | — | 0·3 | — | 0·3 | 0·3 |
| 2·3 වෙනත් අර්ථසාධක අරමුදල් .. | 0·2 | 0·1 | 0·1 | ... | ... |
| 2·4 ඉතුරුම් ආයතන .. | 0 4 | 0·2 | 1·1 | 1·3 | 2·4 |
| 2·5 රක්ෂණ සමාගම් .. | 5·8 | 6·0 | 6·0 | 11 2 | 8·9 |
| 2·6 වෙනත් (අ) .. | 6·4 | 0·1 | 0·3 | 4·5 | 2·8 |
| 3· මුළු ගණන .. | **1,425·0** | **1,500·0** | **1,750 0** | **1,750·0** | **1,950·0** |

මූලය; ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) සමුපකාර බැංකු, අනෙක් සමාගම්, සමාජ, ආයතන හා පුද්ගලයන් ඇතුළත් වේ.

භාණ්ඩාගාර බිල්පත් නිකුතුවේ සිදුවූ රුපියල් දශලක්ෂ 200 යේ වැඩිවීමෙන් රුපියල් දශලක්ෂ 189 ක් බැංකු අංශය හිමි කරගත් අතර ශේෂයවූ රුපියල් දශලක්ෂ 11 බැංකු නොවන අංශය හිමි කර ගති. බැංකු ක්‍රමය තුළ, මහ බැංකුව සතු භාණ්ඩාගාර බිල්පත් ප්‍රමාණය රුපියල් දශලක්ෂ 197 කින් වැඩිවූ නමුත් වාණිජ බැංකු සතු භාණ්ඩාගාර බිල්පත් ප්‍රමාණය රුපියල් දශලක්ෂ 8 කින් අඩුවී ඇත. බැංකු නොවන අංශයේ භාණ්ඩාගාර බිල්පත් අයිතියෙහි එකම වැදගත් වෙනස්වීම නිදන් අරමුදල් පිළිබඳව වේ. භාණ්ඩාගාර බිල්පත් වෙළඳපල, මහ බැංකුව මත රඳීම නොකඩවා පවත්වා ගෙන යන අතර, එහි භාණ්ඩාගාර බිල්පත් අයිතිය, 1965/66 අවසානයේදී රුපියල් දශලක්ෂ 1, 258 සිට 1969/70 අවසානයේ රුපියල් දශලක්ෂ 1, 834 දක්වා ක්‍රමයෙන් වැඩිවී ඇත.

මුදල් වර්ෂය ආරම්භයේදී භාණ්ඩාගාර බිල්පත්වල වාර්ෂික ගෙවුම් අනුපාතිකය සියයට 3.64 ක්ව පැවතිණ. එම අනුපාතිකය 1970 පෙබරවාරි 15 වැනි දින සියයට 4. 76 දක්වා වැඩිවූ අතර 1970 සැප්තැම්බර් අවසානය දක්වාම එය එම මට්ටමේම පැවතුණි භාණ්ඩාගාර බිල්පත් සඳහා මහ බැංකුවේ වාර්ෂික ගෙවුම් අනුපාතිකයවූ සියයට 3.24 1969/1970 මුදල් වර්ෂය මුළුල්ලේම පැවතුණි.

(iii) බදු සංචිත සහතික

බදු සංචිත සහතික සඳහා බලය දී ඇති රුපියල් දශලක්ෂ 400 ක්වූ උපරිම ප්‍රමාණයෙන් රුපියල් දශලක්ෂ 354 ක්, 1970 සැප්තැම්බර් අවසානය වන විට නිකුත් කර තිබුණු අතර එදින වන විට පවරා නොතිබුණ ප්‍රමාණය රුපියල් දශලක්ෂ 15 ක් විය. කලින් මුදල් වර්ෂයේ අවසානය වන විට පවරා නොතිබුණ ප්‍රමාණය රුපියල් දශලක්ෂ 25 ක් වූයෙන් මෙම මුදල් වර්ෂය තුළ මෙම වර්ගයේ ණයවල ප්‍රමාණය රුපියල් දශලක්ෂ 21 කින් වැඩිවී ඇත. 1957 දී බදු සංචිත සහතික පත් නිකුතු ආරම්භයේ සිට පැවති කවර මුදල් වර්ෂයක එම වර්ගයේ ණයවල නැගීමකට වඩා මෙය ඉහළම නැගීම වන අතර පවරා නොතිබුණු ප්‍රමාණයේද ඉහළම ප්‍රමාණය මෙය විය.

මුදල් වර්ෂයආරම්භයේදී පැවති සියයට 2 ක් වූ පොලී අනුපාතිකය[1] 1970 මාර්තු 31 වවනි දින සිට සියයට 3% දක්වා වැඩිකෙරිණි..

(iv) මහ බැංකු අත්තිකාරම්

මුදල් නීති පණතේ 89 වෙනි වගන්තිය යටතේ මහ බැංකුව විසින් රජයට දෙනු ලබන අත්තිකාරම්වල ප්‍රමාණය 1969/70 මුදල් වර්ෂයේදී රුපියල් දශලක්ෂ 45 ක් විය. ආසියානු සංවර්ධන බැංකුවට ලංකාවේ සාමාජික මුදල් ගෙවීම සඳහා මහ බැංකුව විසින් දෙන ලද රුපියල් දශලක්ෂ 2. 5 ක විශේෂ ණයක්ද ඊට ඇතුළත් විය. කලින් වර්ෂයේදී මහ බැංකු අත්තිකාරම්වල ප්‍රමාණය රුපියල් දශලක්ෂ 25 ක් විය.

1970 සැප්තැම්බර් අවසානය වන විට එම අත්තිකාරම්වල ප්‍රමාණය රුපියල් දශලක්ෂ 374 ක්වූ අතර කලින් වර්ෂය අවසානයේදී එය රුපියල් දශලක්ෂ 329 ක් වුනි. ජාත්‍යන්තර මූල්‍ය සංවිධානවලට ලංකාවේ සාමාජික මුදල් ගෙවීම සඳහා 1969 සැප්තැම්බර් අවසානය වන විට රුපියල් දශලක්ෂ 89 ක්ද, 1970 සැප්තැම්බර් අවසානය වන විට රුපියල් දශලක්ෂ 92 ක්ද විශේෂ ණය වශයෙන් මහ බැංකුව විසින් රජයට දෙන ලදී.

2. විදේශ ණය

1970 සැප්තැම්බර් අවසානය වන විට මුළු විදේශීය ණය (දළ)[2] රුපියල් දශලක්ෂ 1, 578 ක් විය. 1969/70 මුදල් වර්ෂයේදී දළ විදේශීය ණයවල වැඩිවීම රුපියල් දශලක්ෂ 188 ක් (විදේශීය ණය රුපියල් දශලක්ෂ 15 කින් වැඩි කළ, 1969 ඔක්තෝබර් 22 දින ජර්මන් මාර්කයෙහි අගය අතිප්‍රමාණය කිරීමේ ශුද්ධ ප්‍රතිවිපාකය හැර) විය. සැසඳීමේදී (ලංකාවේ ණයගැති බව රුපියල් දශලක්ෂ 5 කින් අඩු කරන ලද) ප්‍රංශ ෆ්‍රෑන්කයේ අගය අවප්‍රමාණ කිරීම සැකිල්ල භාජනය කිරීමට පෙර, කලින් වර්ෂය තුළ දළ විදේශීය ණයවල ප්‍රමාණයේ වැඩිවීම රුපියල් දශලක්ෂ 306 ක් විය.

1969/70 මුදල් වර්ෂයේදී රුපියල් දශ ලක්ෂ 283 ක විදේශීය ණය ප්‍රමාණයක් උපයෝජනය කර ගන්නා ලද අතර එම ප්‍රමාණයෙන් රුපියල් දශලක්ෂ 61 ක් ( සියයට 22 ක් ) සංවර්ධන යෝජනා ක්‍රම ණය වශයෙන්ද, රුපියල් දශලක්ෂ 221 ක් ( සියයට 78 ක් ) සංවර්ධන යෝජනා ක්‍රම නොවන (භාණ්ඩ) ණය වශයෙන්ද ලැබිණ. කලින් වර්ෂය තුළදී සංවර්ධන යෝජනා ක්‍රම ණය සහ සංවර්ධන යෝජනා ක්‍රම නොවන ( භාණ්ඩ ) ණය පිළිවෙලින් රුපියල් දශලක්ෂ 94 ක් හා රුපියල් දශලක්ෂ 283 ක් විය. ඒ අනුව, විමර්ශනයට භාජනය වී ඇති වර්ෂය තුළදී ලැබී ඇති විදේශීය ආධාර පරිමාව කලින් වර්ෂයට වඩා සැලකිය යුතු ලෙසින් පහළ බැස ඇත.

1969/70 දී විදේශ ණයවලින් රුපියල් දසලක්ෂ 94 ක් ආපසු ගෙවා ඇත. මෙම ප්‍රමාණයෙන්, රුපියල් දශලක්ෂ 18 ක් (සියයට 19 ක්) රන් පවුම් ණය වෙනුවෙන්ද, රුපියල් දශලක්ෂ 46 ක් ( සියයට 49 ක්) සංවර්ධන යෝජනා ක්‍රම ණය වෙනුවෙන්ද, රුපියල් දශලක්ෂ 30 ක් ( සියයට 32 ක් ) සංවර්ධන යෝජනා ක්‍රම නොවන ( භාණ්ඩ) ණය වෙනුවෙන්ද ගෙවිණ. ආපසු ගෙවීම් රහිතව සලකන විට දළ විදේශ ණය රුපියල් දශලක්ෂ 188 කින් වැඩිවී ඇත. රන් පවුම් ණය නිදන් අරමුදලේ රුපියල් දශලක්ෂ 11 ක පහත බැසීමේ සහ ජර්මන් මාර්කයේ අගය අධි ප්‍රමාණ කිරීමෙහි ප්‍රතිඵලයක් වශයෙන් ලංකාවේ විදේශීය ණය රුපියල් දශලක්ෂ 15 කින් ඉහළ නැගීමේ අනුබද්ධ ප්‍රතිවිපාක සැලකීමේදී ශුද්ධ විදේශීය වගකීම් රුපියල් දශලක්ෂ 214 කින් වැඩිවී ඇත. කලින් වර්ෂයේදී, ආපසු ගෙවීම් අත්හළ විට විදේශීය ණය ගැනීම්වල ප්‍රමාණය රුපියල් දශලක්ෂ 306 ක් විය. 1968/69 දී, රන් පවුම් ණය නිදන් අරමුදලේ රුපියල් දශලක්ෂ 2 ක

---

1. 1968 සැප්තැම්බර් 7වෙනි දින සිට මෙම අනුපාතිකය ක්‍රියාත්මක විය.

2. එනම්. ආපසු ගෙවුම් රහිතව නමුත් රන් පවුම් ණය නිදන් අරමුදල සඳහා කළ ගෙවීම් අඩු කිරීමට පෙර.

වැඩිවීමද, ( ලංකාවේ විදේශ ණය රුපියල් දශලක්‍ෂ 5 කින් අඩුකළ ) ප්‍රංශ ප්‍රෑන්කයේ අගය අවප්‍රමාණ කිරීමේ ප්‍රතිවිපාකයද අත්හළ විට ශුද්ධ විදේශ ණය රුපියල් දශලක්‍ෂ 299 කින් වැඩිවී ඇත.

විදේශ ණය සම්බන්ධයෙන් වූ ආපසු ගැනීම්, ආපසු ගෙවීම් සහ වගකීම් පිළිබඳ විස්තර පහත 11 (ඊ) 18 වෙනි සංඛ්‍යා සටහනෙහි දක්වේ.

## II (ඊ) 18 වෙනි සංඛ්‍යා සටහන

### විදේශීය ණය

රුපියල් දශ ලක්‍ෂ

| ස්වරූපය හා මූලය | 1969/70 දී ණය ගැනීම් | 1969/70 දී ආපසු ගෙවීම් | 1969/70 දී වැඩිවීම | 1970 සැප්තැම්බර් 30 දිනට වගකීම් |
|---|---|---|---|---|
| **1· රන් පවුම් ණය** .. .. | **—** | **17·9** | **– 17·9** | **71 4(අ)** |
| **2· සංවර්ධන ක්‍රම ණය** .. .. | **61·2** | **46·3** | **14·9** | **521·5** |
| 2·01 ජාත්‍යන්තර ප්‍රතිසංස්කරණ හා සංවර්ධන බැංකුව .. .. | — | 9·3 | – 9·3 | 146·7 |
| 2·02 ජර්මන් ප්‍රජාතන්ත්‍රවාදී සමූහාණ්ඩුව .. | 30·2 | 1·9 | 28·3 | 117·7 |
| 2·03 සෝවියට් සමාජවාදී සමූහාණ්ඩු සංගමය | 0·6 | 9·8 | – 9·2 | 75·7 |
| 2 04 ජර්මන් ෆෙඩරල් සමූහාණ්ඩුව (අ) . | 14·7 | 5·9 | 8·8 | 66·5(ඊ) |
| 2·05 කැනඩාව (ඇ) .. | 1·9 | 5·2 | – 3·3 | 34·2 |
| 2·06 චීන මහජන සමූහාණ්ඩුව .. | — | 5·5 | – 5·5 | 28·8 |
| 2·07 ඇමෙරිකා එක්සත් ජනපදය (ඉ) .. | — | 1·5 | – 1·5 | 22·6 |
| 2 03 ඩෙන්මාර්කය .. .. | 8·0 | — | 8·0 | 9·6 |
| 2·09 ජාත්‍යන්තර සංවර්ධන සංගමය .. | 4·7 | — | 4·7 | 4·7 |
| 2·10 එක්සත් රාජධානිය .. .. | 0·1 | 3·2 | – 3·1 | 3·9 |
| 2·11 නැෂනල් හා ග්‍රින්ඩ්ලේස් බැංකුව .. | — | — | — | 3·9 |
| 2·12 පෝලන්ත මහජන සමූහාණ්ඩුව .. | — | 0·9 | – 0·9 | 3·1 |
| 2·13 යුගෝස්ලෝවියානු මහජන සමූහාණ්ඩුව .. | 1·0 | 1·4 | – 0·4 | 2·6 |
| 2·14 ප්‍රංශය .. .. | — | 1·7 | – 1·7 | 1·5 |
| **3· සංවර්ධන යෝජනා ක්‍රම නොවන (භාණ්ඩ) ණය** .. | **221·3** | **30·2** | **191·1** | **985·5** |
| 3·01 ඇමෙරිකා එක්සත් ජනපදය (අ) .. | 53·2 | 1·9 | 51·3 | 377·3 |
| 3·02 එක්සත් රාජධානිය .. .. | 45·5 | 1·0 | 44·5 | 220·5 |
| 3·03 ජර්මන් සමූහාණ්ඩු ජනරජය (ආ) .. | 20·2 | — | 20·2 | 135·8(ඊ) |
| 3·04 ජපානය .. .. | 25·7 | 12·0 | 13·7 | 107·8 |
| 3·05 ප්‍රංශය .. .. | 23·2 | 11·3 | 11·9 | 50·5 |
| 3·06 ඉන්දියාව .. .. | 27·6 | 4·0 | 23·6 | 50·4 |
| 3·07 කැනඩාව .. .. | 9·3 | — | 9·3 | 26·8 |
| 3·03 චීන මහජන සමූහාණ්ඩුව .. | 10·3 | — | 10·3 | 10·3 |
| 3·09 ඉතාලිය .. | 6·3 | — | 6·3 | 6·3 |
| 4. එකතුව .. .. | 282·5 | 94·4 | 188·1 | 1578·4(අ) |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) ජාත්‍යන්තර සහයෝගිතා සංවිධානය, හා සංවර්ධන ණය අරමුදලින් ගත් ණය ඇතුළත්ය.
(ආ) ''ක්‍රෙඩිටන්ස්ටාලට් ෆූ'ර් විඩාරාප් බවු'' ආයතනයෙන් ලත් ණය.
(ඇ) අපනයන ණය, රක්ෂණ සමායතන ණයද ඇතුළත්ය.
(ඈ) ජාත්‍යන්තර සහයෝගිතා සංවිධ නය හා සංවර්ධන ණය අරමුදලින් ගත් ණය ඇතුළත් වෙයි.
(ඉ) ජාත්‍යන්තර සංවර්ධන නියෝජ්‍යත්වය කෙරෙන් ගත් ණය හා මහජන නීති 480 ණයද ඇතුළත්ය.
(ඊ) ඩොයිෂ් මාර්ක් ප්‍රතිප්‍රමාණ කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් වැඩිවූ වගකීමද ඇතුළත්ය.

**(i) රන් පවුම් ණය**

1969/70 මුදල් වර්ෂය අවසානයේ දී රන් පවුම් ණය මුළු ප්‍රමාණය රුපියල් දශලක්ෂ 71 ක් වූ අතර කලින් මුදල් වර්ෂය අවසානයේ දී එය රුපියල් දශලක්ෂ 89 ක් විය. මෙසේ වගකීම් අඩුවීමට හේතු වූයේ ලංකාවේ 1960 - 1970 සියයට පහේ තොගය පිළිබඳ ආපසු ගෙවීමයි.

**(ii) සංවර්ධන යෝජනා ක්‍රම ණය**

1969/70 දී උපයෝජනය කොට ගන්නා ලද යෝජනා ක්‍රම ණය ප්‍රමාණය රුපියල් දශලක්ෂ 61 ක් විය. රුපියල් දශලක්ෂ 46 ක ආපසු ගෙවීම්ද, සංවර්ධන යෝජනා ක්‍රම යටතේ කරන ලද ණය ගැනීම් හේතුකොට ගෙන වගකීම්වල සිදුවූ වැඩිවීමද අත්හළ විට එම ණය ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 15 ක් වේ. මීට ප්‍රතිවිරුද්ධ වශයෙන්, කලින් වර්ෂයේ දී උපයෝජනය කරගත් ණය ප්‍රමාණය රුපියල් දශලක්ෂ 94 ක් වූ අතර, ආපසු ගෙවීම් රුපියල් දශලක්ෂ 45 ක් වූයෙන් එම විදේශීය වගකීම් රුපියල් දශලක්ෂ 49 කින් වැඩිවිය.

සංවර්ධන යෝජනා ක්‍රම ණය ප්‍රධාන වශයෙන් ලැබුණේ තුල්හිරියේ රෙදිපිළි කම්හල සහ වරාය සංවර්ධන යෝජනා ක්‍රමය සඳහා (රුපියල් දශලක්ෂ 30 ක්) ජර්මන් ප්‍රජාතන්ත්‍රවාදී ජන රජයෙන් ද, කඩදාසි කර්මාන්තය සහ අමු යකඩ, ලෝහ වැඩපොළ සඳහා (රුපියල් දශලක්ෂ 15 ක්) ජර්මන් ෆෙඩරල් සමූහාණ්ඩුවෙන්ද වේ.

විමර්ශනයයට භාජනය වන කාල පරිච්ඡේදය අවසානයේදී සංවර්ධන යෝජනා ක්‍රම ණය හේතුකොට ගෙන නොබේරා ඉතිරිව ඇති වගකීම් ප්‍රමාණය රුපියල් දශලක්ෂ 522 ක් විය. මෙය එදිනට නොබේරා පැවති දළ විදේශීය ණයෙන් සියයට 33 ක් නිරූපනය කරයි. මේ අන්දමට පසුගිය මුදල් වර්ෂය අවසානයේ දී, නොබේරා පැවති ණය ප්‍රමාණය රුපියල් දශලක්ෂ 502 ක් වූ අතර එය දළ විදේශීය ණය ප්‍රමාණයෙන් සියයට 36 ක් විය. විදේශීය වගකීම් රුපියල් දශලක්ෂ 5 කින් වැඩිකළ ජර්මන් මාර්කයේ අධි ප්‍රමාණ කිරීමේ ප්‍රතිවිපාකයද විදේශීය වගකීම් පිළිබඳව සිදුවූ රුපියල් දශලක්ෂ 20 ක වැඩිවීමට ඇතුළත්වී ඇත.

**(iii) සංවර්ධන යෝජනා ක්‍රම නොවන (භාණ්ඩ) ණය**

1969/70 වර්ෂයේ දී "භාණ්ඩ ආධාර වැඩ පිළිවෙල" යටතේ ආනයන වටිනාකම් රුපියල් දශලක්ෂ 221 ක් වූ අතර ඉකුත් වර්ෂයේ දී එය රුපියල් දශලක්ෂ 283 ක් විය. ආපසු ගෙවීම් අඩුකළ විට "භාණ්ඩ ආධාර වැඩ පිළිවෙල" යටතේ කරණ ලද ණය ගැනීම් හේතුකොට ගෙන වගකීම්වල සිදුවූ වැඩිවීම රුපියල් දශලක්ෂ 191 ක් විය.

1969/70 වර්ෂයේ දී "භාණ්ඩ ආධාර වැඩ පිළිවෙල" යටතේ ආයාතකරන ලද භාණ්ඩ පහත දක්වේ.

| | |
|---|---|
| ඇමෙරිකා එක්සත් ජනපදය | - වෙළඳ වාහන, ට්‍රැක්ටර්, යන්ත්‍රෝපකරණ, තිරිඟු පිටි සහ පොර |
| එක්සත් රාජධානිය | - පොර, ඉංජිනේරු ගබඩා, මෝටර් රථ අමතර කොටස්, අමු ද්‍රව්‍ය, ට්‍රැක්ටර්, යන්ත්‍රෝපකරණ, ටිකට් යන්ත්‍ර, නාවික ඇන්ජින්, ටයර්, ගොඩනැගිලි උපකරණ, මෝටර් බයිසිකල් සහ තිරිඟු පිටි. |
| ජර්මන් ෆෙඩරල් සමූහාණ්ඩුව | - පොර, මෝටර් රථ අමතර කොටස්, යන්ත්‍රෝපකරණ, වෙළඳ වාහන සහ තිරිඟු පිටි |
| ජපානය | - වෙළඳ වාහන, ට්‍රැක්ටර්, මාළු දැල්. යන්ත්‍රෝපකරණ, පොර, මෝටර් බයිසිකල්, ටයර්, ටියුබ්, අමු ද්‍රව්‍ය සහ මූලික ලෝහ. |
| ප්‍රංශය | - ට්‍රැක්ටර් ,යන්ත්‍රෝපකරණ, පොර, මෝටර් වාහන, ටිකට් යන්ත්‍ර, මෝටර් රථ අමතර කොටස්, විදුලි උපකරණ, ඉංජිනේරු ගබඩා, මූලික ලෝහ, ටයර් සහ ටියුබ්. |
| ඉන්දියාව | - වෙළඳ වාහන, විදුලි උපකරණ, විදුලි සන්දේශ උපකරණ, මෝටර් රථ අමතර කොටස්, යන්ත්‍රෝපකරණ, නල සහ ඉංජිනේරු ගබඩා |
| කැනඩාව | - මුද්‍රණ කඩදාසි, ඇස්බෙස්ටෝස් තහඩු සහ තිරිඟු පිටි. |
| චීන මහජන සමූහාණ්ඩුව | - සහල් |
| ඉතාලිය | - පොර සහ මෝටර් රථ අමතර කොටස්. |

සංවර්ධන යෝජනා ක්‍රම නොවන ( භාණ්ඩ ) ණය පිළිබඳ නොබේරා ඉතිරිව ඇති විදේශීය වගකීම් ප්‍රමාණය 1969/70 මුදල් වර්ෂය අවසානයේ දී රුපියල් දශලක්ෂ 986 ක් වූ අතර ඉකුත් මුදල් වර්ෂය අවසානයේ දී එය රුපියල් දශලක්ෂ 785 ක් විය. සංවර්ධන යෝජනා ක්‍රම නොවන (භාණ්ඩ) ණය පිළිබඳව වූ රුපියල් දශලක්ෂ 201 ක වැඩිවීමට රුපියල් දශලක්ෂ 10 කින් වගකීම් වැඩිකිරීමට හේතුවූ ජර්මන් මාර්කයේ අගය අධිප්‍රමාණ කිරීමේ ප්‍රතිවිපාකයද ඇතුලත් වී ඇත.

සමාලෝචනයට භාජනය වන වර්ෂය තුළ, විදේශ ආධාර ප්‍රතිපාර්ශ්වීය අරමුදලට[1] රුපියල් දශලක්ෂ 269 ක් බැර කරන ලද අතර රුපියල් දශලක්ෂ 271 ක් ආපසු ගන්නා ලදී. ඒ අනුව, මෙම මුදල් වර්ෂය තුළ අරමුදලේ නොබේරා ඇති ශේෂය රුපියල් දශලක්ෂ 2 කින් අඩුවිය. ඉකුත් මුදල් වර්ෂයේ දී බැර කළ ප්‍රමාණය රුපියල් දශලක්ෂ 282 ක්ද, හරකළ ප්‍රමාණය රුපියල් දශලක්ෂ 367 ක්ද වූ අතර ඒ අනුව අරමුදලේ ශේෂය රුපියල් දශලක්ෂ 85 කින් අඩුවිය. 1966 දී අරමුදල ආරම්භයේ සිට අන් කවර වර්ෂයකටත් වඩා 1969/70 වර්ෂය මුළුල්ලේ අරමුදලෙහි ඇති මුදල් විශාල වශයෙන් උපයෝජනය කර ගැනිමක් සිදුවිය. යෝජනා ක්‍රම නොවන (භාණ්ඩ) ණය යටතේ කෙරෙන ආයාතයන් හේතුකොටගෙන ජනිතවුන රුපියල් අරමුදල් සහ අයවැය අවශ්‍යතාව යන් උදෙසා ඒවා උපයෝජනය කර ගැනීම ආශ්‍රිත දත්තයන් II වැනි පරිශිෂ්ඨයේ 42 වෙනි සංඛ්‍යා සටහනෙහි දක්වේ.

## නිදන් අරමුදල්

1970 සැප්තැම්බර් අවසානයේ දී රන් පවුම් ණය නිදන් අරමුදල් සහ රුපියල් ණය නිදන් අරමුදල්වල ආසන්න වෙළඳ පළ වටිනාකම පිළිවෙලින් රුපියල් දශලක්ෂ 28 ක් සහ රුපියල් දශලක්ෂ 609 ක් විය. ඉකුත් මුදල් වර්ෂයේ අවසානයේ දී එවා පිළිවෙලින් රුපියල් දශලක්ෂ 38 ක් සහ රුපියල් දශලක්ෂ 611 ක් විය.

1969/70 දී රන් පවුම් ණය නිදන් අරමුදල් පිළිබඳ වෙළඳ පල වටිනාකම රුපියල් දශලක්ෂ 11 කින් අඩුවීමට හේතු වූයේ ලංකාවේ 1969–70 සියයට පහේ තොගය සඳහා කරන ලද රුපියල් දශලක්ෂ 17 ක් වූ ආපසු ගෙවීමකි. මෙම අඩුවිම තරමක් මැකී ගියේ ( රුපියල් දශලක්ෂ 1 ක් වූ ) අළුත් දයක මුදල් ආයෝජනයන්ද, පැවති ආයෝජනයන්ගෙන් උපයන ලද ( රුපියල් දශලක්ෂ 1 ක් වූ ) පොලීද, පැවති ආයෝජනයන්ගේ වෙළඳ පල වටිනාකම ( රුපියල් දශලක්ෂ 3 කින් ) වැඩිවීමක්ද හේතුකොට ගෙනය.

මෙම කාලපරිච්ඡේදය තුළදීම, ( රුපියල් දශ ලක්ෂ 37 ක්වූ ) ණය ආපසු ගෙවීම සහ පැවති ආයෝජනයන් ( රුපියල් දශලක්ෂ 91 කින් ) ක්ෂයවීම නිසා රුපියල් ණය නිදන් අරමුදල්වල වෙළඳපල වටිනාකම රුපියල් දශලක්ෂ 3 කින් අඩුවිය. මෙම අඩුවීම, ( රුපියල් දශලක්ෂ 93 ක් වූ ) අළුත් දයක මුදල් ආයෝජනයන් හා පැවති ආයෝජනයන්ගෙන් උපයන ලද ( රුපියල් දශලක්ෂ 32 ක් වූ ) පොලී නිසා තරමක් මැකී ගියේය.

## (එ) අර්ධ රාජ්‍ය ආයතන විසින් ගත් ණය

### 1. ජාතික නිවාස අරමුදල

1969/70 දී ජාතික නිවාස ණයකර නිකුතු මගින් ණය ගැනීමක් සිදු නොවීය. නිකුත්කරන ලද සහ නොබේරා ඉතිරිව ඇති ණයකර ප්‍රමාණය රුපියල් දශලක්ෂ 116 ක්වූ අතර ණයකර නිකුත්කිරීම සඳහා බලය ලත් සීමාව වූ රුපියල් දශලක්ෂ 220 මුදල් වර්ෂය තුළදී නොවෙනස්ව පැවතුණි. මේ අතර, ජාතික නිවාස ණයකර බේරුම්කිරීම සඳහා ඇතිකර තිබූ නිදන් අරමුදල්වල වෙළඳපොළ වටිනාකම මඳ වශයෙන් ක්ෂයවූ අතර වර්ෂය අවසානයේ දී එය රුපියල් දශලක්ෂ 35 ක් විය.

---

1. II වෙනි පරිශිෂ්ඨයේ 42 වෙනි සංඛ්‍යා සටහන සඳහා වූ පා සටහන් බලන්න.

2. මෙහි දක්වා ඇති ණය නම්, (1) 1969–70 සියයට 3 රුපියල් දශලක්ෂ 23 ක්) වික්ටරි ණය සහ පහත ණයවලින් එනම් (11) 1967–69 සියයට 3½ ( රුපියල් දශලක්ෂ 3 ක් වූ ) ණය (111) 1967–69 ''ආ'' කාණ්ඩයේ සියයට 3½ (රුපියල් දශලක්ෂ 6 ක්වූ) ණය (1V) 1968–70 සියයට 3½ (රුපියල් දශලක්ෂ 5 ක්වූ) ණය යන ඒවායේ නොහැරවූ ශේෂයන්ය.

1969/70 මුදල් වර්ෂයේදී, ජාතික නිවාස දෙපාර්තමේන්තුවට දෙන සෘජු ණය වශයෙන් රුපියල් දශලක්ෂ 26 ක් රජය විසින් අනුමත කෙරිණ. ඒ අනුව, වර්ෂය අවසානයේ දී එම ණය මුළු ප්‍රමාණය රුපියල් දශලක්ෂ 181 දක්වා වැඩිවිය.

## 2. රජයේ උකස් බැංකුව

1969/70 මුදල් වර්ෂයේදී, රජයේ උකස් බැංකු ණයකර නිකුතු නොවිණ. එම නිසා, නිකුත්කරනලද සහ නොබේරා ඉතිරිව ඇති ණයකර ප්‍රමාණය රුපියල් දශලක්ෂ 32 ක් ලෙස නොවෙනස්ව පැවතිණ.

සමාලෝචිත මුදල් වර්ෂය තුළදී වාණිජ බැංකුවලින් ලබාගන්නා ලද අයිරාවන් රුපියල් දශලක්ෂ 42·4 සිට රුපියල් දශලක්ෂ 42·5 දක්වා මඳ වශයෙන් වැඩිවිය. නොබේරා ඉතිරිව පැවති ණයකර ප්‍රමාණ වූ රුපියල් දශලක්ෂ 32 සමග එසේ රජයේ උකස් බැංකුවේ මුළු ණයගැති බව රුපියල් දශලක්ෂ 75 ක් විය. එයින් අවුරුද්ද මුළුල්ලේම එක සමාන මට්ටමක පැවති රුපියල් දශලක්ෂ 76 ක ණය ගැනීම් සීමාවෙහිවූ රුපියල් දශලක්ෂ 1 ක උපයෝජනය නොකළ ශේෂයක් අත්හැරේ.

## (ඒ) 1970/71 අය වැය ලේඛනය

1970/71 මුදල් වර්ෂය සඳහා අය වැය ලේඛනය 1970 ඔක්තෝබර් 25 වෙනි දින නියෝජිත මන්ත්‍රී මණ්ඩලයට ඉදිරිපත් කළ අතර, 1970 දෙසැම්බර් 31 වෙනි දින සම්මත කරන ලදී. පසුගිය වර්ෂවලදී මෙන් නොව 1970 ඔක්තෝබර් 1 වෙනිදයින් ආරම්භ වන මුදල්වර්ෂය සඳහාවූ මෙම අයවැය ලේඛනය ඉදිරිපත් කළේ අදල මුදල් වර්ෂය පටන් ගැන්මෙන් අනතුරුවය. මෙසේ වූයේ 1970 මැයි මස පාලනය බාරගත් නව ආණ්ඩුවට අය වැය සකස් කිරිම සඳහා යම් කාලයක් අවශ්‍යවූ බැවිනි. එහෙයින් ඔක්තෝබර් සිට දෙසැම්බර් දක්වා කාලය සඳහාවූ වියදම් පාර්ලිමේන්තුව විසින් අනුමත කළ ගිණුම් – සම්මතයක් මගින් අනුමත විය.

අභිනව ආදයම් හා වියදම් යෝජනා සැලකිල්ලට යොමු කොට ගත් කළ අය වැය ලේඛනයේ පවත්නා ප්‍රධාන ලක්ෂණයන් පහත දැක්වෙන II (ඊ) 19 වෙනි සංඛ්‍යා සටහනින් සැකෙවින් දක්වා ඇත.

අයවැය ලේඛනයට පළමු පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද කෙටුම්පත් ඇස්තමේන්තුවල අන්තර්ගත ආදයම් හා වියදම් යෝජනා, ඉහත දැක්වෙන සටහනේ ''පූර්ව අයවැය ඇස්තමේන්තු'' පිළිබඳ තීරුවෙහි සම්පින්ඩණය කොට දැක්වේ. ඉන් නව ප්‍රාග්ධන සංවර්ධන යෝජනා ක්‍රම ඇතුලත්ව නව මුදල් වර්ෂයේ රජයේ වියදම් වැඩ පිළිවෙල මුළුමණින්ම වාගේ පිළිබිඹු කෙරෙන වියදම් සංඛ්‍යාද, පවතින බදු අනුපාතිකයන්ගෙන් සිදු කළ හැකිව තිබෙන මුළු ආදයම ද පෙන්වයි.

'ප්‍රාරම්භක අය වැය ඇස්තමේන්තු' තීරුව පාර්ලිමේන්තුව අනුමත කළ අවසාන ඇස්තමේන්තුවල සඳහන් ආදයම, වියදම හා හිඟය පියවන යෝජනා පෙන්වයි. ඉන් අය වැය ලේඛනයෙහි ඇතුළත් වූ අභිනව ආදයම් යෝජනා සැලකිල්ලට ගත් පසුව වූ මුළු ආදයම ද, විදේශීය විනිමය සහතික පත් ක්‍රමය යටතේ සීනි ආනයන කිරීමට රජය ගත් තීරණයට අනතුරුව එන මුළු වියදම ද අය වැය කාරක සභා අවස්ථාවේදී වියදම් ඇස්තමේන්තුවල සකසන ලද සංශෝධිතයන් ද ඉදිරිපත් කෙරේ. තවද, මෙම තීරුව, හිඟය පියවීම සඳහා රජය විසින් රැස් කිරීමට යන සම්පත් ද පෙන්වයි.

1970/71 සඳහා ඇස්තමේන්තු කරන ලද ආදයම (නව යෝජනාවක් අඩංගුව) රුපියල් දශ ලක්ෂ 2,878 ක් විය. මූලික අය වැය ඇස්තමේන්තුවලට වඩා රුපියල් දශ ලක්ෂ 44 ක වැඩිවීමක් ද, ඉකුත් මුදල් වර්ෂයේ නියම ආදයමට වඩා රුපියල් දශ ලක්ෂ 142 ක වැඩිවීමක් ද මේ මගින් නිරූපනය කොට ඇත. අනෙක් අතට, අපේක්ෂිත ඌණ වියදමට ගලපන

1. සියළු අයිරාවන් සහතික කරන ලද්දේ රාජ්‍ය උගස් බැංකු පනතේ 73 වෙනි වගන්තිය යටතේය.

## II (ඊ) 19 වැනි සංඛ්‍යා සටහන

රුපියල් දශ ලක්ෂ

| ශීර්ෂයන් | පූර්ව-අයවැය ඇස්තමේන්තු | මූලික අයවැය ඇස්තමේන්තු |
|---|---|---|
| 1· පුනරාවර්තන වියදම් (1, 2, 4 සහ 6 වැය සම්මත) .. .. | 2,823 | 2,913 |
| $2\frac{1}{2}$% ඌන - වියදම් හැර .. .. | 71 | 73 |
| | 2,752 | 2,840 |
| 2· ප්‍රාග්ධන වියදම් (3, 5 සහ 7 වැය සම්මත) .. | 1,379 | 1,389 |
| 15% ඌන - වියදම් හැර (අ) .. .. | 169 | 171 |
| | 1,290 | 1,218 |
| 3· මුළු වියදම .. .. | 3,962 | 4,058 |
| 4· මුළු ආදායම .. .. | 2,520 | 2,878 |
| 5· අය වැය හිඟය .. .. | 1,442 | 1,180 |
| නිදන් අරමුදල් යනාදියට දායක දීමනා හැර .. | 249 | 249 |
| 6· ශුද්ධ මූල්‍ය හිඟය .. .. | 1,193 | 932 |
| 7· අය වැය හිඟය පියවීම | | |
| 7·1 බැංකු නොවන මූලයන් ගෙන් වෙළඳ පොලේ ණය ලබා ගැනීම් .. .. | | 445 |
| 7·2 විදේශීය ණය .. .. | | 638 |
| 7·2·1 සංවර්ධන යෝජනා ක්‍රම ණය .. | | 113 |
| 7·2·2 සංවර්ධන යෝජනා ක්‍රම නොවන ණය .. | | 525 |
| 7·3 නොපියවූ පරතරය (බැංකු ණය ගැනුම්) .. | | 97 |
| 8· ශුද්ධ මූල්‍ය හිඟය පියවීම | | |
| 8·1 බැංකු නොවන මූලයන් ගෙන් දේශීය වෙළඳ පොලේ ණය ගැනීම් .. .. | | 343 |
| 8 2 විදේශීය ණය .. .. | | 491 |
| 8·2·1 සංවර්ධන යෝජනා ක්‍රම ණය .. | | 26 |
| 8·2·2 සංවර්ධන යෝජනා ක්‍රම නොවන (භාණ්ඩ) ණය | | 465 |
| 8·3 නොපියවූ පරතරය (බැංකු ණය ගැනුම්) .. | | 97 (ආ) |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

අ· ඌණ වියදම ගණනය කොට ඇත්තේ ප්‍රාග්ධන වියදම්වලින් නිදන් අරමුදල් දායක ගෙවීම් සහ රාජ්‍ය ණය පිළිබඳ ඍජු ආපසු ගෙවීම් අඩු කිරීමෙනි.

ආ. කාරක සභා අවස්ථාවේ සංශෝධනයන්ගෙන් ඇතිවන ප්‍රතිවිපාක ඇතුළත්ය.

ලද මුළු වියදම රුපියල් දශලක්ෂ 4,058 ක් වේ. එය ප්‍රාරම්භක අයවැය ඇස්තමේන්තුවලට වඩා රුපියල් දශලක්ෂ 265 ක වැඩිවීමක් ද, ඉකුත් මුදල් වසරේ නියම වියදම් සංඛ්‍යාවට වඩා රුපියල් දශ ලක්ෂ172ක වැඩිවීමක් ද පෙන්වයි.

ඒ අනුව, 1970/71 දී ඇති වූ රුපියල් දශ ලක්ෂ 1,180 ක අය වැය හිඟය ඉකුත් මුදල් වර්ෂයේ මුල් ඇස්තමේන්වලට වඩා රුපියල් දශ ලක්ෂ 221 ක වැඩිවීමක් හා නියම හිඟයට වඩා රුපියල් දශලක්ෂ 30 ක වැඩිවීමක් පෙන්වයි. රුපියල් දශ ලක්ෂ 1, 180 ක අය වැය හිඟය, රුපියල් දශ ලක්ෂ 445 ක බැංකු නොවන දේශීය වෙළඳ පොලේ ණය ගැනීම් වලින් ද, රුපියල් දශ ලක්ෂ 525 ක සංවර්ධන යෝජනා ක්‍රම නොවන (භාණ්ඩ) ණය හා රුපියල් දශ ලක්ෂ 113 ක සංවර්ධන යෝජනා ක්‍රම ආධාර මගින් ද, පියවීමට අපේක්ෂා කළ අතර, නොපියවන ලද පරතරය වන රුපියල් දශ ලක්ෂ 97 ක් දේශීය බැංකු ක්‍රමයෙන් ලබාගත් ණයවලින් පියවීමට ඉඩ හරින ලදී.

දේශීය බැංකු නොවන මාර්ගයන්ගෙන් ණයට ගැනීමට යන රුපියල් දශ ලක්ෂ 445 න් රුපියල් දශලක්ෂ 170 ක ප්‍රමාණයක් අය වැය ලේඛනයෙන් යෝජිත ඇතැම් විධිවිධාන මගින් රැස්කිරීමට අදහස් කෙරේ. මේවා නම්, අනිවාර්ය ඉතුරුම් ක්‍රමය, සේවක අර්ථ සාධක පනතෙහි වූ සංශෝධනයන් හා රජයේ සුරැකුම්පත් පොලී අනුපාතයෙහි කළ වැඩිවීමකි. රුපියල් දශ ලක්ෂ 638 කට ඇස්තමේන්තු කළ විදේශීය ණය ගැනීම්වල මුළු ප්‍රමාණය, මෙතෙක් ඕනෑම වර්ෂයක් සඳහා ඇස්තමේන්තු කළ විදේශීය ආධාර උපයෝජනයට වඩා වූ වැඩිම ප්‍රමාණය නිරූපණය කෙරේ.

## 1. නව ආදායම් යෝජනා.

1970/71 සඳහා රජයේ ඇස්තමේන්තු (පූර්ව - අය වැය ඇස්තමේන්තු) පසුගිය මුදල් වර්ෂයට වඩා පවත්නා බදු අනුපාතිකයන්හිදී ආදායමෙහි ඇතැම් වැඩිවීම් අපේක්ෂා කෙරෙණි මෙම වැඩිවීම් හැර ඇතැම් අළුත් ආදායම් විධිවිධාන අය වැය කථාවේදී ඉදිරිපත් විය. මෙකී නව විධිවිධාන, මුළු මුදල් වර්ෂය සඳහා වූ ආදායමෙහි රුපියල් දශ ලක්ෂ 328 ක වැඩිවීමකට හේතුවේ යැයි අපේක්ෂා කෙරෙන අතර, ඒවා පහත එන II (ඊ) 20 වෙනි සංඛ්‍යා සටහනෙහි සම්පිණ්ඩනය කොට දක්වේ.

### II ඊ 20 වැනි සංඛ්‍යා සටහන

### නව ආදායම් යෝජනා

රුපියල් දශලක්ෂ

| II ඊ 3 වෙනි සංඛ්‍යා සටහනේ ශීර්ෂ අංකය | ශීර්ෂයන් | අපේක්ෂිත ආදායම (මුළු වර්ෂයේදී) | අපේක්ෂිත ආදායම 1970/71 දී |
|---|---|---|---|
| 1·1·1· | විමුල්‍යනයෙන් සිදුවන බදු එකතු කිරීම .. | 100·00 | 100·00 |
| 1·2·1· | ව්‍යාපාර පිරිවැටුම් බද්ද .. .. | 29·00 | 21·75 |
| 1·2·1 | බැංකු හර බද්ද .. .. | 20·00 | 15·00 |
| 1·2·2· | ඡද්ශීය භාණ්ඩ බදු (සිගරට්, බීර, බෝතල් කළ රා) .. | 35·00 | 26·25 |
| 1·2·3· | ආනයන බදු ව්‍යුහය සුවිධානය කිරීම .. | 60·00 | 45·00 |
| 1·2·5· | මිනිරන් නිර්යාත බද්ද වැඩි කිරීම .. .. | 1·00 | 0·75 |
| 1·2·6· | මෝටර් රිය බලපත්‍ර ගාස්තුව .. .. | 7·00 | 5·25 |
| 1·3·1· | සංස්ථා වෙනුවෙන් පනවන ලද විශේෂ අයකිරීම .. | 45·00 | 33·75 |
| 1·4·3· | තැපැල් විදුලි පණිවුඩ හා දුරකථන ගාස්තු සංශෝධනයන් .. .. | 15·00 | 11·25 |
| 1·4·4· | වරාය ගාස්තු වැඩිකිරීම .. .. | 7·00 | 5·25 |
| 1·5· | තාවකාලික වාස බද්ද .. .. | 4·00 | 3·00 |
| 2·1·2· | මූල්‍යධන අයකිරීම .. .. | 5·00(අ) | 3·75 |
| | මුළු ආදායම .. .. | 328·00 | 271·00 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) මෙම මූල්‍යධන බද්ද අවුරුදු 3 ක කාලච්ඡේදයකදී සම්පූර්ණයෙන්ම ලබා ගැනීමට ද, ඉන් රුපියල් දශ ලක්ෂ 5 ක් මුල් සම්පූර්ණ වර්ෂයේදී ලබා ගැනීමට ද අපේක්ෂා කෙරේ.

කෙසේ වුවද, මෙම ආදායම් විධිවිධානයන්ගෙන් බොහොමයක් ක්‍රියාත්මක වනුයේ, මුදල් වර්ෂයෙන් 3/4 ක් සඳහා පමණි. එපමණක් වන්නේ මුදල් වර්ෂය ආරම්භ වීමෙන් පසුව අය වැය ඉදිරිපත් කොට සම්මත කළ නිසායි. එහෙයින් අය වැය කථාවේදී විමුල්‍යායන-යෙන් සිදුවන බදු හිඟයන් ගෙවීම් අත්හැරි කල්හි, මෙම ආදායමේ හතරෙන් එක් පංගුවකා පාඩුවක් සඳහා ඉඩ හැරීමට ද අය වැය කථාවේදී යෝජනා කෙරුණි. II (ඊ) 20 වෙනි සංඛ්‍යා සටහනේ එන අවසාන තීරුවෙහි මෙම ආදායමේ පාඩුව සඳහා ඉඩ හැරීමෙන් පසුව ඒ ඒ නව ආදායම් විධිවිධාන වලින් එම පාඩුව පියවා ගැනීමට අපේක්ෂිත ආදායම් ප්‍රමාණය පෙන්වයි. තවද, එම සංඛ්‍යාසටහනෙහි, අය වැය වාර්තාවෙන් ඉදිරිපත් කළ බදු මුදාහැරීම් හා බදු සහනයන් ගණනාවක්ම, එවායින් ඇතිවන ආදායම් ප්‍රතිවිපාකයන් නොවැදගත් යයි සැලකූ හෙයින් ඇතුළත් නොකෙරිණ.

## (i) විමුල්‍යායනය නිසා වූ බදු එකතු කිරීම්.

රාශිකරණය කොට තිබූ සැහෙන මුදල් ප්‍රමාණයක් ඉවතට ගැනීමේ අදහසින් 1970 නොවැම්බර් 3 වෙනිද සිට රුපියල් 100 හා රුපියල් 50 නෝට්ටු අවලංගු කිරීමට ප්‍රකාශ කෙරිණි.[1] මේ අනුව රුපියල් 1000 වන තෙක් (මේ සීමාව රුපියල් 250 සහ රුපියල් 100 දක්වා අනතුරුව අඩු කෙරිණි.) එවැනි මුදල් නෝට්ටු ඇති අයට 1970 ඔක්තෝම්බර් 27 වෙනිද සිට 1970 නොවැම්බර් 2 වෙනිද දක්වා ඇති කාලය තුළ (දෙදිනම ඇතුළුව) ඒ නෝට්ටු බැංකුවලටදී, ඊට සම වටිනාකමින් යුත් අලුත් නෝට්ටුවලට හුවමාරු කිරීමට සිදු විය. රුපියල් 1000 කට වැඩි වටිනාකමින් යුත් නෝට්ටු ප්‍රමාණයක් ඇති විට ඒවා තමන්ගේ ගිණුමක් ඇති ඕනෑම බැංකුවකට හෝ එවැනි ගිණුමක් නැත්නම් ඔහුට තම මුදල් නෝට්ටු දී තමන් කැමති ඕනෑම බැංකුවක ගිණුමක් ඇරඹිය හැකි විය. 1970 නොවැම්බර් 3 වෙනිද සිට 1970 නොවැම්බර් 25 වෙනිද දක්වා මේ වටිනාකමෙන් යුත් මුදල් නෝට්ටු අයිතිකරුවන්ට වාණිජ බැංකුවල හෝ තැපැල් කන්තෝරු ඉතුරුම් බැංකුවෙහි තැන්පත් කිරීමට සිදුවුනි. (අවසාන දිනය පසුව 1970 නොවැම්බර් 15 වෙනි දින දක්වා දිගු කරණ ලදී.) මේ අන්දමින් තැන්පත් කරන මුදල් හා සම්බන්ධ තොරතුරු දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුවට දැන්වීමට සියලුම රජයේ හා අර්ධ රාජ්‍ය අයතනවලට නීත්‍යානුකූලව බල කෙරිණ. මෙහිදී පසුගිය වර්ෂ 6 තුල හිඟ බදු මුදල් ගෙවීමට ඇති තැන්පත් කරුවන්ට එම කාලච්ඡේදය තුළ ඔවුන්ගේ මුළු ආදායමෙන් සියයට 33½ ක් හෝ ඔවුන්ගේ තැන්පතුවලින් සියයට 50 ක් යන ඒවායින් ඉහළ ප්‍රමාණය හිඟ බදු මුදල්වලට හිලව් වශයෙන් ගෙවිය යුතු විය. මෙම රාශිකරණ විරෝධී විධිවිධානයෙන් සැලසුණු අමතර බදු එකතු කිරීම් වශයෙන් රුපියල් දශ ලක්ෂ 100 ක් ලබාගැනීමට අපේක්ෂා කෙරිණි.

## (ii) නිෂ්පාදන කර්මාන්ත සඳහා ව්‍යාපාර පිරිවැටුම් බද්ද.

නිෂ්පාදන කර්මාන්ත සම්බන්ධයෙන් ව්‍යාපාර පිරිවැටුම් බද්දේ පහත දැක්වෙන වෙනස්කම් යෝජනා කරන ලදී[2].

(අ) සුපිරි හා පිරි පැට්‍රල් සඳහා දැනට අය කරන ගාස්තු ප්‍රමාණය වන සියයට 32 සියයට 37 දක්වා වැඩි කිරීමට ;

(ආ) සුවඳ විළවුන්, වායු සමීකරණ යන්ත්‍ර, මුළුතැන් ගෙවල හා කෑම කන කාමර වලට අවශ්‍ය දෑ ඇතුළත් මළ නොබැඳෙන වානේ නිෂ්පාදනයන්, ශීතකරණ, ගුවන් විදුලි යන්ත්‍ර, තීන්ත සහ වාර්නිෂ් වෙනුවෙන් දැනට අය කරනු ලබන සියයට 20 ප්‍රමාණය සියයට 25 දක්වා වැඩි කිරීමට.

(ඇ) රසකැවිලි, ස්වර්ණාභරණ, බාල වර්ගයේ මැණික් හා ලාභ මැණික් ගල්, නිපදවන්නන් විසින්ම මසා නිපදවන මුළුමනින් කපු නොවන ඇඳුම් හා වස්ත්‍ර, මුළුතැන් ගෙයි හා කෑම කන මේසයට පාවිච්චි කරන තැටි, කෝප්ප යනාදිය ඇතුළත් වූ ඇලුමිනියම්, පිත්තල හා ඉනැමල් භාණ්ඩ සඳහා අය කරනු ලැබූ සියයට 10 ගාස්තුව සියයට20 දක්වා වැඩි කිරීමට;

---

1. 1970 වර්ෂයේ අංක 26 දරණ බදු ගෙවීම පැහැර හැරීම වැලැක්වීමේ පණත.
2. 1970 ඔක්තෝබර් 26 දින අංක. 14,929/10 දරන ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රය බලන්න.

ලංකා මහා බැංකුව



(ඈ) චොක්ලට්, කොකෝ කුඩු, බ්‍රැන්ඩි, ජින්, රම්, විස්කි, වයින් හා පිරිසිදු කළ ස්ප්‍රීතු හා මුළුමණින්ම ශ්‍රමය යොදා නිපදවන විස්කෝතු හැරෙන්නට අනෙකුත් විස්කෝතු, සිසිල් බීම, ඇස්බැස්ටෝස් නිෂ්පාදන හා නිපදවන්නන් විසින්ම විකුණනු ලබන මුළුමනින්ම කපු රෙදිවලින් සකස් කරන ඇඳුම් සඳහා අය කරනු ලැබූ බද්ද වන සියයට 10 ප්‍රමාණය සියයට 15 දක්වා වැඩි කිරීමට;

(ඉ) ටින් කරන ලද හෝ වෙනත් අන්දමකින් නරක් නොවිය හැකි අන්දමින් තබා ගන්නා පළතුරු, එලවළු, ආහාර හා බීම වර්ග, රට අඹුරුවලින් නිපදවනු ලබන ගෑස්, සුරුට්ටු, කැබිනට්, සේප්පු සහ කාර්යාලයීය ලී බඩු ආදිය ඇතුළත් ලී භාණ්ඩ, විදුලි උපකරණ, විදුලිබල යන්ත්‍ර, උපකරණ හා අමතර ද්‍රව්‍ය, ලියකියවිලි ගෙන යන බෑග්, ඇඳුම් බෑග්, ගමන් බෑග් සහ අනෙකුත් බෑග් වර්ග සඳහා අය කරන ලද සියයට 5 බද්ද සියයට 10 දක්වා වැඩි කිරීමට;

(ඊ) කොටස් වශයෙන් ගෙන්වා මෙරට සවි කරනු ලබන හෝ නිෂ්පාදනය කරනු ලබන ලොරි සඳහා අය කරනු ලබන සියයට 25 අනුපාතිකය සියයට 5 දක්වා අඩු කිරීම;

(උ) ශ්‍රම ශක්තිය පමණක් යොදා නිපදවනු ලබන ඇලුමිනියම්, පිත්තල හා ඉනැමල් භාණ්ඩ සඳහා අය කරනු ලබන සියයට 15 අනුපාතිකය සියයට 3 දක්වා අඩු කිරීම;

(ඌ) සමුපකාර සමිති හැර අනෙක් ව්‍යාපාරිකයන් විසින් අත් යන්ත්‍ර මගින් නිපදවනු ලබන රෙදිපිළි සඳහා අය කරනු ලබන සියයට 5 අනුපාතිකය සියයට 1 දක්වා අඩු කිරීම.

ඛනිජ තෙල් සංස්ථාව මගින් නිපදවනු ලබන පිරි සහ සුපිරි පැට්‍රල් සඳහා වැඩි වූ බද්ද, ඒ ඒ වර්ගයේ පැට්‍රල් ගැලුමකට ශත 25 බැගින් වැඩි කිරීමෙන් පාරිභෝගිකයා පිට පවරන ලදී.

ව්‍යාපාර පිරිවැටුම් බද්දේ වෙනස්වීම් මගින් බලාපොරොත්තු වූ ශුද්ධ අතිරේක ආදායම රුපියල් දශ ලක්ෂ 29 ක් වූ අතර, මින් රුපියල් දශ ලක්ෂ 21·75 ක් මෙම මුදල් වර්ෂය තුළ දී එකතුකර ගැනීමට බලාපොරොත්තු වේ.

**(iii) බැංකු හර බද්ද**

1957 දී ප්‍රථම වරට පනවනු ලැබූ මෙම බද්ද, 1965 දී ඉවත් කරනු ලැබූ නමුත්, මෙම වර්ෂයේ නැවතත් පනවන ලදී. මෙම බද්ද ඉවත් කිරීමෙන් පසුව වුවද, පාවිච්චි කරන ලද චැක්පත්වල ප්‍රමාණයෙහි කිසි වෙනසක් සිදු නොවූ අතර, නැවතත් මෙම බද්ද පැනවීමෙන් චැක්පත් පාවිච්චි කිරීමේ පුරුද්ද කෙරෙහි හානිදායක බලපෑමක් ඇති නොවනු ඇතැයි විශ්වාස කෙරිණ. සෑම ජංගම ගිණුමකින්ම ලිත් මාසයකදී[1] කරන මුළු හර ප්‍රමාණයෙන් සියයට එකකින් 1/10 ක් මෙම බද්දට අයත් වේ. විශේෂ වර්ගවලට අයත් හර කිරීම් මෙම බද්දෙන් මුදා හැරීමට පිළිවෙලක් යොදා ඇත. සම්පූර්ණ වර්ෂයකදී මෙම බද්ද රුපියල් දශ ලක්ෂ 20 ක අතිරේක ආදායමක් ගෙන දෙන අතර, මෙම මුදල් වර්ෂයේදී එය රුපියල් දශ ලක්ෂ 15 ක් වේ.

**(iv) දේශීය භාණ්ඩ බදු**

දුම්කොළ, බීර, බෝතල් කරන ලද රා සම්බන්ධයෙන් අය කරනු ලබන දේශීය භාණ්ඩ බදු පහත දැක්වෙන පරිදි වෙනස් කිරීමට[2] යෝජනා කරන ලදී.

---

1· 1970 අංක· 27 දරන බැංකු හර බදු පණත.

2· 1970 ඔක්තෝබර් 25 දින අංක· 14,929 දරන ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රය.

(අ) දුම්කොළ රාත්තලක් සඳහා දේශිය භාණ්ඩ බද්ද රුපියල් 5 කින් වැඩි කොට එය රාත්තලකට රුපියල් 42·50 ක් කිරීම. මෙය සිගරට් එකක සිල්ලර මිල සතයකින් ඉහල නැගීමට බලපෑනු ලැබීය.

(ආ) අවුරුදු 10 ක් තුළ නො වෙනස්ව පැවති බීර සඳහා අය කරන දේශීය භාණ්ඩ බද්ද ගැලුමකට රුපියල් 2·50 බැගින් වැඩි වූ අතර, මේ හේතු කොටගෙන බෝතලයක සිල්ලර මිල ශත 42 කින් ඉහළ නැංවිණ.

(ඇ) බෝතල් කරන ලද රා සඳහා අය කරන දේශීය භාණ්ඩ බද්ද බෝතලයකට ශත 10 කින් වැඩි විය.

(v) ආනයන තීරු බදු ව්‍යුහය සුවිධානය කිරීම.

හැසිරවීමට අපහසු හා අක්‍රමවත් ව පවත්නා ආනයන තීරු බදු ලිහිල් කිරීම හා සුවිධානය කිරීම, මූලික තීරුබදු කලාප 6 කට බෙද තීරු බදු ලිහිල් කිරීමක් ඉලක්ක විය.[1] ජීවන වියදම කෙරෙහි බලපාන මූලික පරිභෝජන භාණ්ඩ, මූලික කාර්මික අමු ද්‍රව්‍ය හා කෘෂිකර්මයට අවශ්‍ය වැදගත් යන්ත්‍රෝපකරණ සඳහා නාමික තීරු බදු අනුපාතයක් අය කිරීමක් හෝ තීරු බදු නිදහස් කිරීමක් හෝ යන දෙකින් එකක් විය. සියයට 60 ක සම්මත බදු ප්‍රමාණය විය. විදේශීය විනිමය පිළිබඳ ඇතිකම, ආදායම් අවශ්‍යතාවයන් සහ සාමාන්‍ය බලපත්‍ර ක්‍රමය යටතේ කෙරෙන ආයාතවලට බලපත්‍ර ගාස්තුවක් අය නොකිරීමේ සිද්ධිය යන කරුණු සළකා බලා මෙම අනුපාතිකය තීරණය කෙරේ. ආයාත කළ භාණ්ඩයක් එක් අතකින් නිදහස්, නාමික හෝ සහනදායි වූ අනුපාත කලාපයකට හෝ අනෙක් අතින් ආරක්ෂක හෝ උපරිම තීරු බදු කලාපයකට හෝ මාරු කිරීමට විශේෂ හේතුවක් නොමැති නම්, මේ කලාපයට ඇතුළත් වේ. සම්මත අනුපාතයකට ඉහළින් වූ තීරු බදු කලාපයන්හි, ඉලක්කය වන්නේ දේශීය නිෂ්පාදන කටයුතු සුරක්ෂිත කිරීමත්, අවශ්‍ය අමතර කොටස් අනුක්‍රමයෙන් මෙහි නිපදවීමට රුකුල් දීමත්, අනාගත සංවර්ධනයට ඉඩ ඇති යෝජනා ක්‍රමවලට ධෛර්‍යදීමත් ය. ඉහළම බදු කලාපයට අයත් වන්නේ ඉතිරි භාණ්ඩ සමූහය වන අත්‍යවශ්‍ය නොවන හා සුඛෝපභෝගී භාණ්ඩයන්ය.

නව ආනයන බදු ව්‍යුහය සම්පූර්ණ වර්ෂයක් තුළදී රුපියල් දශ ලක්ෂ 60 ක් ලබාදීමට අපේක්ෂා කෙරෙන අතර, පවත්නා මුදල් වර්ෂය තුළදී රුපියල් දශ ලක්ෂ 45 ක අමතර ආදායමක් ලබාදීමට අපේක්ෂා කෙරේ. පවත්නා මුදල් වර්ෂය තුළ වූ මෙම රුපියල් දශ ලක්ෂ 45 විශේෂයෙන්ම පහත සඳහන් ආකාරයෙන් රැස් කිරීමට බලාපොරොත්තු විය.

(අ) බීඩි කොළ රාත්තලකට අය කළ තීරු බද්ද ශත 21 කින් වැඩි කොට එය රුපියල් 5 ක් කිරීම;

(ආ) සීමාසහිත සළුසලට තීරු බදු රහිතව රෙදිපිළි ආනයනය කිරීම සඳහා දී තිබූ සහනය ඉවත් කිරීම;

(ඇ) මේ දක්වා තීරු බදු රහිතව ආයාත කරන ලද අමු ද්‍රව්‍ය හා ප්‍රාග්ධන භාණ්ඩ විශාල සංඛ්‍යාවක් සඳහා සියයට 5 ක නාමික තීරු බදු අනුපාතිකයක් අය කිරීම.

(vi) මිනිරන් අපනයන බදු වැඩි කිරීම.

සම්ප්‍රදායික නොවන නිර්යාත ද්‍රව්‍යයක් වූ මිනිරන්, වි. වි. හි. ස. ක්‍රමයට ඇතුළත් වන අතර, එය වර්තමානයේ සියයට 5 ක අමතර ආදායමක් උපදවයි. 1969 අගෝස්තු මාසයේ සියයට 25 ක නිර්යාත බද්දක් පැනවීම හේතු කොට ගෙන මිනිරන් නිර්යාත කිරීමෙන් ලැබුණු එම අමතර ශුද්ධ වාසිය සියයට 30 දක්වා අඩු විණ. ශුද්ධ වාසියෙන් සියයට 5 ක් දේශීය නිෂ්පාදකයාට ලැබෙන පරිදි මෙම තීරු බද්ද සියයට[2] 50 යෝජනා දක්වා වැඩි කිරීමට යෝජනා කෙරිණ. මෙම විධිවිධානයෙන් අපේක්ෂිත ආදායම මුළු වර්ෂයක් තුළදී රුපියල් දශ ලක්ෂ එකක් වන අතර, පවත්නා වර්ෂයේදී රුපියල් දශ ලක්ෂ 0·75 ක් වේ.

---

1· 1970 ඔක්තෝබර් 26 වෙනි දින අංක· 14,929/5 දරන ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් නිවේදනය.

2· 1970 ඔක්තෝම්බර් 25 දින අංක 14,929/3 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය.

(vii) **මෝටර් රිය බලපත්‍ර ගාස්තු.**

දැනට මෝටර් රථ කොමසාරිස් වරයාගේ දෙපාර්තමේන්තුව විසින් අය කෙරෙන ගාස්තු රජය මගින් සැපයෙන සේවාවන් හා සමානකර බලන කළ ඉතා සුළු බැව් පෙනී යන හෙයින්, කාර්, ලොරි, හා වෑන්රිය අයිතිය මාරු කිරීම සඳහා අය කෙරෙන ගාස්තු ද මෝටර් රිය පැදවීමේ බලපත්‍ර නිකුත් කිරීමේදී හා මෝටර් රිය පැදවීමේ බලපත්‍ර දීර්ඝ කිරීමේදී අය කෙරෙන ගාස්තු ද මෝටර් රථ සඳහා අය කෙරෙන වාර්ෂික ගාස්තු ද සංශෝධය කිරීමට බලාපොරොත්තු වීය. මෙම විධිවිධාන මගින් මුළු මුදල් වර්ෂයකදී රුපියල් දශ ලක්ෂ 7 ක් ද, පවත්නා මුදල් වර්ෂයේදී රුපියල් දශ ලක්ෂ 5·25 ක් ද ලැබේ යයි බලාපොරොත්තු විණ.

(viii) **සංස්ථාවලින් කරන විශේෂ අය කිරීම**

මෙම අය වැය ලේඛනයේදී දේපල ක්ෂය වීම සහ බදු වෙනුවෙන් ගෙවිය යුතු කොටස අඩු කිරීමෙන් පසුව සංස්ථාවල ඉතිරි වන්නා වූ ශුද්ධ වාර්ෂික ලාභය පහත සඳහන් කාර්යයන්ට අනුපිළිවෙලින් යෙදීම සඳහා මුදල් කෙටුම්පත් පනතේ නීති සංශෝධනය කිරීමට යෝජනා කෙරිණ:

(අ) අදල ඇමතිතුමා සමඟ සාකච්ඡා කිරීමෙන් පසුව මුදල් ඇමතිතුමා නියම කරන යම් මුදල් ප්‍රමාණයක් ඒකාබද්ධ අරමුදලට ගෙවීම සඳහා;

(ආ) අදල ඇමති තුමාගේ අනුමතිය ඇතිව අධ්‍යක්ෂ මණ්ඩල තීරණය කළ පරිදි ආයතනයේ සේවකයින්ට බෝනස් මුදලක් ගෙවීමට සහ වෙනත් එවැනි අරමුණු සඳහා;

(ඇ) ආයතනයේ සාමාන්‍ය සහ විශේෂ සංචිතයන්ට වාර්ෂික ලාභයෙන් ඉතිරිවන ශේෂය, ගෙවීම සඳහා;

මේ අනුව රජය විසින් ආයෝජනය කොට තිබෙන මූල ධනයෙන් සංස්ථා හා සමායතනවලින් වන විශේෂ අය කිරීම් සම්පූර්ණ වර්ෂයකදී රජය අපේක්ෂා කළ අමතර ආදයම රුපියල් දශ ලක්ෂ 60[1] ක් වන අතර, පවත්නා මුදල් වර්ෂය තුළදී එය රුපියල් දශ ලක්ෂ 33·75 ක් විය. ඒකාබද්ධ අරමුදලට වන ලැබීමක් වශයෙන් අපේක්ෂා කළ රුපියල් දශ ලක්ෂ 60 ක ගණන විවිධ ආයතනයන්ගෙන් එකතුකර ගැනීමට විය. මෙවැනි ආයතනයන්ගෙන් සමුපකාර තොග වෙළඳ සංගමය (රුපියල් දශ ලක්ෂ 15), සිමෙන්ති සංයුක්ත මණ්ඩලය (රුපියල් දශ ලක්ෂ 10), ලංකා ඛනිජ තෙල් සංස්ථාව (රුපියල් දශ ලක්ෂ 10) ලංකා සිමෙන්ති සංයුක්ත මණ්ඩලය (රුපියල් දශ ලක්ෂ 10), ලංකා රක්ෂණ සංස්ථාව (රුපියල් දශ ලක්ෂ 5), හා ලංකා විදුලි බල මණ්ඩලය (රුපියල් දශ ලක්ෂ 5) ප්‍රධාන ඒවා වෙත්.

(ix) **තැපැල් දුරකථන හා විදුලි පණිවුඩ ගාස්තු සංශෝධනය කිරීම**

සංශෝධනය කළ යෝජිත අනුපාතිකයන්ට විදේශීය ලිපි, දේශීය විදුලි පණිවුඩ, දේශීය හා විදේශීය දුරකථන ගාස්තු හා බදු වැඩි කිරීම් ඇතුළත් වෙයි. කොළඹත් පිට පළාත්වලත්, ප්‍රදේශයේ සීමාවන් තුළ ගන්නා සාමාන්‍ය ටැලිපෝන් පණිවුඩයකට අය කරන මුදල ශත 5 කින් වැඩි කිරීමද, විදුලි පණිවුඩ සඳහා (රට අභ්‍යන්තරයේ) අමතර වචනයකට ශත 5 ක වැඩි කිරීමක් ද යෝජිත වැඩි කිරීම්වලට ඇතුළත් විය. එවැනි විදුලි පණිවුඩවල මුල් වචන 75 සඳහා අය කරන ගාස්තුව නො වෙනස්ව පැවතිණ. ව්‍යාපාරික දුරකථන සඳහා අය කරන ගාස්තුව වර්ෂයකට රුපියල් 100 කින් වැඩි කළ අතර, පුද්ගලික දුරකථන සඳහා අය කරන වාර්ෂික ගාස්තුව වර්ෂයකට රුපියල් 50 කින් වැඩි කරන ලදී. ඉහත සඳහන් කළ වෙනස් කිරීම් නිසා සම්පූර්ණ වර්ෂයකදී රුපියල් දශ ලක්ෂ 15 ක අමතර ආදයමක් සැපයෙන අතර, පවත්නා මුදල් වර්ෂයේදී රුපියල් දශ ලක්ෂ 11·25 ක අමතර ආදයමක් ලබා දෙනු ඇත.

---

1· 1970 ඔක්තෝබර් 25 වෙනි දින අංක 14929/3 දරණ ලංකාණ්ඩුවේ අතිවිශේෂ ගැසට් පත්‍රය.

(x) වරාය ගාස්තු වැඩි කිරීම

1967 දී රුපියල අවප්‍රමාණය කළ අවස්ථාවේදී එකල පැවති වරාය ගාස්තු සංශෝධනය නොකෙරිණ. ඒ නිසා ඇතිවන විදේශීය විනිමය ඉපයීම්හී වූ පාඩු මඟහැරවීමට හා එම ඉපැයුම් අවප්‍රමාණය කිරීමට පළමු තත්ත්වයට ගෙන ඒමට වරාය ගාස්තු සියයට 25 කට ආසන්න ගණනකින් වැඩි කිරීමට යෝජනා කරන ලදී. මෙයින් සම්පූර්ණ වර්ෂයකදී අපේක්ෂිත අමතර ආදායම රුපියල් දශ ලක්ෂ 7 ක්වූ අතර, පවත්නා මුදල් වර්ෂයේදි වන අමතර ආදායම රුපියල් දශ ලක්ෂ 5·25 ක් වේ.

(xi) තාවකාලික වාස බද්ද

කලින් පැවති තාවකාලික වාස බද්ද යළිත් හඳුන්වා දීමට මෙයින් අපේක්ෂා කෙරිණ. ලංකාවේ ලාභ දයක රක්ෂාවල යෙදී සිටින හෝ ව්‍යාපාර පවත්වාගෙන යන පුරවැසියන් නොවූවන් ලබන සහල් සහනාධාරය, නිදහස් අධ්‍යාපනය හා නිදහස් වෛද්‍ය පහසුකම් ආදිය සඳහා වැය වන සුභසාධක වියදම්වලින් කොටසක් මෙම බද්ද මගින් ඔවුන්ගෙන් රජයට බදු වශයෙන් ලබාගැනීමට සමත්වනු ඇත. එයින් තවත් බලාපොරොත්තු වූ දෙයක් නම් තාවකාලික වාස බලපත්‍ර හිමියන්ට සිය කැමැත්තෙන්ම ලංකාවෙන් හැර යාමට තුඩු දෙන සානුබලයක් ඇති කිරීමයි. එසේ වුවත්, 1964 ඉන්දු ලංකා ගිවිසුමට යටත් වන අය ඇතුළු යම් කණ්ඩායමක් මෙම බද්දෙන් නිදහස් කිරීමට අවශ්‍ය වගන්ති ඇතුළත් කළ යුතු විය. වර්ෂයකට අය කළ යුතු වූ බද්ද රුපියල් 500 ක් වූ අතර, සම්පූර්ණ වර්ෂයකට ඉන් ලැබෙන ආදායම රුපියල් දශ ලක්ෂ 4 ක් වනු ඇත. එසේ වුවත්, මෙම බද්දෙන් පවත්නා මුදල් වර්ෂයේදී අපේක්ෂිත ආදායම වූයේ රුපියල් දශ ලක්ෂ 3 කි.

(xii) මූල්‍ය ධන අය කිරීම්

1970 මාර්තු 31 වැනිදට වූ පවුලක ශුද්ධ වත්කම හා පුද්ගලයෙකුගේ ශුද්ධ වත්කම සඳහා මූලධන අය කිරීම වරකින්ම ගෙවිය යුත්තක් හැටියට නියම කරන ලදී. මෙම බද්ද රුපියල් 2,00,000 කට වඩා ශුද්ධ වත්කමක් ඇති ඉහළ ආදායම් ලබන්නවුන්ගෙන් අය කිරීමට අදහස් කෙරිණ. පවුලක් හෝ පුද්ගලයෙක් සතු නිවාසයක් ඇත්නම් මූලධනය අය නොකිරීමේ සීමාව රුපියල් 2,50,000 ක් විය. ශුද්ධ වත්කම ගණනය කෙරෙන්නේ පවතින ධන බද්ද අය කිරීමේදී අනුගමනය කෙරෙන පදනම මතමය.

මූලධන අයකිරීම් අනුක්‍රමික අනපාතිකයක් අනුව අය කිරීමට නියම වූයේ වැඩිවන සෑම රුපියල් 2,00,000 කට පිළිවෙලින් 3%, 5%, 10% හා 15 ආදී වශයෙන් බදු අය කෙරෙන තීරු 4 ක් මුලින් වීය. වැඩිවන සෙසු ප්‍රමාණයෙන් බදු අය කිරීම සියයට 25 ක් වීය. මුදලින් මෙම අය කිරීම් ගෙවීමට නොහැකිවන ධන බදු ගෙවන්නන් සඳහා දේපල මගින් බදු ගෙවීම් නිදහස් කර ගැනීමට කටයුතු සැලසීමේ අයිතිය ලැබිණ. අවුරුදු 3 ක කාලච්ඡේදයක් ඇතුළත මෙම ධන බද්ද සම්පූර්ණයෙන්ම ලබා ගැනීමට අපේක්ෂා කළ අතර, එයින් රුපියල් දශලක්ෂ 5 ක් පළමු සම්පූර්ණ වර්ෂයේදී අපේක්ෂා කෙරිණ. මෙම විධිවිධානයෙන් මුල් වර්ෂයේදී රුපියල් දශ ලක්ෂ 5 ක් ලබා ගැනීමටත්, පවත්නා මුදල් වර්ෂයේදී රුපියල් දශ ලක්ෂ 3·75 ක් ලබා ගැනීමටත් අපේක්ෂා කෙරිණි[1].

(xiii) වෙනත් යෝජනා

ඉහත සඳහන් කළ නව ආදායම් විධිවිධානයන් හැර, අයවැය කථාවේදී බදු සංශෝධනයන් කිහිපයක්ම කළ අතර, ඒවායේ ආදායම් ප්‍රතිවිපාක නොදවැදගත් සේ සලකන ලදී.

ඒවා පහත සඳහන් පරිදිය:

(අ) පුද්ගලයන් මත පනවන ලද ආදායම් බදු අනුපාතිකයන්ට කළ ගැලපීම:

රුපියල් 50,000 ට වැඩි බදු අය කළ හැකි ආදායම් පරාශය පිළිබඳව සීඝ්‍ර අනුක්‍රමික අනුපාතිකයක් සහතික කිරීම පිණිස පුද්ගලයන්ගේ ආදායම් බදු අනුපාතිකයන් සංශෝධනය කළ යුතු විය. සියයට 17½ හා සියයට 20 ක පැවති රුපියල් 3600 තීරු දෙක එම අනුපාතිකයන් සහිතවම රුපියල් 2,400 තීරු

1. මෙම මූල්‍ය ධන අය කිරීම වර්ෂ 3 ක කාලච්ඡේදයකදී සම්පූර්ණ කළයුතු වූ අතර ඉන් රුපියල් දශ ලක්ෂ 3 ක් මුල් සම්පූර්ණ වර්ෂයේදී අපේක්ෂා කෙරිණ.

දෙකකට අඩු කිරීමෙන් එය කෙරිණ. අනෙක් වෙනස් කිරීම වූයේ සියයට 40 ක බදු අය කෙරෙන ආදායම් තීරුවල වෙනස් කිරීමකි. මේ අනුව සියයට 40 ක පරිමාණයට නියම වූ රුපියල් 7,200 තීරුවක්ද, සියයට 50 හා සියයට 60 යන පරමාණයට නියම වූ රුපියල් 10,000 තීරු දෙකක් ඇති කරන්නට බලාපොරොත්තු විය.

(ආ) සහල් සහනාධාර බද්ද

අයවැය කථාවේදී 1970 ඔක්තෝබර් 1 වෙනිද සිට ක්‍රියාත්මක වන පරිදි සහල් සහනාධාර බද්ද අවලංගු කිරීමට අයවැය කථාවේදී යෝජනා කරන ලදී. මෙම බද්ද, වර්ෂයකට රුපියල් 12,000 කට අධික තක්සේරු ආදායමක් ලබන්නාවූ පුද්ගලයින්ගෙන් අය කෙරුණ අතර, සෑම සලාක පොත අයිති පුද්ගලයෙකුගෙන්ම රුපියල් 1.25 ක බද්දක් අය කරනු ලැබිණ. එසේ අය කළේ සතියකට සහල් සලාකය අනුව ලැබෙන සෑම සහල් සේරු 4 ක් හෝ සෑම වී සේරු 8 ක් වෙනුවෙනි. මෙයින් පැහැදිලි වූයේ එය බදු ගෙවන්නාට හා ආදායම් බදු දෙපාර්තමේන්තුවට ද නොනිසි බරක් වූ බවත්, මෙම බද්දෙන් එක්වන මුදල් ප්‍රමාණය පරිපාලන අමාරුකම් සහ අනෙකුත් දුෂ්කරතාවයන්ට සරිලන මුදලක් නොවූ බවත්ය. (එසේ වුවත් මෙම බද්ද අවලංගු කිරීමට කළ යෝජනාව පසුව ඉවත් කර ගන්නා ලදී.)

(ඇ) වි. වි. හි. ස. යටතේ කළ ආනයනයන්:

මෙහිදී වි. වි. හි. ස. ක්‍රමයෙන් පොත් හා සඟරා, ද්විචක්‍ර ට්‍රැක්ටර්. උපකරණයන් හා ඒවායේ ආම්පන්න, කපු පුළුන් නූල් හා අමු කපු ආනයනය නිදහස් කිරීමට සිදුවූ බව ප්‍රකාශ කෙරිණි. ඒ වගේම වි. වි. හි. ස. වලින් ලැබෙන ආදායම් නැතිවීම වැළැක්වීම පිණිස දැනට වි. වි. හි. ස. බළපාන්නේ නැති භාණ්ඩ කිහිපයකට එනම්, සීනි, තිරිඟු, ශ්‍රී ලංකා සීනි සංස්ථාවේ ආනයන භාණ්ඩ, ලංකා ගමනා ගමන මණ්ඩලයේ හා විදුලිබල මණ්ඩලයේ ආනයන නැවත වි. වි. හි. ස. යටතට ගෙන එන ලදී.

(ඈ) අළුත් කරමාන්ත ආරම්භ කිරීමේ තත්වය:

කර්මාන්ත අමාත්‍යාංශය විසින් 'ආරම්භක තත්ත්වයේ' යයි අනුමත කළ කර්මාන්තයන්ට බදු සහනයක් දීම සිරිතක් වශයෙන් කෙරේ. රජයේ කාර්මික ප්‍රතිපත්තිය නැවත සැකසීමේ ක්ෂේත්‍රය තුළ මෙම ආරම්භක තත්වය ප්‍රදනය කිරීමේ පදනම වෙනස් කළ යුතු බව අයවැය කථාවෙන් කියැවුණි. මෙමආරම්භක තත්ත්වය ප්‍රදනය කිරීම සඳහා වෙනත් කරුණු සමග ව්‍යවසායේ අයිතිය පිළිබඳ පුළුල් පදනම, බෙදනු ලබන ලාභ සීමා කිරීම, අධ්‍යක්ෂවරුන්ට සහ ඔවුන්ගේ නියෝජිතයන්ට ලැබෙන සියළුම වාසි වාර්ෂික ගිණුම් වාර්තාවේ පළ කිරීම යන කරුණු ද අවශ්‍ය වේ. පහත දැක්වෙන කරුණුවලින් එකක් හෝ ඇති බව ආරම්භක තත්ත්වය ලබාගැනීම සඳහා ව්‍යවාසයයන් සනාථ කළයුතුය. එනම්, පිරිවැටුමෙන් සියයට 50 ක් නිර්යාත ජනිත වීම; රටේ ඌණ සංවර්ධිත හෝ කාර්මික නොවූ ප්‍රදේශයක ස්ථාන ගතවී තිබීම; මෙතෙක් මෙරට සැලකිය යුතු ලෙසින් නො නිපදවූ සහ අත්‍යාවශ්‍ය පාරිභෝගික භාණ්ඩයන් නිපැදවීම; හෝ ආරම්භක තත්ත්වයේ පසුවන නිසා සානුබලය වැඩියෙන් අවශ්‍ය කර්මාන්තයන් යන කරුණු වේ. මෙම කරුණුවලින් එකක් පෙන්වා දී, 'ආරම්භක තත්ත්වය' ලබාගත් ව්‍යවසායකට පසු අවස්ථාවකදී වෙනත් කරුණක් පෙන්වා ආරම්භක තත්ත්වය තුළ තවදුරටත් රැඳී සිටිය නොහැක.

**2. වියදම් පිළිබඳ විධිවිධාන**

1970/71 මුදල් වර්ෂය සඳහා වූ රජයේ වියදම් යෝජනා අයවැය කථාවට පෙර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරණ ලද මූලික ඇස්තමේන්තුවල දැක්විණ. වී. වි. හි. ස. ක්‍රමය යටතේ සීනි ආනයනය කිරීම පිණිස කෙරෙන ලද යෝජනාවන් හැර වෙනත් වැදගත් යෝජනාවක් අයවැය කථාවෙහි නොවිණ. මෙම විධිවිධානය අනුව, සීනි පිළිබඳ මුළු පිරිවැයට රුපියල් දශලක්ෂ 87 ක් එකතු වේ යයි අපේක්ෂා කෙරිණ. අයවැය කථාවේ කාරක සභා අවස්ථාවේදී කරන ලද සංශෝධනයක් නම්, රාජ්‍ය චිත්‍රපටි සංස්ථාව උදෙසා රුපියල් දශ ලක්ෂ 10 ක් වෙන් කිරීමය.

සේවා වියුක්තිය පිළිබඳ ක්‍ෂණික පීඩනයට විසඳුමක් වශයෙන් ත්වරණාත්මක සේවා නියුක්ති වැඩ පිළිවෙලක් සඳහා වෙන් කෙරෙන රුපියල් දශ ලක්‍ෂ 200, ප්‍රාග්ධන ගිණුමේ අඩංගු වැදගත් ශීර්ෂයක් වේ. මෙම කෙටි කාලීන සංවර්ධන සැලැස්ම ක්‍රම සම්පාදන හා රැකීරක්‍ෂා අමාත්‍යාංශය විසින් සැකසීමට යන පුළුල් සංවර්ධන සැලැස්මේ පළමු අවස්ථාව වේ. දළ වශයෙන් පුද්ගලයින් 100,000 කට රැකී රක්‍ෂා ලබාදීමට සැලසුම් කළ මේ වැඩ පිළිවෙල යෝජනා ක්‍රම සහ ග්‍රාමීය සංවර්ධන වැඩපිළිවෙලවල් 16 කින් සමන්විත වේ. එය පරිපාලන කළමනාකාර ධුරයන් පිළිබඳ පුහුණුවීම්, කර්මාන්ත හා වෙළඳ අංශවල වෘත්තීමය පුහුණුවීම්, හා ග්‍රාමීය සංවර්ධන සැලසුම් සහ කෘෂිකර්මයෙහි තෝරාගත් යෝජනා ක්‍රම පිළිබඳ පුළුල් ජාතික සැලැස්මක් යනාදිය මගින් රැකීරක්ෂා රාශියක් ඇති කිරීමට බලාපොරොත්තු විය.

### 3. අයවැය හිඟය පියවීම සඳහා සම්පත් යොදා ගැනීම පිළිබඳ විධිවිධාන

නව ආදායම් යෝජනා හැර සමස්ථ අයවැය හිඟය පියවීමට යොදා ගැනෙන ඇතැම් බදු නොවන යෝජනාද අයවැය කථාවෙහි ඇතුලත් විය. ඒවා පහත සඳහන් අයුරු වෙයි.

#### (i) අනිවාර්ය ඉතිරි කිරීමේ ක්‍රමය

1971 ජනවාරි 1 වෙනිද සිට පුද්ගලයින් සහ සමාගම් සඳහා අනිවාර්ය ඉතිරි කිරීමේ ක්‍රමයක් ක්‍රියාත්මක කළයුතු වූ අතර, එය ලිත් වර්ෂයකට පමණක් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිතවීය.[1] රජයේ සමායතන, ත්‍යාගශීලි ආයතන සහ ඊට සමාන ආයතන මෙම ක්‍රමයෙන් බැහැර වේ.

සේවක අර්ථසාධක අරමුදලට සියයට 2 ක අමතර ගෙවීමක් කරන රුපියල් 6,000 සිට රුපියල් 12,000 අතර වාර්ෂික ගෙවුමක් කරණ සේවකයන් හැර, රුපියල් 6,000 ට වැඩි ආදායමක් ලබන සෙසු සියළුම පුද්ගලයන්ට මේ ක්‍රමය බලපානු ඇත. ආදායම් බදු සහ ලාභාංශ ගෙවීමෙන් පසු ඉතිරිව ඇති ලාභවලින් සියයට 50 ක් ගෙවීමට සමාගම්වලට සිදුවේ. සමාගම් ලාභාංශවලට සියයට 12 ක ඉහළ සීමාවක් පැනවූ අතර, එම සියයට 12 ට වඩා ඇති සියළුම ලාභාංශ අනිවාර්ය ඉතිරි කිරීම් වශයෙන් ගෙවිය යුතු විය.

අනිවාර්ය ඉතිරි කිරීම් ගණනය කරන අනුපාතිකයන් පහත දැක්වේ:

| | | |
|---|---|---|
| 1. | රුපියල් 6,000 සහ රුපියල් 12,000 අතර මුළු ආදායමක් ලබන බදු ගෙවන්නන් (සේ. අ. අ. සඳහා ගෙවීම් කරන සේවකයන් හැර). | මුළු ආදායමෙන් සියයට 2. |
| 2. | රුපියල් 12,000 සහ රුපියල් 25,000 අතර මුළු ආදායමක් ලබන බදු ගෙවන්නන් | මුළු ආදායමෙන් සියයට 5. |
| 3. | රුපියල් 25,000 සහ රුපියල් 60,000 අතර මුළු ආදායමක් ලබන බදු ගෙවන්නන්. | මුළු ආදායමෙන් සියයට 10. |
| 4. | රුපියල් 60,000 සහ රුපියල් 140,000 අතර මුළු ආදායමක් ලබන බදු ගෙවන්නන්. | මුළු ආදායමෙන් සියයට 15. |
| 5. | රුපියල් 140,000 ට වැඩි මුළු ආදායමක් ලබන බදු ගෙවන්නන්. | මුළු ආදායමෙන් සියයට 20. |
| 6. | ආදායම් බදු සහ ලාභාංශ ගෙවීමෙන් පසු ලාභ ඇති සමාගම්. | මුළු ආදායමෙන් සියයට 50. |

පුද්ගලික ආදායම් මත රුපියල් 3,500 ක උපරිම සීමාවක් හා සියයට 12 සියලු සමාගම් ලාභාංශ මත උපරිම සීමාවක් පැනවීමේ බලපෑමක් මෙම අනුපාතයන් සතුවේ. සිය බදු ගෙවීම් පිළිබඳ දුෂ්කරතාවයන්ට මුහුණ පා ඇති ඇතැම් ධන බදු ගෙවන්නන්ට සහනයක් වශයෙන් 1971/72 තක්සේරු වර්ෂය සඳහා ධන බද්ද සම්බන්ධයෙන් ඔවුන්ගේ වගකීම් අනිවාර්ය ඉතිරි කිරීම් මගින් පියවීමට යෝජනා කෙරිණි.

---

1. 1971 වර්ෂයේ අංක 6 දරන අනිවාර්ය ඉතිරි කිරීමේ පණත.

බදු-නොවන යෝජනාව මගින් රජයේ සුරකුම් පත්වල ආයෝජනය කළයුතු වූ රුපියල් දශ ලක්ෂ 105 ක ආදායමක් අපේක්ෂා කෙරිණ. (සමාගම් හා සම්බන්ධ යෝජිත අනිවාර්ය ඉතිරි කිරීමේ ක්‍රමය පසුව අවලංගු කළ අතර, සමාගම් මත පැනවෙන වර්තමාන බදු අනුපාතයන් ඉහළ නැංවීමට අපේක්ෂා කෙරේ.)

**(ii) සේවක අර්ථසාධක අරමුදල**

අතිරේක සම්පත් ලබා ගැනීමට සේවක අර්ථසාධක අරමුදල් පනත ක්‍රියාත්මක කිරීමේදී, පුළුල් වෙනස් කිරීම් වලියක් යෝජනා කරන ලදී.[1] අනුපාතිකයන් වැඩි කිරීම ii විෂය ක්ෂේත්‍රය පුළුල් කිරීම හිඟ මුදල් එකතු කිරීම මේවාට ඇතුළත්ය.

(අ) අර්ථසාධක අරමුදලට, සේවකයන් සහ සේව්‍යයන් විසින් පිළිවෙලින් ගෙවනු ලබන සියයට 4 රේ සහ සියයට 6 ප්‍රමාණය වෙනුවට එය සියයට 6 සහ සියයට 9 දක්වා වැඩි කිරීම.

(ආ) එක සේවකයකු සිටින සහ සියළු අසථිර සේවකයන් සිටින ආයතනද අරමුදලට ඇතුළත් කළ හැකි පරිදි සීමාව අඩු කිරීමෙන්, සේවක අර්ථසාධක අරමුදල් පනතට දැනට හසුවන ප්‍රමාණය දීර්ඝ කෙරිණ.

(ඇ) දෙශීය ආදායම් කොමසාරිස්වරයා විසින් භුක්ති විඳින බලතලවලට සමාන බලතල කම්කරු කොමසාරිස්වරයාට ලබා දීමේ අටියෙන් සේවක අර්ථසාධක අරමුදල් පනත සංශෝධනය කිරීමෙන් අයවිය යුතු හිඟ මුදල් කම්කරු දෙපාර්තමේන්තුව සහ ශ්‍රී ලංකා මහ බැංකුව මගින් එකතු කිරීමේ කටයුතු වඩාත් පහසු කරන ලදී. ඒ හැර දයක මුදල් නොගෙවීමට පිළියමක් වශයෙන් දැනට පවත්නා සම බද්ද වෙනුවට අනුක්‍රමික බද්දක් පැනවීමට සිදුවිය.

මෙම යෝජනාවල ප්‍රතිඵලයක් එකතු කිරීම් වශයෙන් අවුරුද්දක් තුළදී රුපියල් දශලක්ෂ 70 ක වැඩිවූ එකතු කිරීම් ලබා ගැනීමට බලාපොරොත්තු විය. මෙම මුදලින් රුපියල් දශලක්ෂ 35 ක් නැතහොත් අවුරුදු භාගයක දයක මුදල් එකතු කිරීම් මෙම මුදල් වර්ෂයේ සමස්ථ අයවැය හිඟය පියවීම සඳහා රජයේ සුරකුම්පත්වල ආ යෝජනය කිරීමට බලාපොරොත්තු වේ.

**(iii) පොලී අනුපාතිකයන්**

තැපැල් කන්තෝරු සේවිංස් බැංකුවේ ඉතිරි කිරීම් තැන්පතු සඳහා පොලි ප්‍රමාණය වර්ෂයකට සියයට 3·6 සිට සියයට 7·2 දක්වා වැඩි කරන ලද අතර මෙම අළුත් පොලී අනුපාතිකය 1971 ජනවාරි 1 සිට ක්‍රියාත්මක වන්නට විය. අවුරුදු 6 සිට 7 දක්වා වැටෙන රජයේ සුරකුම් පත් සඳහා ගෙවන පොලී අනුපාතිකය සියයට 6 සිට 9 දක්වා වැඩි කිරීමට යෝජනා කරන ලදී. පොලී අනුපාතිකයන් සංශෝධනය කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් රජයේ සුරකුම් පත් දැරීම් හි වැඩිවීම පවතින මුදල් වර්ෂය තුළදී රුපියල් දශලක්ෂ 30 වශයෙන් ඇස්තමේන්තු කරන ලදී. පවතින මුදල් වර්ෂය සඳහා සම්පූර්ණ අයවැය හිඟය පියවීමේ අවශ්‍යතාවන් පිණිස මෙම අයබදු නොවන ත්‍රිවිධ යෝජනාවලින් බලාපොරොත්තු වූ ශුද්ධ ආදායම රුපියල් දශලක්ෂ 170 කි. මෙම ප්‍රමාණය පහත දැක්වෙන පරිදි මෙසේ සකස් කළ හැකිය.

රුපියල් දශලක්ෂ

| | |
|---|---|
| අනිවාර්ය ඉතිරි කිරීමේ ක්‍රමයෙහි ප්‍රතිඵලයක් වශයෙන් රජයේ සුරකුම් පත් දැරීම්හි වැඩිවීම | 105·0 |
| අර්ථසාධක අරමුදල් - අනුපාතිකයන්හි වැඩිවීම, විෂය ක්ෂේත්‍රය පුළුල් කිරීම සහ හිඟ මුදල් එකතු කිරීම | 35·0 |
| පොලී අනුපාතිකයන් සංශෝධනය කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් රජයේ සුරකුම් පත් දැරීම්හි වැඩිවීම් | 30.0 |
| | 170·0 |

1. සේවක අර්ථසාධක අරමුදල් (සංශෝධන) පනත 1971 අංක 8 දරන.

**4. අයවැය කථාවෙන් ඉදිරිපත් කරන ලද වෙනත් විධිවිධාන**

**(i) උපයනවාත් සමග ගෙවීමේ ක්‍රමය.**

1971 ඔක්තෝබර් 1 වෙනිද සිට උපයනවාත් සමගම බදු ගෙවීමේ ක්‍රමය ක්‍රියාත්මක කෙරිණ. මෙම ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා බද්ද වේතනයෙන් අඩු කර ගැනීමේ පිළිවෙතට කැපවූ සියලුම බදු ගෙවන්නන් ලියාපදිංචි කිරීමට අවශ්‍ය වූ හෙයින් (දැනට ලියාපදිංචි කර ඇති බදු ගෙවන්නන්ට අමතරව යටත් පිරිසෙයින් අළුත් අය 25,000 ක් පිළිබඳව ලියාපදිංචි කිරීම සහ බද්දට තක්සේරු කිරීම මෙයින් සිදු වෙයි.) 1969-70 සහ 1970-71 යන බදු වර්ෂයන්හි තක්සේරු ආදායම වර්ෂයකට 6,000 කට අඩු සියළු දෙනාම බදු ගෙවීමෙන් නිදහස් කිරීමට යෝජනා කෙරිණ. මෙම වෙනස හැර, 1970-71 වර්ෂය සහ පූර්ව වර්ෂයන් පිළිබඳව බදු තක්සේරු කිරීම සහ අය කිරීම දැනට පවත්නා විධිවිධාන යටතේ කෙරෙනු ඇත.

රුපියල් 12,000 ට අඩු තක්සේරු ගත ආදායම් ලබන පුද්ගලයන් ගෙවිය යුතු බදු පිළිබඳව අවසාන විසඳුමක් වශයෙන් උපයනවාත් සමගම ගෙවීමේ ක්‍රමය යටතේ අඩු කරන ලද බදු පිළිගැනීම සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ඇතැම් සංශෝධන කළ යුතු විය. බදු ගණනය කිරීමට පෙර සේවකයන් විසින් අර්ථසාධක අරමුදලට වැන්දඹු සහ අනත්දරු අරමුදලට මෙන්ම රක්ෂණ වාර මුදල් උදෙසාද වැය කරන ලද මුළු මුදල් වැටුපෙන් අඩු කළ යුතුවේ. වර්ෂයකට රුපියල් 300 දක්වා ගෙවනු ලබන පොලී මුදල් අත් හැරීමට කරන ඉල්ලීම් වැලැක්වීම පිණිසද උපයනවාත් සමග ගෙවීමේ ක්‍රමය සඳහා සංඛ්‍යා සටහන් පිළියෙල කිරීමේදී සේවා ආදායමෙන් වාර්ෂිකව තවත් රුපියල් 300 ක් අත් හැරේ. 1972/73 තක්සේරු වර්ෂයේ සිට සියළුම මාර්ගයන්ගෙන් ලැබෙන ආදායම තක්සේරු කරනු ලබන්නේ ජංගම වර්ෂ පදනමක් යටතේය. මේ ක්‍රමය අනුව, සේවා නියුක්ති නොවන මාර්ගයන්ගෙන් ආදායම් ලබන පුද්ගලයන්ට තමා විසින්ම කරනු ලබන තක්සේරුවක් උඩ කල් ඇතිව බදු ගෙවීමට හැකිවනු ඇත.

**(ii) රාජ්‍ය අංශය සඳහා ඒකානුරූප ගණක කාලච්ඡේදයක්**

1972 ජනවාරි 1 වෙනිද සිට සමස්ථ රාජ්‍ය අංශය සඳහා ප්‍රමිති ගණක වර්ෂය ලෙස ලිත් වර්ෂ භාවිතය ක්‍රියාත්මක කිරීමට යන තවත් වැදගත් වෙනසකි. රජය, පොදු සමායතන සහ නීත්‍යානුකූල මණ්ඩල ක්‍රියාත්මක කෙරෙන මේ වෙනස මගින් මේ ආයතන වල විවිධ ගණක කාලච්ඡේද භාවිතා කිරීමෙහි ප්‍රතිවිපාකයක් වශයෙන් මතුවී ඇති අනවශ්‍ය ලිපිකරු වැඩ කටයුතු, වැරදි සහ අන්‍යොන්‍ය නොගැලපීම් හා ප්‍රතිපල සැසඳීමේදී වූ දුෂ්කරතාවයන් මහ හරවා ගත හැකැයි බලාපොරොත්තු වේ.

**(iii) දේශීය ආදායම් පණතේ සංශෝධන**

බදු පැහැර හැරීම වැලැක්වීමේ අරමුණ සමගම විනිමය පාලන දෙපාර්තමේන්තුව, ආදායම් බදු දෙපාර්තමේන්තුව, රේගු දෙපාර්තමේන්තුව සහ පොලිස්පති තුමා විසින් නම් කරන ලද ඇතැම් නිලධාරීන් අතරෙහි අන්‍යොන්‍ය ලෙස තොරතුරු හුවමාරු කිරීමට හැකි වන පරිදි දේශීය ආදායම් පණතෙහි රහස්‍ය ආරක්ෂක විධිවිධාන සංශෝධනය කළ යුතු විය. මේ ක්‍රමය නිසා එම දෙපාර්කමේන්තුවල පරීක්ෂණ කිරීම වඩාත් පහසුවනු ඇතැයිද, මේ දෙපාර්තමේන්තු අතර තොරතුරු රැස් කිරීම වැඩිවනු ඇතැයිද බලාපොරොත්තු වේ. රජයේ සේවකයන් හැර තොරතුරු සපයන වෙනත් අයට දෙනු ලබන තෑගි මුදල් ආදායම් බද්දෙන් නිදහස් කිරීමට හැකිවන ලෙසින් දේශීය ආදායම් බදු පනතද සංශෝධනය කළ යුතු විය.

**(iv) විදේශ විනිමය පිළිබඳ සමාව.**

විනිමය පාලකගේ අවසරය නොමැතිව විදේශවල අරමුදල් තබා ගෙන සිටින ලාංකික යන් උදෙසා විදේශ විනිමය සමාවක් දියයුතු විය.[1] ඔවුන්ගේ මුදල් විදේශයන්හි රැස් කර තිබූ ස්වරූපය සහ අදාළ හේතූන් අනුව එම මුදල් ලංකාවට ගෙන ඒමේදී යම් කාල සීමාවක් තුළ ආදායම් බදු සහ විනිමය පාලන පරීක්ෂණවලින් නිදහස් වනු ඇත. 1971 ජනවාරි 31 වෙනි දින දක්වා (මෙම තාවකාලික දිනය පසුව 1971 මාර්තු 31 වෙනිද දක්වා දීගු කර ඇත.) ක්‍රියාත්මක වන මෙම සමාව විදේශ විනිමය වංචාවලට හසුවී ඇති පුද්ගලයන්ටද විනිමය ගනුදෙනු පිළිබඳ පරීක්ෂණයන්ට භාජනය වී ඇති පුද්ගලයන්ටද නොලැබේ.

---

1. විදේශ විනිමය සමාව පිළිබඳ පණත, 1971 අංක 1.

විදේශ සේවාවෙහි නියුක්ත ලාංකිකයන්ට විදේශ මුදල්වලින් කිසියම් ප්‍රමාණයක් තම මව් බිමට නියමිත කාල පරතරවලදී එවීමට හැකිවන ලෙස විශේෂ අරමුදලක් ගොඩ නැගීමටද යෝජනා කෙරිණ. විවිධ අනුපාතිකය යටතේ සංචායනය වන එම මුදල් වලින් ස්ථාවර තැන්පතු සඳහා වෙළඳ බැංකු අනුපාතිකයට සමාන පොලියක් ඉපයේ. එම මුදල් ආදායම් බදු වලින් නිදහස් වන අතර ගෙවන්නා ආපසු පැමිණි පසු ලංකාවේ භාවිතය සඳහා ඒවා ඔහුට දෙනු ලැබේ.

(v) මැණික් සංස්ථාව

මැණික් කර්මාන්තය හා අදාළ සියළුම අංශයන් යටත් වන පරිදි මැණික් සංස්ථාවක ස්වරූපයෙන් නීත්‍යානුකූල ආයතනයක් කිරීමට යෝජනා කෙරිණ. මැණික් කර්මාන්තයෙන් ලැබෙන විදේශ විනිමය වාසි මෙතෙක් ලංකාවට අහිමිවී ඇති අතර ඒ අනුව සිදුවන පාඩුව වර්ෂයකට රුපියල් දශලක්ෂ 100 කට වඩා වැඩි බැව් ඇස්තමේන්තු කර ඇත. මැණික් ආකර කැනීම සඳහා පුද්ගලයන්ට වැඩියෙන් අවස්ථාවන් සැලසීමට අමතරව, මැණික් ගල් කැපීමේ හා ඔප දැමීමේ ක්‍රම පිළිබඳව නවීනතම පුහුණුවක් දීමටද බලාපොරොත්තු වේ.

## (ඹ) වෙනත් රාජ්‍ය මූල්‍ය විධිවිධාන

1970 ගන්නා ලද අනෙක් වැදගත් රාජ්‍ය මූල්‍ය විධිවිධානය වූ ව්‍යාපාර පිරිවැටුම් බද්ද පහත දැක්වේ.

(අ) සියයට 3 ක බද්දකට භාජනය වී තිබුණු කටු කම්බි 1970 නොවැම්බර් 30 දින සිට ව්‍යාපාර පිරිවැටුම් බද්දෙන් නිදහස් කෙරිණ.[1]

(ආ) ගිනි පෙට්ටි නිෂ්පාදනයට පැවති ව්‍යාපාර පිරිවැටුම් බද්ද 1970 ජූලි 1 වෙනි දින සිට සියයට 15 සිට සියයට 3 දක්වා අඩු කෙරිණ.[2]

(ඇ) 1970 ජූනි 30 වෙනි දින සිට පහත දැක්වෙන දෑ සියයට 25 ක ව්‍යාපාර පිරිවැටුම් බද්දකට යටත් වේ[3].

(i) මෝටර් රථ (මෝටර් බයිසිකල් සහ ස්කූටර් හැර) සවි කිරීම හෝ නිෂ්පාදනය කිරීම සඳහා අවශ්‍ය උපකරණ, මූලික කොටස්, අමතර කොටස් සහ වෙනත් ද්‍රව්‍යයන් විකිණීම පිළිබඳ ව්‍යාපාරය.

(ii) සවි කිරීම හෝ නිෂ්පාදනය හා සම්බන්ධයෙන් යොද ගනු ලබන සේවාවන්ද ඇතුළුව මෝටර් වාහන (මෝටර් බයිසිකල් සහ ස්කූටර් හැර) සවි කිරීම හෝ නිෂ්පාදනය කිරීම පිළිබඳ ව්‍යාපාරය.

(iii) ලංකාවේ සවි කරන ලද හෝ නිෂ්පාදනය කරන ලද මෝටර් වාහන (මෝටර් බයිසිකල් සහ ස්කූටර් හැර) විකිණීම පිළිබඳ ව්‍යාපාරය.

---

1. 1970 නොවැම්බර් 3 වෙනි දින අංක 14896/3 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය.
2. 1970 මැයි 2 වෙනි දින අංක 14907 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය.
3. 1970 ජූනි මස 30 දින අංක 14912/5 දරන ලංකාංණ්ඩුවේ ගැසට් පත්‍රය.